# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 20 දරන සංවර්ධන සභා ඡන්ද විමසීම් පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 මාර්තු මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 5.15 යි

තැපැල් ගාස්තුව : රු. 1.50 යි

# 1981 අංක 20 දරන සංවර්ධන සභා ඡන්ද විමසීම් පනත

**[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 19 වන දින]**

එල්. ඩී.—ඕ. 66/80.

**සංවර්ධන සභාවල සභිකයන් තෝරා පත් කර ගැනීමේ කාර්ය පටිපාටිය සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.**

**1.** මේ පනත 1981 අංක 20 දරන සංවර්ධන සභා ඡන්ද විමසීම් පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දින යක එය ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

### ප්‍රාරම්භය

**පනත අදාළ වීම.**

**2.** මේ පනතේ විධිවිධාන, 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ විධිවිධාන යටතේ සංස්ථාපනය කරන ලද හෝ සංස්ථාපනය කරනු ලබන සෑම සංවර්ධන සභාවකට ම අදාළ විය යුතු ය.

**මැතිවරණ ප්‍රදේශය.**

**3.** සෑම සංවර්ධන සභා ප්‍රදේශයක්ම, මේ පනතේ කාර්ය සඳහා මැතිවරණ ප්‍රදේශයක් විය යුතු ය.

**ඡන්ද ප්‍රදේශ හා ඡන්ද කොට්ඨාශ.**

**4.** (1) 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ තත් කාලයේ බලපවත්නා එක් එක් ඡන්ද කොට්ඨාසය, මේ පනතේ කාර්ය සඳහා ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ තත් කාලයේ බලපවත්නා එක් එක් ඡන්ද ප්‍රදේශය, මේ පනතේ කාර්ය සඳහා ඡන්ද ප්‍රදේශයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**ඡන්ද හිමි නාම ලේඛන.**

**5.** (1) 10 වන වගන්තිය යටතේ නාම යෝජනා පිළිබඳ දැන්වීම පළ කරනු ලැබීමෙන් පසු අලුත් ඡන්ද හිමි නාම ලේඛනයක් ක්‍රියාත්මකව පැවතිය ද, මේ පනත යටතේ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්ය සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිය යුතු ඡන්ද හිමි නාම ලේඛනය, ඒ වගන්තිය යටතේ ඒ දැන්වීම පළ කරනු ලැබූ දින යෙහි ක්‍රියාත්මකව පැවති ඡන්ද හිමි නාම ලේඛනය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "ක්‍රියාත්මකව පැවති ඡන්ද හිමි නාම ලේඛනය" යන්නෙන්, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත ප්‍රකාර ක්‍රියාත්මක වන ඡන්ද හිමි නාම ලේඛනයක් අදහස් වන අතර, සංවර්ධන සභාවක ප්‍රදේශයට අනුරූප නාම ලේඛනයක් හෝ නාම ලේඛන නැතහොත් නාම ලේඛනයක කොටසක් හෝ ඒවායේ යම් සංයෝජනයක් හෝ ඊට ඇතුළත් වේ.

2—ඒ 54793—29,200 (81/02)

ඡන්ද හිමි නාම ලේඛනය ඡන්දය දීමේ අයිතිවාසිකම පිළිබඳ තීරණාත්මක සාක්ෂි විය යුතු බව.

6. මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී යම් තැනැත්තකු ඡන්දය දීමට හිමිකම ලබන්නේ ද නොලබන්නේ ද යන වග නිශ්චය කිරීමේ කාර්යය සඳහා 5 වන වගන්තියෙහි සඳහන් ඡන්ද හිමි නාම ලේඛනයක්, තීරණාත්මක සාක්ෂිය විය යුතු අතර, ඒ නාම ලේඛනයෙහි තත් කාලයෙහි නම ඇතුළත්ව ඇති යම් තැනැත්තකු සතු ඡන්දය දීමේ අයිතිවාසිකමට, ඒ තැනැත්තාගේ නම, නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම සම්බන්ධයෙන් තත් කාලයෙහි බල පවත්නා යම් ලිඛිත නීතියක් යටතේ විනිශ්චයට භාජනව පවත්නා යම් අභියාචනයකින් හානියක් නොවිය යුතු ය; තව ද එවැනි අභියාචනයක් විනිශ්චයට භාජනව පවත්නා අතරතුර එවැනි යම් තැනැත්තකු විසින් දෙන ලද යම් ඡන්දයක් එවැනි අභියාචනයක් විනිශ්චයට භාජනව නොමැති විටක මෙන් වලංගු විය යුතු අතර, අභියාචනය සම්බන්ධයෙන් පසුව දෙනු ලබන තීරණයෙන් එයට හානියක් නොවිය යුතු ය:

එසේ වුවද දූෂණ ක්‍රියාවකට හෝ නීති විරෝධී ක්‍රියාවකට වරද කරු කරනු ලැබීම හේතුකොට ගෙන නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කිසියම් විධිවිධානයක හේතුවෙන් නැතහොත් 67 වන වගන්තිය යටතේ තමා නුසුදුස්සකු වීමේ හේතුවෙන් මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දීමට නුසුදුස්සකු වන යම් තැනැත්තකු ඒ ඡන්ද විමසීමේදී ඡන්දය දුනහොත්, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය:

එසේම තවදුරටත් 24 වන වගන්තිය යටතේ පෞද්ගලිකව ඡන්දය දීම හෝ 40 වන වගන්තිය යටතේ බහු ඡන්දය දීම සම්බන්ධයෙන් වූ විධිවිධාන කඩ කිරීමක් සඳහා වූ යම් දණ්ඩනයකට යම් තැනැත්තකු යටත් වීම කෙරෙහි මේ වගන්තියෙහි සඳහන් කිසිවක් බල නොපෑ යුතු ය.

තේරීම් භාර නිලධරයෝ.

7. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින්, කොමසාරිස්වරයා විසින්, එක් එක් සංවර්ධන සභා ප්‍රදේශයෙහි තේරීම් භාර නිලධරයා ලෙස, කලින් කල, යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත් කළ යුතු ය; තවද තේරීම් භාර නිලධරයාගේ කාර්ය ඉටු කිරීමෙහි ලා ඔහුට සහාය වීම පිණිස එක් තැනැත්තකු හෝ ඊට වැඩි දෙනකු නමින් හෝ නිලයෙන් කොමසාරිස්වරයා විසින් පත් කළ හැකි ය. යම් තේරීම් භාර නිලධරයකුට සහායවීම පිණිස එසේ පත් කරන ලද තැනැත්තකුට, ඔහු එසේ සහාය වීමට පත් කරන ලද නිලධරයා සතු සියලු බලතල තිබිය යුතු අතර, ඒ නිලධරයා විසින් ඉටු කරනු ලබන සියලු කාර්ය ඔහු විසින් ඉටු කරනු ලැබිය හැකි ය; තව ද මේ පනතෙහි තේරීම් භාර නිලධරයකු සම්බන්ධයෙන් වූ යම් සඳහන් කිරීමකට, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, සහකාර තේරීම් භාර නිලධරයකු සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය. මේ උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් කරන ලද පත් කිරීමක් කොමසාරිස්වරයා විසින් කවර හෝ විටක ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(2) අසනීපයක් නිසා හෝ වෙනත් හේතුවක් නිසා, මේ පනත යටතේ වූ ස්වකීය කාර්ය අතුරින් කිසිවක් ඉටු කිරීමෙන් යම් තේරීම් භාර නිලධරයකු වැළැක්වෙතොත් හෝ එසේ ඉටු කිරීමට ඔහුට නොහැකි වේ නම් සහ කොමසාරිස්වරයා විසින් වෙනත් තැනැත්තකු පත් කිරීමට කාලයක් නොමැති නම්, තේරීම් භාර නිලධරයා විසින් තමා වෙනුවෙන් වැඩ බැලීම පිණිස නියෝජ්‍යයකු නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි ය; එවැනි සෑම පත්කිරීමක් ම හැකිතාක් ඉක්මණින් කොමසාරිස්වරයා වෙත වාර්තා කළ යුතු අතර, ඒ පත්වීම, ඒ නියෝජ්‍යයා විසින් එව කටත් කර ඇති යම් දෙයක වලංගු භාවය කෙරෙහි හානියක් නොමැතිව කොමසාරිස්වරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

**ඡන්ද විමසීම්වල කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ.**

8. (1) මේ පනත ක්‍රියාත්මක වූ දිනයට ඉහතින් ම වූ දිනයෙහි 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ හෝ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ හෝ පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ඇති සෑම දේශපාලන පක්ෂයක් ම ඒ පනත හෝ ආඥාපනත යටතේ ඒ දේශපාලන පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලබන තාක් කල්, මේ පනත යටතේ වූ ඡන්ද විමසීම්වල කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම ප්‍රකාර, යම් දේශපාලන පක්ෂයක්, මේ පනත යටතේ ඡන්ද විමසීමේ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත හෝ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත හෝ වෙනත් නීතියක් යටතේ ඒ පක්ෂයට වෙන් කරනු ලැබූ අනුමත කරන ලද ලකුණ, (1) වන උපවගන්තිය යටතේ ඒ පක්ෂයට ඒ ලකුණට ඇති හිමිකම නතරවන තෙක්, ඒ පක්ෂයේ අනුමත කරනු ලැබූ ලකුණ වශයෙන් සලකනු ලැබිය යුතු ය.

**සභිකත්වය සඳහා නුසුදුසුකම්.**

9. යම්කිසි තැනැත්තකු—

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (අ), (ආ), (ඇ), (ඉ), (ඊ) සහ (උ) ඡේද වල දක්වා ඇති කවර වූ හෝ නුසුදුසු කමකට යටත්වේ නම්;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 38 දරන පළාත් පාලන ආයතන (ප්‍රජා අශක්නුතා නියම කිරීමේ) (අංක 1) පනතෙහි හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 39 දරන පළාත් පාලන ආයතන (ප්‍රජා අශක්නුතා නියම කිරීමේ) (අංක 2) පනතෙහි හෝ දක්වා ඇති නුසුදුසුකම්වලට යටත්වන්නා වූ හෝ යම් මහ නගර සභාවකට හෝ නගර සභාවකට හෝ සභිකයන් තෝරා පත්කර ගැනීමක දී ඡන්දය දීමෙන් තත් කාලයෙහි වෙනත් යම් නීතියක් යටතේ දක්වා ඇති යම් නුසුදුසු කමකට යටත් වේ නම්;

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නම්;

(ඈ) වෙනත් යම් සංවර්ධන සභාවක සභිකයෙක් නම් නැත හොත් එක් සංවර්ධන සභාවකට වඩා වැඩි ගණනකට තෝරා පත් කර ගැනීම සඳහා අපේක්ෂකයකු වශයෙන් නාමයෝජනා කරනු ලැබ ඇත් නම්;

(ඉ) යම් මහ නගර සභාවක හෝ නගර සභාවක සභිකයකු නම්;

(ඊ) නියත වශයෙන් ම ඒ සභාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ, ඒ සභාවෙන් වේතනයක් ලබන ඒ සභාවේ නිලධරයෙක් හෝ සේවකයෙක් නම්, නැතහොත් ඒ සභාවට සභිකයන් තෝරා පත් කර ගන්නා ලද දිනයට පෙර, එක් අවුරුද්දක කාලයක් ඇතුළත, ඒ සභාව විසින් සේවා නියුක්තිය අවසන් කරනු ලැබූ තැනැත්තෙක් නම්;

(උ) කෙළින් ම හෝ අන්‍යාකාරයකින්, තමා විසින් ම හෝ තමා වෙනුවෙන් භාරයක් දරන කවර හෝ වෙනත් යම් තැනැත්තකු මඟින් හෝ තමාගේ ප්‍රයෝජනය හෝ ප්‍රතිලාභය හෝ සඳහා නැතහොත් තමා වෙනුවෙන්, ඒ සභාව සඳහා හෝ එය වෙනුවෙන්, යම් තැනැත්තකු සමග ඇති කර ගන්නා ලද හෝ ඇතුළත් වූ නැතහොත් පිළිගනු ලැබූ යම් කොන්ත්‍රාත්තුවක් හෝ ගිවිසුමක් හෝ අධිකාරයක් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්:

එසේ වුව ද පූර්ව සේවය සඳහා ඒ සභාව විසින් ප්‍රදානය කරන ලද යම් විශ්‍රාම වැටුපකට හෝ පාරිතෝෂිකයකට නැතහොත් ඒ තැනැත්තා සාමාජිකයකු හෝ කොටස්කරුවකු විය හැකි සංස්ථාගත කරන ලද යම් වෙළෙඳ සමාගමක් විසින් එහි සංස්ථාගත තත්ත්වයෙන් ඇතුළත් වූ හෝ පිළිගනු ලැබූ යම් කොන්ත්‍රාත්තුවකට, ගිවිසුමකට හෝ අධිකාරයකට මෙහි ඇතුළත් කිසිවක් ව්‍යාප්ත නොවිය යුතු ය;

(ඌ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතින් පිහිටුවන ලද පළාත් පාලන සේවයේ සාමාජිකයකු නම්:

එසේ වුව ද වර්ෂයකට රු. 6,720 කට අඩු ආරම්භක වැටුප් පරිමාණයක් ඇති තනතුරක් දරන යම් තැනැත්තකු ප්‍රස්තුත ඡන්ද විමසීමේ කාලයේ දී ඒ තැනැත්තා සේවයෙහි නියුක්තව නොමැති යම් සංවර්ධන සභාවකට

හෝ ඒ ඡන්ද විමසීමට ඉහතින් ම වූ එක් අවුරුද්දක කාලයක් තුළ ඔහු සේවයෙහි නියුක්තව නොසිටි යම් සංවර්ධන සභාවකට හෝ තෝරා පත් කරගනු ලැබීමට ඔහු අපේක්ෂා කරන්නේ නම් මෙහි ඇතුළත් කිසිවක් ඔහු සම්බන්ධයෙන් ව්‍යාප්ත කරනු නොලැබිය යුතු ය; නැතහොත්

(එ) පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් එකකට වැඩි ගණනක් විසින් යම් සංවර්ධන සභාවක් සම්බන්ධයෙන් වූ ඡන්ද විමසීමක් සඳහා අපේක්ෂකයකු වශයෙන් නම් කරනු ලැබ ඇත්නම්,

ඒ තැනැත්තා සංවර්ධන සභාවක සභිකයකු වශයෙන් තෝරා පත් කරගනු ලැබීමට නැතහොත් ඒ සභාවේ සභිකයකු වශයෙන් අසුන් ගැනීමට හෝ එහි දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

## II වන කොටස

### නාම යෝජනා

නාම යෝජනා කාල සීමාව.

**10.** (1) සංවර්ධන සභාවක සභිකයන් තෝරා ගැනීම සඳහා වූ ඡන්ද විමසීමක් යම් වර්ෂයක දී පැවැත්වීමට නියමිත කවර හෝ විටක, ඒ සංවර්ධන සභා ප්‍රදේශයේ තේරීම් භාර නිලධරයා විසින්, ඒ ඡන්ද විමසීම පැවැත්වීමට තමාට ඇති අදහස පිළිබඳව දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය. තේරීම් භාර නිලධරයා විසින් තම කාර්යාලයේ දී සාමාන්‍ය කාර්යාල වේලාවන් ඇතුළත නාම යෝජනා පත්‍ර භාර ගනු ලබන (මෙහි මින් මතු "නාම යෝජනා කාලසීමාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කාලසීමාව සහ 13 (1) වන වගන්තිය යටතේ නාම යෝජනා පත්‍රයෙහි දැක්වීමට නියමිත අපේක්ෂකයන් සංඛ්‍යාව දැන්වීමෙහි සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) නාම යෝජනා කාලසීමාව, (1) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම පළ කරනු ලැබූ දිනයෙන් පසුව එළඹෙන දහ හතරවන දිනයෙන් ආරම්භව ඒ දැන්වීම පළ කරනු ලැබූ දිනයෙන් පසුව එළඹෙන විසිඑක්වන දිනයේ මධ්‍යාහ්න දොළහට අවසන් විය යුතු ය.

පිළිගත් දේශපාලන පක්ෂයක ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් වලින් කවර කණ්ඩායම ඒ පක්ෂය විය යුතු දැයි විධාන කිරීමට කොමසාරිස් වරයාට ඇති බලය.

**11.** (1) යම් සංවර්ධන සභා ප්‍රදේශයක් තුළ පැවැත්වීමට නියමිත යම් ඡන්ද විමසීමක දී, පිළිගත් දේශපාලන පක්ෂයක ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් වශයෙන් හිමිකම් පාන්නා වූ ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් ඇති වී තිබීමේ හේතුව නිසා දුෂ්කරතා පැන නැගෙනු ඇතැයි විශ්වාස කිරීමට සාධාරණ හේතු කොමසාරිස්වරයාට ඇති අවස්ථාවක කොමසාරිස්වරයා විසින්, ඒ දුෂ්කරතා ඉවත් කිරීම පිණිස, ඒ ඡන්ද විමසීමේ දී ඒ කණ්ඩායම් අතුරින් යම් කණ්ඩායමක් ඒ පිළිගත් දේශපාලන පක්ෂය වන බවට හෝ ඒ කණ්ඩායම් අතුරින් කිසිම කණ්ඩායමක් ඒ පිළිගත් දේශපාලන පක්ෂය නොවන බවට තම පරම අභිමතය පරිදි ඒ සංවර්ධන සභා ප්‍රදේශයේ තේරීම් භාර නිලධරයා වෙත විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ ඡන්ද විමසීමේ දී ඒ විධානය අනුව ක්‍රියා කිරීම ඒ තේරීම් භාර නිලධරයාගේ හෝ වෙනත් යම් නිලධරයකුගේ යුතුකම විය යුතු ය.

(2) (අ) කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ විධානයක් නිකුත් කිරීම නිසා කොමසාරිස්වරයාට විරුද්ධව ; නැතහොත්

(ආ) ඒ විධානය අනුව යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීම හෝ නොකර හැරීම නිසා තේරීම් භාර නිලධරයකුට හෝ වෙනත් යම් නිලධරයකුට විරුද්ධව

කිසිම සිවිල් නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් පැවරිය නොහැකි විය යුතු ය.

(3) තේරීම් භාර නිලධරයකු වෙත (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ විධානයක් අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර, එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(4) මේ පනතේ වෙනත් යම් විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන සහ ඒ යටතේ නිකුත් කරනු ලැබූ යම් විධානයක් බලසහිත විය යුතු ය.

ඡන්ද විමසීමෙ තරග කළ හැක්කේ කවරකු විසින් ද යන වග.

**12.** පනතේ 9 වන වගන්තිය අනුව සංවර්ධන සභාවක සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට නුසුදුස්සකු නොවන යම් තැනැත්තකු, ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබිය හැකි ය.

නාම යෝජනා පත්‍ර.

**13.** (1) යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ (මෙහි මින් මතු " ස්වාධීන කණ්ඩායමක් " යනුවෙන් සඳහන් කරනු ලබන) ස්වාධීන අපේක්ෂකයන් වශයෙන් තරග කරන තැනැත්තන් කණ්ඩායමක් හෝ විසින් සංවර්ධන සභාවක සභිකයන් තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා, ඒ සංවර්ධන සභාව සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු සභිකයන් සංඛ්‍යාවට එකී සංඛ්‍යාවෙන් තුනෙන් පංගුවක් එකතු කරන ලද විට ලැබෙන සංඛ්‍යාවට සමාන අපේක්ෂක සංඛ්‍යාවක්, ඔවුන්ගේ නම්වල ප්‍රමුඛත්වය අනුව දැක්වෙන, එක් නාම යෝජනා පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය. යම් සංවර්ධන සභාවක් සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු සභිකයන් සංඛ්‍යාවෙන් තුනෙන් පංගුව සම්පූර්ණ ගණනක් සහ භාගයක් හෝ භාගයක් වන අවස්ථාවක, එකී සම්පූර්ණ ගණනට සහ භාගයට හෝ භාගයට වැඩි ඊළඟ සම්පූර්ණ ගණන මේ උපවගන්තියේ කාර්ය සඳහා තුනෙන් පංගුව ලෙස සැලකිය යුතු ය. ඒ නාම යෝජනා පත්‍රය මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති ' අ ' ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(2) පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාම යෝජනා කරනු ලබන එක් එක් අපේක්ෂකයාගේ ලිඛිත කැමැත්ත ඒ එක් එක් අපේක්ෂකයා විසින් නාම යෝජනා පත්‍රයෙහි පිටසන් කළ යුතු ය.

(3) එක් එක් නාම යෝජනා පත්‍රය, පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම් විසින්ද, ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට (මෙහි මින් මතු 'කණ්ඩායම් නායකයා' යනුවෙන් සඳහන් කරනු ලබන) නාම යෝජනා පත්‍රයෙහි මුලින් ම නම සඳහන්ව ඇති අපේක්ෂකයා විසින් ද අත්සන් කරනු ලැබිය යුතුය; තවද එක් එක් නාම යෝජනා පත්‍රය සමාදාන විනිශ්චයකාරවරයකු විසින් හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් හෝ සහතික කොට අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) ඒ නාම යෝජනා පත්‍රය, පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් වන විට, ඒ පක්ෂයේ ලේකම් විසින් හෝ (මෙහි මින් මතු 'බලයලත් නියෝජිතයා' යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ නාම යෝජනා පත්‍රයේ මුලින් ම නම සඳහන් අපේක්ෂකයා විසින් ද ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට කණ්ඩායම් නායකයා විසින් ද, නාම යෝජනා කාලසීමාව ඇතුළත සාමාන්‍ය කාර්යාලවේලා අතරතුර දී තේරීම් භාර නිලධරයාගේ කාර්යාලයේ දී තේරීම් භාර නිලධරයා වෙත, භාර දිය යුතු ය.

(5) පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්ට හෝ බලයලත් නියෝජිතයාට නැතහොත් කණ්ඩායම් නායකයාට කවර හෝ හේතුවක් නිසා, නාම යෝජනා පත්‍රයක් භාර දීමට නොහැකි වන අවස්ථාවක, ඒ නාම යෝජනා පත්‍රයෙහි දෙවනුව නම සඳහන් අපේක්ෂකයා විසින් නාම යෝජනා පත්‍රය (4) වන උපවගන්තියෙන් නියමිත පරිදි තේරීම් භාර නිලධරයා වෙත භාර දිය යුතු ය.

(6) තේරීම් භාර නිලධරයා විසින්, හැකි පමණ ඉක්මණින්, තමාට ලැබුණු එක් එක් නාම යෝජනා පත්‍රයේ පිටපත බැගින් පිළියෙල කොට ඒ එක් එක් පිටපත තමාගේ දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කළ යුතු ය.

(7) නාම යෝජනා පිළිබඳ දැන්වීම පළ කරනු ලැබීමෙන් පසුව සහ නාම යෝජනා කාලසීමාව ඉකුත්වීමට පෙර යම් දිනයක ඉල්ලීමක් කරනු ලැබූ විට, තේරීම් භාර නිලධරයා විසින් යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ යම් ස්වාධීන කණ්ඩායමකට හෝ නාම යෝජනා පත්‍රයක් නොමිලයේ සැපයිය යුතු ය; එහෙත් තේරීම් භාර නිලධරයා විසින් සපයනු නොලැබූ නාම යෝජනා පත්‍රයක යම් ආකෘතියක්, මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති 'අ' ආකෘතියට සාරානුකූලව වෙනස් නොවන තාක්, එවැනි ආකෘතියක් භාවිත කිරීම මේ පනතෙහි සඳහන් කිසිවකින් වළක්වනු ලැබෙතැයි සලකනු නොලැබිය යුතු ය.

(8) (අ) යම් පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් භාර දෙන ලද නාම යෝජනා පත්‍රයක යම් අත්හැරීමක් හෝ ලිපි දෝෂයක් ඇතැයි ඒ පක්ෂයේ ලේකම්ට හෝ බලයලත් නියෝජිතයාට නැතහොත් කණ්ඩායම් නායකයාට පෙනී යන අවස්ථාවක, ඔහු විසින්, නාම යෝජනා පත්‍රයෙහි ඒ අත්හැරීම හෝ දෝෂය නිවැරදි කර ගැනීම පිණිස නාම යෝජනා කාලසීමාව ඉකුත්වීමට පෙර, තේරීම් භාර නිලධරයා වෙත ඉල්ලීමක් කළ හැකි ය.

(ආ) ඒ අත් හැරීම හෝ දෝෂය අනවධානය නිසා සිදුවී ඇතැයි තේරීම් භාර නිලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ අත් හැරීම හෝ දෝෂය තමා ඉදිරිපිට දී නිවැරදි කිරීමට තේරීම් භාර නිලධරයා විසින් ඒ ලේකම්ට හෝ බලය ලත් නියෝජිතයාට නැතහොත් කණ්ඩායම් නායකයාට ඉඩ දෙනු ලැබිය හැකි ය.

(ඇ) අපේක්ෂකයකුගේ නම අත් හැරීම හෝ අපේක්ෂකයකු විසින් ස්වකීය කැමැත්ත නාම යෝජනා පත්‍රයෙහි පිටසන් කර නොතිබීම හෝ නාම යෝජනා පත්‍රයක් පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම් විසින් හෝ කණ්ඩායම් නායකයකු විසින් අත්සන් කර නොතිබීම නැතහොත් ඒ අත්සන සමාදාන විනිශ්චයකාරවරයකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කොට අත්සන් කර නොතිබීම මේ උපවගන්තියේ කාර්ය සඳහා අනවධානයෙන් සිදු වූ අත්හැරීමක් හෝ ලිපි දෝෂයක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

තැන්පත් මුදල්.

14. (1) 10 වන වගන්තිය යටතේ දැන්වීම පළ කරනු ලැබූ දිනය සහ ස්වාධීන කණ්ඩායමක නාමයෝජනා පත්‍රය භාරදීම අතර කාලය තුළ කණ්ඩායම් නායකයකු විසින් හෝ ඒ කණ්ඩායම් නායකයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින්, ඒ කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් රුපියල් දෙදහස බැගින් ගණන් බලන ලද මුදලක්, වලංගු මුදලින් තේරීම් භාර නිලධරයා වෙත තැන්පත් කළ යුතු ය.

(2) කණ්ඩායම් නායකයකු විසින් හෝ ඒ කණ්ඩායම් නායකයා විසින්, බලය දෙනු ලැබූ තැනැත්තකු විසින්, (1) වන උපවගන්තිය යටතේ තබන ලද කිසිම තැන්පත් මුදලක්, ඒ මුදල ඒ උපවගන්තියෙන් නියමිත කාලය ඇතුළත තබන ලද්දේ නම් මිස, තේරීම් භාර නිලධරයා විසින් භාර ගනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ තැන්පත් මුදලක් තේරීම් භාර නිලධරයා විසින් භාර ගනු ලැබූ අවස්ථාවක, ඒ තැන්පත් මුදල තමා විසින් භාර ගන්නා ලද බවට ඒ නිලධරයා විසින් අත්සන් කරන ලද ලියවිල්ලකින් වූ කුවිතාන්සියක්, ඒ තැන්පත් මුදල තැබූ තැනැත්තාට ඔහු විසින් නොපමාව නිකුත් කළ යුතු අතර, ඒ කුවිතාන්සියෙහි—

(අ) තැන්පත් මුදල තබන ලද්දේ යම් කණ්ඩායම් නායකයකු විසින් නම් ඒ කණ්ඩායම් නායකයාගේ නම නැතහොත් තැන්පත් මුදල තබනු ලැබුවේ යම් බලයලත් තැනැත්තකු විසින් යම් තැනැත්තකු වෙනුවෙන් නම් ඒ බලයලත් තැනැත්තාගේ හා ඒ අනික් තැනැත්තාගේ නම;

(ආ) අපේක්ෂකයන් සංඛ්‍යාව ;

(ඇ) තැන්පත් මුදලේ ප්‍රමාණය ; සහ

(ඈ) තැන්පත් මුදල තැබූ වේලාව සහ දිනය

සඳහන් විය යුතු ය.

තැන්පත් මුදල් බැහැර කිරීම.

**15.** (1) 14 වන වගන්තිය යටතේ තේරීම් භාර නිලධරයකු වෙත තබන ලද සෑම තැන්පත් මුදලක් ම ඒ නිලධරයා විසින් තැන්පත් ගිණුමකට නොපමාව බැර කළ යුතු අතර, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන අනුව ඒ මුදල් බැහැර කරනු ලැබිය යුතු ය.

(2) ස්වාධීන කණ්ඩායමක නාම යෝජනා පත්‍රය 17 වන වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, ඒ තැන්පත් මුදල, එය තැබූ තැනැත්තා වෙත ආපසු දෙනු ලැබිය යුතු ය.

(3) යම් සංවර්ධන සභා ප්‍රදේශයක යම් ස්වාධීන කණ්ඩායමක් විසින් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යාව ඒ සංවර්ධන සභා ප්‍රදේශයේ ඡන්ද විමසීමේ දී දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාවෙන් අටෙන් එකකට අඩු වන අවස්ථාවක, ඒ කණ්ඩායමේ අපේක්ෂකයන් වෙනුවෙන් තබන ලද තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබූ ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර, තේරීම් භාර නිලධරයා විසින් ඒ මුදල තැන්පත් ගිණුමෙන් ඒකාබද්ධ අරමුදලට මාරු කළ යුතු ය. අනෙක් සෑම අවස්ථාවක දී ම, ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, ඒ තැන්පත් මුදල තැබූ තැනැත්තා වෙත, එය ආපසු දෙනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා, යම් සංවර්ධන සභා ප්‍රදේශයක ඡන්ද විමසීමක දී දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව ඇත්ත වශයෙන් ගණන් කරන ලද ඡන්ද සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු අතර, බලරහිත යයි ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද කිසිවක් එයට ඇතුළත් නොවිය යුතු ය.

ඇතැම් අවස්ථානුගත කරුණු යටතේ නාම යෝජනා කරනු ලැබීමට නැමැත්ත දීම වරදක් වන බව.

**16.** (අ) දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවකට තමා වරදකරු කරනු ලැබීම හේතුකොට ගෙන හෝ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව යටතේ හෝ 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ හෝ මැතිවරණ විනිශ්චයකාරවරයකුගේ වාර්තාව හේතු කොට ගෙන නැතහොත් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමට අදාළ නීතිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තාව හේතු කොටගෙන ; හෝ

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ප්‍රකාර තමා විෂයයෙහි ප්‍රජා අශක්තුතාවක් නියම කිරීම හේතු කොටගෙන ; හෝ

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 38 දරන පළාත් පාලන ආයතන (ප්‍රජා අශක්නුතා නියම කිරීමේ) (අංක 1) පනතෙහි හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 39 දරන පළාත් පාලන ආයතන (ප්‍රජා අශක්නුතා නියම කිරීමේ) (අංක 2) පනතෙහි දක්වා ඇති නුසුදුසුකම්වලින් කිසිවකට යටත් වීම හේතුකොට ගෙන

සංවර්ධන සභාවක සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට සුදුස්සකු නොවන යම් තැනැත්තකු යම් සංවර්ධන සභාවක සභිකයන් තෝරා පත් කර ගැනීමක දී අපේක්ෂකයකු වශයෙන්

නාම යෝජනා කරනු ලැබීමට කැමැත්ත දත්වා සිටින අවස්ථාවක, ඔහු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කිරීම.

17. (1) නාම යෝජනා කාලසීමාව ඉකුත් වූ වහා ම තේරීම් භාර නිලධරයා විසින්, තමාට ලැබුණු නාම යෝජනා පත්‍ර පරීක්ෂා කර බැලිය යුතු අතර,—

(අ) 13 වන වගන්තියේ (4) වන උපවගන්තියේ හෝ (5) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව භාර දී නොමැති යම් නාම යෝජනා පත්‍රයක් ; හෝ

(ආ) 13 වන වගන්තිය අනුව නාම යෝජනා කරනු ලැබීමට නියමිත අපේක්ෂකයන් මුළු සංඛ්‍යාව ඇතුළත් නොවන යම් නාම යෝජනා පත්‍රයක් ; හෝ

(ඇ) 14 වන වගන්තිය යටතේ නියමිත තැන්පත් මුදල තබනු නොලැබුවේ යම් නාම යෝජනා පත්‍රයක් සම්බන්ධයෙන් ද ඒ නාම යෝජනා පත්‍රය ; හෝ

(ඈ) නාම යෝජනා කරනු ලැබූ එක් අපේක්ෂකයකුගේ හෝ ඊට වැඩි දෙනකුගේ කැමැත්ත නාම යෝජනා පත්‍රයෙහි පිටසන් කර නොමැති අවස්ථාවක ඒ නාම යෝජනා පත්‍රය ; හෝ

(ඉ) පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් වන විට ලේකම්ගේ අත්සන හෝ ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට කණ්ඩායම් නායකයාගේ අත්සන නාම යෝජනා පත්‍රයෙහි තබා නොමැති අවස්ථාවක, හෝ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් නියමිත පරිදි ඒ අත්සන සහතික කොට අත්සන් තබා නොමැති අවස්ථාවක, ඒ නාම යෝජනා පත්‍රය

ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(2) තේරීම් භාර නිලධරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ යම් නාම යෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක, තේරීම් භාර නිලධරයා විසින්, ඒ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව, අවස්ථෝචිත පරිදි, ඒ නාම යෝජනා පත්‍රය ඉදිරිපත් කළ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ කණ්ඩායම් නායකයා වෙත දැනුම් දිය යුතු ය. ඒ නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් තේරීම් භාර නිලධරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

තරඟයක් නොමැති ඡන්ද විමසීම.

18. (1) යම් සංවර්ධන සභා ප්‍රදේශයක් සම්බන්ධයෙන් එක් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන එක් කණ්ඩායමක අපේක්ෂකයන් පමණක් ඡන්ද විමසීම සඳහා යථාපරිදි නාම යෝජනා කරනු ලැබ ඇති අවස්ථාවක,—

(අ) ඒ සංවර්ධන සභාව සඳහා තෝරා පත්කර ගත යුතු සභික යන් සංඛ්‍යාවට සමාන යම් අපේක්ෂකයන් සංඛ්‍යාවක්, ඒ අපේක්ෂකයන්ගේ නම් ඒ නාම යෝජනා පත්‍රයෙහි දක්වෙන අනුපිළිවෙළ අනුව තෝරා පත් කර ගන්නා ලදැයි තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය ; තවද

(ආ) මේ උපවගන්තියෙහි සඳහන් නාම යෝජනා පත්‍රයෙහි පළමුවෙන් නම දක්වෙන අපේක්ෂකයා සංවර්ධන සභාවේ සභාපතිවරයා ලෙස තෝරා පත් කර ගන්නා ලදැයි තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති ‘ආ’ ආකෘතියට සරුනුකූල විය යුතු වාර්තාවක් තේරීම් භාර නිලධරයා විසින් කොමසාරිස්වරයා වෙත නොපමාව සැපයිය යුතු ය. එසේ තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබූ සභික යන්ගේ නම් සහ සභාපතිවරයාගේ නම කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

නාම යෝජනා පත්‍ර කිසිවක් ලැබී නොමැති විට කාර්ය පටිපාටිය.

19. නාම යෝජනා කාලසීමාව ඉකුත් වූ විට, යම් සංවර්ධන සභා වක් සම්බන්ධයෙන්—

(අ) යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් වෙනුවෙන් කිසිම නාම යෝජනා පත්‍රයක් යථා පරිදි ලැබී නොමැති බව ; හෝ

(ආ) තේරීම් භාර නිලධරයාට ලැබුණු සියලු ම නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති බව

තේරීම් භාර නිලධරයාට පෙනී ගිය අවස්ථාවක, නාම යෝජනා කාල සීමාව ඉකුත් වීමෙන් පසු දින හතකට වඩා ප්‍රමාද නොවී තේරීම් භාර නිලධරයා විසින් දෙවන නාම යෝජනා කාල සීමාවක් නියම කරමින් දැන්වීමක් පළ කළ යුතු ය. ඒ කාල සීමාව, ඒ දැන්වීම පළ කරනු ලැබීමෙන් පසුව එළඹෙන සත්වන දිනයෙන් ආරම්භව, ඒ දැන්වීම පළ කරනු ලැබීමේ දිනයෙන් පසුව එළඹෙන දසවන දිනයේ මධ්‍යාහ්න දෙළහට අවසන් විය යුතු ය. 10 වන වගන්තියෙහි සඳහන් නාම යෝජනා කාල සීමාව පවත්නා කාලය, දෙවන නාම යෝජනා කාල සීමාවට අදාළ නොවිය යුතු ය යන කරුණට යටත් ව, මේ පනතේ විධිවිධාන දෙවන නාම යෝජනා කාලසීමාව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

තරඟයක් ඇති ඡන්ද විමසීම.

20. (1) නාම යෝජනා කාල සීමාව ඉකුත් වූ විට සහ යම් නාම යෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් පසුව, එක් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට වැඩි ගණනක අපේක්ෂකයන් යථා පරිදි නාම යෝජනා කරනු ලැබ ඇත්නම්, තේරීම් භාර නිලධරයා විසින් නොපමාවම—

(අ) ඒ ඡන්ද විමසීමේ කාර්යය සඳහා එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට ඒ පක්ෂයේ අනුමත කරන ලද ලකුණ වෙන් කළ යුතු ය ; තව ද

(ආ) එක් එක් ස්වාධීන කණ්ඩායම වෙනුවෙන් අනුමත කරන ලද ලකුණක් වෙන් කළ යුතු අතර, එක් ස්වාධීන කණ්ඩායමකට වැඩි ගණනක් ඇති අවස්ථාවක—

(i) පළමුවෙන් කණ්ඩායම් නායකයන් අතර එකඟත්වයෙන් ; හෝ

(ii) එවැනි එකඟත්වයක් නොමැති විටක, තේරීම් භාර නිලධරයා විසින් ස්වකීය පරම අභිමතය පරිදි නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් කුසපත් දැමීමෙන් හෝ ඇදීමෙන්

තීරණය කරනු ලබන යම් අනුමත කරන ලද ලකුණක් සහ හැඳින්වීමේ අංකයක් වෙන් කළ යුතු ය. ඒ ලකුණ ඡන්ද පත්‍රිකාවේ—

(i) ඒ පක්ෂයේ නමට ඉදිරිපසින් ; සහ

(ii) ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට, "ස්වාධීන කණ්ඩායම" යන වචනවලට සහ ඒ කණ්ඩායමට වෙන් කර දෙන ලද හැඳින්වීමේ අංකයක් ඇත්නම් ඒ අංකයට ඉදිරිපසින්

මුද්‍රණය කරනු ලැබිය යුතු ය.

(2) පිළිගත් දේශපාලන පක්ෂයක අනුමත කරන ලද ලකුණ, ඒ පක්ෂය විසින් යම් ඡන්ද විමසීමක දී තරඟ කරනු ලැබුව ද නොලැබුව ද (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ යම් ස්වාධීන කණ්ඩායමකට වෙන් කරනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලකුණු වෙන් කරනු ලැබීමෙන් පසු, තේරීම් භාර නිලධරයා විසින් නොපමාව මෙහි මින් මතු දක්වා ඇති විධිවිධාන අනුව ඡන්ද විමසීමක් පැවැත්විය හැකි වනු පිණිස ඒ ඡන්ද විමසීම අඩාලව කල් තැබිය යුතු ය.

නාම යෝජනා පත්‍ර භාර දෙන අවස්ථාවේ දී පැමිණ සිටීමට හිමිකම් ඇති තැනැත්තෝ.

21. තේරීම් භාර නිලධරයා, පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්, බලයලත් නියෝජිතයා, කණ්ඩායම් නායකයා, නාම යෝජනා පත්‍රයේ දෙවනුව නම සඳහන් අපේක්ෂකයා සහ එම ලේකම්වරයා හෝ බලයලත් නියෝජිතයා විසින් හෝ කණ්ඩායම් නායකයා විසින් තෝරා ගත් තවත් එක් තැනැත්තකු වේ නම් ඒ තැනැත්තා නොවන වෙනත් කිසිම තැනැත්තකුට, තේරීම් භාර නිලධරයාගේ කැමැත්ත ඇතිව සහ තේරීම් භාර නිලධරයාට සහායවීමේ කාර්යය සඳහා හැර, 13 වන, 17 වන, 18 වන සහ 20 වන වගන්ති යටතේ කෙරෙන කටයුතුවල දී පැමිණ සිටීමට හිමිකම නොතිබිය යුතු ය.

## III වන කොටස

### ඡන්ද විමසීම

22. (1) 20 වන වගන්තිය යටතේ වූ කටයුතු අවසන් කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, තේරීම් භාර නිලධරයා විසින්— ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම

(අ) ඡන්ද විමසීම සඳහා තරඟයක් ඇත්තේ සංවර්ධන සභාවක් සඳහා ද ඒ සංවර්ධන සභාව :

(ආ) සංවර්ධන සභාවේ සභිකයන් වශයෙන් තෝරා පත් කර ගනු ලැබීම සඳහා වූ, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ සහ ස්වාධීන කණ්ඩායමේ නාම යෝජනා පත්‍රයෙහි දක්වා ඇති ප්‍රමුඛත්ව අනුපිළිවෙළ අනුව, අපේක්ෂකයන්ගේ නම්, ඒ පක්ෂයට හෝ කණ්ඩායමට වෙන් කරන ලද අනුමත ලකුණ සහ ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට, " ස්වාධීන කණ්ඩායම " යන වචන සහ හැඳින්වීමේ අංකයක් වෙතොත්, ඒ අංකය ;

(ඇ) පුර පසළොස්වක පොහොය දිනයක් හෝ 1971 අංක 29 දරන නිවාඩු පනතේ පළමුවන උපලේඛනයෙහි සඳහන් යම් රජයේ නිවාඩු දිනයක් හෝ නොවන යම් දිනයක් වන්නා වූ ද දැන්වීම් පළ කරනු ලැබූ දිනයෙහි සිට සති තුනකට අඩු නො වූ හෝ සති අටකට වැඩි නොවූ යම් දින යක් වන්නා වූ ද ඡන්ද විමසීම පවත්වනු ලබන දිනය;

(ඈ) සංවර්ධන සභා ප්‍රදේශයේ එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා වූ ඡන්ද පොළෙහි නැතහොත් ඡන්ද පොළවල පිහිටීම සහ ඡන්ද දායිකාවන් සඳහා වෙන් කරන ලද යම් විශේෂ ඡන්ද පොළක් වෙතොත්, ඒ ඡන්ද පොළ

සඳහන් කරමින් ගැසට් පත්‍රයෙහි දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් දැන්වීම පළ කරනු ලැබීමෙන් පසුව, ඒ දැන්වීමෙහි සඳහන් දිනය රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබුවහොත්, ඡන්ද විමසීමේ කාර්ය සඳහා ඒ දිනයෙහි කරන ලද කිසිවක වලංගුභාවය කෙරෙහි ඒ ප්‍රකාශය කවර හෝ අන්දමකින් බලනොපෑ යුතු ය.

(3) යම් අවස්ථාවක විශේෂ අවස්ථානුගත කරුණු හේතුකොට ගෙන යම් ඡන්ද කොට්ඨාසයක ඡන්දදායිකාවන් සඳහා වෙනම ඡන්ද පොළක් සැපයීම අවශ්‍ය හෝ අවස්ථාවෝචිත බව තේරීම් භාර නිලධරයා සලකන්නේ නම් මිස, එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා එක් ඡන්ද පොළක් තිබිය යුතු අතර, ඊට වැඩි ගණනක් නොතිබිය යුතු ය.

(4) යම් ඡන්ද කොට්ඨාසයක පවතින විශේෂ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන ඒ ඡන්ද කොට්ඨාසයෙන් පිටත ඡන්ද පොළක් ඇති කිරීමට තේරීම් භාර නිලධරයා විසින් තීරණය කරනු ලැබිය හැකි අවස්ථාවක හැර, එක් එක් ඡන්ද කොට්ඨාසය සඳහා වූ

ඡන්ද පොළ හෝ ඡන්ද පොළවල් ඒ ඡන්ද කොට්ඨාසය ඇතුළත පිහිටුවනු ලැබිය යුතු ය. ඡන්ද පොළෙහි පිහිටීම ඡන්ද කොට්ඨාසයේ ඡන්ද හිමියන්ට ඇතිවන අපහසුව ඉතාම අඩුවන ආකාරයට විය යුතු ය.

(5) යම් හදිසි තත්ත්වයක් හේතුකොටගෙන, යම් ඡන්ද පොළක පිහිටීම, (1) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමක සඳහන් ඡන්ද පොළෙහි පිහිටීමෙන් වෙනස් කිරීම අවශ්‍ය වූ අවස්ථාවක, තේරීම් භාර නිලධරයා විසින්, තම පරම අභිමතය අනුව නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් ඒ ඡන්ද පොළෙහි පිහිටීම ඔහු විසින් වෙනස් කරනු ලැබීමට සැලැස්විය හැකි ය.

(6) යම් හදිසි තත්ත්වයක් හෝ බලාපොරොත්තු රහිත දෙයක් සිදුවීම හේතුකොටගෙන යම් සංවර්ධන සභා ප්‍රදේශයක ඡන්ද විමසීම (1) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමක සඳහන් දිනයෙහි කළ නොහැකි වූ අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් තේරීම් භාර නිලධරයා විසින්, ඒ ඡන්ද විමසීම සඳහා වෙනත් දිනයක් නියම කළ හැකි අතර, ඒ වෙනත් දිනය, ගැසට් පත්‍රයෙහි දැන්වීම පළ කරනු ලැබීමෙන් පසුව එළඹෙන දහහතර වන දිනයට කලින් වූ දිනයක් නොවිය යුතු ය.

නාමයෝජනා කරනු ලැබීමෙන් පසු අපේක්ෂකයකු මිය යාම

23. ඡන්ද විමසීමේ කාර්ය සඳහා ඡන්ද කටයුතු අඩාලව කල් තැබීමත් ඡන්ද විමසීම ආරම්භවීමත් අතර කාලය තුළ යම් සංවර්ධන සභා ප්‍රදේශයක් සඳහා නාම යෝජනා කරනු ලැබ සිටින අපේක්ෂකයකුගේ මරණය සිදුවන කවර හෝ විටක, ඒ මරණය සිදු වූ බවට තේරීම් භාර නිලධරයා සෑහීමට පත්වීමෙන් පසු, ඔහු විසින් නාම යෝජනා පත්‍රයෙන් ඒ අපේක්ෂකයාගේ නම කපා හැර, ඒ මරණය සිදු වුව ද මිය ගිය අපේක්ෂකයාගේ නම අත් හරිනු ලැබූ නාම යෝජනා පත්‍රය, ඒ නාම යෝජනා පත්‍රයෙහි නම් සඳහන් අනෙක් අපේක්ෂකයන් සම්බන්ධයෙන්, ඔවුන්ගේ නම් එහි දැක්වෙන අනුපිළිවෙල අනුව, වලංගු විය යුතු බව සහ 22 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීමෙහි සඳහන් පරිදි ඡන්ද විමසීම පවත්වනු ලබන බව ප්‍රකාශ කෙරෙන්නා වූ ද දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

තැපෑලෙන් ඡන්දය දීම.

24. (1) යම් සංවර්ධන සභා ප්‍රදේශයක ඡන්ද විමසීමක කාර්යය සඳහා මේ වගන්තිය යටතේ තැපැල් ඡන්දදායකයකු ලෙස සල කනු ලැබීමට හිමිකම ලැබූ තැනැත්තකු විසින් තැපෑලෙන් ඡන්දය දිය හැකි අතර ඒ ඡන්ද විමසීමේ දී ඔහු පෞද්ගලිකව ඡන්දය නොදිය යුතු ය.

මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කඩ කරමින් යම් ඡන්ද විමසීමක දී පෞද්ගලිකව ඡන්දය දෙන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් සංවර්ධන සභා ප්‍රදේශයක තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම සඳහා ඉල්ලීමක්—

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු විසින් හෝ පොලිස් දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ, තැපැල් දෙපාර්තමේන්තුවේ සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ හෝ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක නිලධරයකු හෝ සේවකයකු විසින් හෝ තමා එබඳු සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු වශයෙන් සේවයෙහි නියුක්තව සිටීම හා සම්බන්ධ විශේෂ අවස්ථානුගත කරුණු නිසා, තමාට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී පෞද්ගලිකව ඡන්දය දීමට තමාට නොහැකි වන බව හෝ නොහැකිවීමට ඉඩ ඇති බව හේතුකොටගෙන ඒ සාමාජිකයා, නිලධරයා හෝ සේවකයා විසින්,

(ආ) ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයේ දී ඡන්ද විමසීම හා සම්බන්ධ කාර්යයක් සඳහා තමාගේ සේවා නියුක්තියට අදාළ විශේෂ අවස්ථානුගත කරුණු නිසා, නැතහොත් ඒ කාර්යය සඳහා තමා සේවයෙහි නියුක්ත කරනු ලැබීමට ඉඩ ඇති බව හේතුකොටගෙන රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ පළාත් පාලන සේවයේ හෝ වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු විසින්, සහ

(ඇ) වෙනත් යම් සංවර්ධන සභා ප්‍රදේශයක තම අපේක්ෂකත්වය නිසා තමාට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී පෞද්ගලිකව ඡන්දය දීමට තමාට නොහැකි වන බව හෝ නොහැකි වීමට ඉඩ ඇති බව හේතුකොටගෙන ඡන්ද විමසීමක අපේක්ෂකයකු විසින්

කරනු ලැබිය හැකි ය.

(3) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමක්, 10 වන වගන්තිය යටතේ නාම යෝජනා කිරීම පිළිබඳ දැන්වීම පළ කරනු ලැබූ දිනයට පසු දින දහයක් ඇතුළත ලැබෙන පරිදි තේරීම් භාර නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒ ඉල්ලීම, මේ පනතේ දෙවන උපලේඛනයෙහි ඇතුළත් නියෝග මගින් ඒ කාර්යය සඳහා නියම කර ඇති ආකාරයට සාරානුකූල විය යුතු ය.

(4) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන යම් ඉල්ලීමක්, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූල බවට තේරීම් භාර නිලධරයා සෑහීමට පත් වුවහොත් මිස, ඒ ඉල්ලීමට ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(5) තැපැල් ඡන්දදායකයන් වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීම් පිළිබඳව සුදුස්සක් කිරීමේ කාර්යය සඳහා තේරීම් භාර නිලධරයා විසින්, ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් තොරතුරක් තමා වෙත සපයන ලෙස දැන්වීමක් මගින් යම් තැනැත්තකුට නියම කළ හැකි ය.

(6) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලැබූ ඉල්ලීමක් සම්බන්ධයෙන් තේරීම් භාර නිලධරයකුගේ තීරණය ඉල්ලුම්කරු වෙත ලියවිල්ලකින් දැන්විය යුතු ය.

(7) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමකට ඉඩ දෙමින් හෝ නොදෙමින් තේරීම් භාර නිලධරයා විසින් කරනු ලබන තීරණය අවසානාත්මක විය යුතු ය.

(8) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීම පිණිස කරනු ලබන ඉල්ලීමකට තේරීම් භාර නිලධරයා විසින් ඉඩ දෙනු ලැබූ අවස්ථාවක, ඡන්ද විමසීමක කාර්යය සඳහා ඉල්ලුම්කරු තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම ඇති තැනැත්තකු විය යුතු ය.

(9) තේරීම් භාර නිලධරයා විසින් තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ලත් එක් එක් තැනැත්තකු වෙත, ඒ තැනැත්තා විසින් සපයන ලද ලිපිනයට—

(අ) ඡන්ද පත්‍රිකාවක් ;

(ආ) අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතියක් ;

(ඇ) මේ උපවගන්තියේ (ඈ) ඡේදයෙහි සඳහන් ලියුම් කවරයට වඩා කුඩා විය යුතු වූ ද "ඡන්ද පත්‍රිකා ලියුම් කවරය" යන්න සහ ඒ තැනැත්තා වෙත නිකුත් කරන ලද තැපැල් ඡන්ද පත්‍රිකාවෙහි මුද්‍රණය කර ඇති අංකය ලකුණු කළා වූ ද තැපැල් ඡන්ද පත්‍රිකාව විධිමත් ලෙස ලකුණු කොට එය නැවත එවනු ලබන විට එය බහාලිය යුතු වූ ද ලියුම් කවරයක් ; සහ

(ඈ) ඉහත සඳහන් ලේඛන ආපසු යවනු ලැබීම පිණිස වූ ලියුම් කවරයක්

හැකි තාක් ඉක්මණින් තැපෑලෙන් යවනු ලැබිය යුතු ය.

(10) තැපැල් ඡන්දදායකයන් ලෙස සලකනු ලැබීමට හිමිකම් ලත් තැනැත්තන් විසින් පාවිච්චි කළ යුතු ඡන්ද පත්‍රිකාවේ ආකෘතිය හා අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය සහ ඒවා නිකුත් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය මේ පනතේ දෙවන උපලේඛනයෙහි ඇතුළත් නියෝග අනුව විය යුතු ය.

(11) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ලත් තැනැත්තකු වෙත නිකුත් කරනු ලබන ඡන්ද පත්‍රිකාවක් මේ පනතෙහි "තැපැල් ඡන්ද පත්‍රිකාවක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(12) ඡන්ද විමසීමක් පැවැත්වීමට ඇති යම් සංවර්ධන සභා ප්‍රදේශයක තේරීම් භාර නිලධරයා විසින් ඒ ඡන්ද විමසීමේ කාර්යය සඳහා තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ලත් සෑම තැනැත්තකුගේ ම ඡන්ද හිමි නාම ලේඛනයේ සඳහන් නම, ලිපිනය සහ අංකය දැක්වෙන (මේ පනතේ "තැපැල් ඡන්ද දායකයන්ගේ ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ලැයිස්තුවක් හැකිතාක් ඉක්මණින් පිළියෙළ කළ යුතු ය. මේ පනතේ දෙවන උපලේඛනයෙහි ඇතුළත් නියෝග මගින් ලැයිස්තුව පිළියෙළ කිරීම සම්බන්ධයෙන් නියම කර ඇති යම් ආකාරයකින් එය පිළියෙළ කරනු ලැබිය යුතු ය.

නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව.

**25.** (1) තේරීම් භාර නිලධරයා විසින් නාම ලේඛනයෙහි නම් දැක්වෙන එක් එක් ඡන්දහිමියා වෙත, කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියක වූ (මේ පනතේ "නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් යැවිය යුතු ය. ඒ ඡන්ද දැන්වීම් පත්‍රිකාවෙහි—

(අ) සංවර්ධන සභාවේ නම;

(ආ) නාම ලේඛනයෙහි දැක්වෙන පරිදි ඡන්ද හිමියාගේ නම, සුදුසුකම් ලැබීමේ ලිපිනය සහ ලියාපදිංචි කිරීමේ අංකය;

(ඇ) ඡන්ද ප්‍රදේශය;

(ඈ) ඡන්ද කොට්ඨාසය;

(ඉ) ඡන්ද හිමියා සඳහා වෙන් කරනු ලැබ ඇති ඡන්ද පොළ; සහ

(ඊ) ඡන්දය විමසීමේ දිනය හා වේලාව

සඳහන් කරනු ලැබිය යුතු ය:

එසේ වුවද තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ලත් ඡන්ද හිමියකු වෙත එවැනි පත්‍රිකාවක් යවනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක්, ඡන්ද විමසීම් පවත්වනු ලබන දිනයට යටත් පිරිසෙයින් දවස් හතකට හෝ කලින්, ඡන්දහිමියකුට ලැබෙන සේ ඔහු වෙත සාමාන්‍ය තැපැල් මාර්ගයෙන් යවනු ලැබිය යුතු ය. එවැනි පත්‍රිකාවක් එය අමතනු ලැබූ තැනැත්තා වෙත භාරදීමට තැපැල් කාර්යාලයකට නො හැකි වන අවස්ථාවක, අමතනු ලැබූ තැනැත්තා විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් ඔහුට භාරදීම සඳහා ඡන්ද විමසීම් පවත්වනු ලබන දිනය තෙක් එය ඒ තැපැල් කාර්යාලයෙහි රඳවා ගත යුතු ය.

(3) (අ) යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක්, බලය නොමැතිව වෙනත් යම් තැනැත්තකුට සපයන, හෝ

(ආ) වෙනත් යම් තැනැත්තකුට යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන නැතහොත් වෙනත් යම් තැනැත්තකුගෙන් යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් මිලයට ගන්නා හෝ මිලයට ගැනීමට ඉදිරිපත් වන

සෑම තැනැත්තකුම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(4) රජයේ නිලධරයකු වශයෙන් ස්වකීය කාර්ය ඉටු කරන රජයේ සේවකයකු නොවන්නා වූ ද වෙනත් යම් තැනැත්තකුගේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් තමාගේ සන්තකයෙහි තබාගෙන ඇත්තා වූ ද සෑම තැනැත්තකුම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

ඡන්ද ස්ථානාධිපතිවරයෝ.

26. (1) කොමසාරිස්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, එක් එක් තේරීම් භාර නිලධරයා විසින්, තම සංවර්ධන සභා ප්‍රදේශයේ එක් එක් ඡන්ද පොළ භාරව කටයුතු කිරීම සඳහා, මෙහි මින් මතු ඡන්ද ස්ථානාධිපතිවරු යනුවෙන් සඳහන් කරනු ලබන එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ගණනක් හෝ පත් කරනු ලැබිය යුතු අතර, ඔහුගේ හෝ ඔවුන්ගේ පත්වීම් තේරීම් භාර නිලධරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකිය. යම් ඡන්ද පොළකට එක් ඡන්ද ස්ථානාධිපතිවරයකුට වැඩි ගණනක් පත් කරනු ලැබුව හොත්, තේරීම් භාර නිලධරයා විසින්, ඒ ඡන්ද ස්ථානාධිපතිවරයන් අතුරෙන් එක් තැනැත්තකු ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා ලෙස පත් කළ හැකි ය. ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සෙසු ඡන්ද ස්ථානාධිපතිවරයන් විෂයෙහි ද ඒ ඡන්ද පොළෙහි ඡන්ද විමසීම පැවැත්වීම සඳහා යොදා ඇති සියලු වැඩපිළිවෙළවල් පිළිබඳව ද සාමාන්‍ය අධීක්ෂණය කළ යුතු ය.

(2) අසනීපයක් නිසා හෝ වෙනත් හේතුවක් නිසා යම් ඡන්ද විමසීමක දී කටයුතු කිරීමෙන් යම් ඡන්ද ස්ථානාධිපතිවරයකු වැළැක් වෙතහොත් සහ තේරීම් භාර නිලධරයා විසින් වෙනත් තැනැත්තකු පත් කිරීමට කාලයක් නොමැති වුවහොත් තමා වෙනුවෙන් වැඩ බැලීම පිණිස නියෝජ්‍යයකු ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් පත්

කරනු ලැබිය හැකි ය. එවැනි සෑම පත් කිරීමක් ම, හැකිතාක් ඉක්මණින් තේරීම් භාර නිලධරයා වෙත වාර්තා කළ යුතු අතර, ඒ පත්වීම, ඒ නියෝජ්‍යයා විසින් එවකටත් කර ඇති යම් දෙයක වලංගු භාවය කෙරෙහි හානියක් නොමැතිව, තේරීම් භාර නිලධරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(3) යම් ඡන්ද පොළක් භාරව කටයුතු කිරීම සුදුසු යයි තේරීම් භාර නිලධරයා කල්පනා කරන්නේ නම්, ඔහු විසින් එසේ කළ හැකි අතර, ඡන්ද ස්ථානාධිපතිවරයකු සම්බන්ධයෙන් මේ පනතෙහි වූ විධිවිධාන ඒ තේරීම් භාර නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

27. (1) යම් සංවර්ධන සභා ප්‍රදේශයක ඡන්ද විමසීමක කාර්යය සඳහා තේරීම් භාර නිලධරයා විසින්— ඡන්ද පොළවල සැලැස්විය යුතු පහසුකම්.

(අ) ඡන්දය විමසීම පැවැත්වීම සඳහා අවශ්‍ය යම් නිලධරයන් හා සේවකයන් පත් කළ යුතු ය;

(ආ) යම් කිසි වේලාවක දී ඡන්දදායකයන් සාධාරණ සංඛ්‍යාවකට ඉඩකඩ සැපයීම පිණිස හා ඡන්දදායකයන් විසින් ස්වකීය ඡන්ද පත්‍රිකා ලකුණු කරනු ලබන විට ඔවුන් නොපෙනෙන ලෙස ආවරණය වී ඇති බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය තරම් ආවෘත ස්ථාන යම් සංඛ්‍යාවක් එම සංවර්ධන සභා ප්‍රදේශයේ එක් එක් ඡන්ද පොළෙහි සැපයිය යුතු ය;

(ඇ) එක් එක් ඡන්ද ස්ථානාධිපතිවරයාගේ ඡන්ද පොළට වෙන් කර ඇති ඡන්ද හිමියන්ගේ නම් ඇතුළත් ඡන්ද හිමි නාම ලේඛනයේ කොටසෙහි පිටපතක් ද ඒ පිටපතෙහි ඡන්ද හිමියන්ගේ නම් අතුරෙන් තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි නම් දැක්වෙන ඡන්ද හිමියන්ගේ ලැයිස්තුවක් ද ඒ එක් එක් ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත සැපයිය යුතු ය. ඒ එක් එක් ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත සපයනු ලබන ඒ නාම ලේඛනයේ කොටසෙහි, තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට හිමිකම් ඇති සෑම ඡන්ද හිමියකුගේ ම නාම ඉදිරිපසින් හඳුනා ගැනීමේ ලකුණක් තබනු ලැබිය යුතු ය;

(ඈ) ඒ එක් එක් ඡන්ද පොළට වෙන් කර ඇති ඡන්දදායකයන් සංඛ්‍යාව සඳහා තේරීම් භාර නිලධරයාගේ මතය අනුව අවශ්‍ය විය හැකි ඡන්ද පෙට්ටි සහ ඡන්ද පත්‍රිකා යම් සංඛ්‍යාවක් එක් එක් ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත සැපයිය යුතු ය;

(ඉ) ඡන්දදායකයන්ට ඡන්ද පත්‍රිකා ලකුණු කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය ද්‍රව්‍යය ද ඡන්ද පත්‍රිකා මත නිල ලකුණ සිදුරු කිරීම හෝ මුද්‍රා තැබීම සඳහා අවශ්‍ය උපකරණ ද එක් එක් ඡන්ද පොළට සැපයිය යුතු ය;

(ඊ) මේ පනතින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ජන්ද විමසීම ඵලදායි ලෙස පැවැත්වීම සඳහා අවශ්‍ය වෙනත් ක්‍රියා හෝ දේ කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා නොකිරීමේ හේතුව මත හෝ ඒ ජන්ද පොළවල් සම්බන්ධයෙන් වූ යම් විධිහීනතාවක හේතුව මත හෝ යම් ජන්ද විමසීමක් විවාදයට භාජන නොකළ යුතු ය.

*ජන්ද පොළවල ප්‍රදර්ශනය කළ යුතු දැන්වීම්.*

28. (1) ජන්ද විමසීම පවත්වනු ලබන අතරතුර, සෑම ජන්ද පොළක ම ජන්ද ස්ථානාධිපතිවරයා විසින්—

(අ) ජන්ද පොළෙන් පිටත සහ එහි සෑම ආවෘත ස්ථානයක ම, ජන්දදායකයන්ගේ මගපෙන්වීම සඳහා උපදෙස් දෙන මේ පනතේ තුන්වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ දැන්වීමක් ; සහ

(ආ) ජන්ද පොළෙන් පිටත එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නාම යෝජනා පත්‍රයෙහි ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව දක්වා ඇති අපේක්ෂකයන්ගේ නම් සහ ඒ එක් එක් පක්ෂයට හෝ කණ්ඩායමට වෙන් කර ඇති අනුමත කරන ලද ලකුණු ද සමග, ජන්ද විමසීමේ දී තරග කරන ඒ එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ නම හෝ ජන්ද විමසීමේ දී තරග කරන ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට, ඒ එක් එක් කණ්ඩායම සඳහා " ස්වාධීන කණ්ඩායම " යන වචන සහ ඒ එක් එක් කණ්ඩායම සඳහා වෙන් කර ඇති හඳුනා ගැනීමේ අංකයක් වෙතොත් ඒ අංකය දැක්වෙන දැන්වීමක්

ප්‍රදර්ශනය කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ වූ සෑම දැන්වීමක් ම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම විය යුතු ය.

*ජන්ද පෙට්ටි.*

29. සෑම ජන්ද පෙට්ටියක ම, එය තුළට ජන්ද පත්‍රිකා ඇමිය හැකි ලෙසත් පෙට්ටිය විවෘත නොකොට එයින් ජන්ද පත්‍රිකා ඉවතට ගත නොහැකි වන ලෙසත් තැනිය යුතු ය.

*ජන්ද පත්‍රිකා.*

30. (1) යම් සංවර්ධන සභා ප්‍රදේශයක් සඳහා වූ සෑම ජන්ද විමසීමක දී ම ජන්ද පත්‍රිකා මගින් ජන්දය දෙනු ලැබිය යුතු ය. එක් එක් ජන්දදායකයාගේ ජන්දය මෙයි මින් මතු නියම කරනු ලබන ආකෘතියෙහි වූ ජන්ද පත්‍රිකාවකින් සමන්විත විය යුතු අතර එහි එසේ නියම කරනු ලබන විස්තර ද ඇතුළත් විය යුතු ය.

(2) සෑම ජන්ද පත්‍රිකාවක් ම මේ පනතේ පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති " ඇ " ආකෘතියට සාරානුකූල විය යුතු අතර—

(අ) ජන්ද විමසීමේ දී තරග කරන පිළිගත් දේශපාලන පක්ෂවල නම් සිංහල අකාරාදී අනුපිළිවෙළ අනුව අනුක්‍රමික[illegible] දැක්වෙන සේ සකස් කොට ඒ එක් එක් පක්ෂයට වෙන් කර ඇති ලකුණ ද සහිතව, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම ඒ සෑම ජන්ද පත්‍රිකාවක ම ඇතුළත් වි[illegible]

යුතු අතර, ඉන් ඉක්බිතිව, ඡන්ද විමසීමේ දී තරඟ කරන ස්වාධීන කණ්ඩායම් වෙතොත්, ඒ එක් එක් කණ්ඩායම සඳහා "ස්වාධීන කණ්ඩායම" යන වචන නැවත සඳහන් කොට හඳුනා ගැනීමේ අංකයක් ඇත් නම් ඒ හඳුනා ගැනීමේ අංකය අනුක්‍රමිකව ද ඒ එක් එක් කණ්ඩායමට වෙන් කර ඇති ඡන්ද ලකුණ ද ඒ සෑම ඡන්ද පත්‍රිකාවක ම ඇතුළත් විය යුතු ය;

(ආ) ඒ සෑම ඡන්ද පත්‍රිකාවක් ම නැමිය හැකි විය යුතු ය;

(ඇ) ඒ සෑම ඡන්ද පත්‍රිකාවක ම පිට පැත්තේ අංකයක් මුද්‍රණය කොට තිබිය යුතු ය; තව ද

(ඈ) ඒ සෑම ඡන්ද පත්‍රිකාවක ම, එම අංකය ම මුහුණතෙහි මුද්‍රණය කොට ඇති උප පත්‍රිකාවක් අමුණා තිබිය යුතු ය.

**31.** ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් කොමසාරිස්වරයා විසින් වෙනත් යම් කාලයක් නියම කරනු ලැබුව හොත් මිස, යම් සංවර්ධන සභා ප්‍රදේශයක ඡන්දය විමසීම 22 වන වගන්තිය යටතේ සඳහන් කරන ලද දිනයෙහි පෙරවරු හතට ආරම්භ කළ යුතු අතර එදින පස්වරු හතරට අවසන් කළ යුතු ය. **ඡන්ද විමසීමේ කාලය.**

**32.** (1) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නැතහොත් එහි බලයලත් නියෝජිතයා විසින් හෝ යම් කණ්ඩායම් නායකයකු විසින් හෝ ඡන්ද විමසීම පවත්වනු ලබන අතරතුර එක් එක් ඡන්ද පොළ සඳහා වූ යම් ඡන්ද ස්ථාන නියෝජිතයකුගේ පත්වීම අවලංගු කිරීමට ඇතිවිය හැකි අවශ්‍යතාව කෙරෙහි සැලකිලිමත්ව, ඒ එක් එක් ඡන්ද පොළ සඳහා ඡන්ද ස්ථාන නියෝජිතයන් යුක්තිසහගත සංඛ්‍යාවක් පත් කළ හැකි ය. එවැනි සෑම පත් කිරීමක් ම පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක්, එසේ පත් කරනු ලැබූ තැනැත්තන්ගේ නම් සහ ලිපින එහි සඳහන් කොට, ඒ ලේකම් හෝ බලයලත් නියෝජිතයා විසින් නැතහොත් කණ්ඩායම් නායකයා විසින් හෝ ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර හෝ ඡන්ද විමසීම පවත්වනු ලබන අතරතුර හෝ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත ඡන්ද පොළෙහි දී දිය යුතු ය. **ඡන්ද ස්ථාන නියෝජිතයන් පත් කිරීම.**

(2) පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම් හෝ එහි බලයලත් නියෝජිතයා නැතහොත් කණ්ඩායම් නායකයකු වෙත (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල, ඒ ලේකම්, බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින්, ඒ ඡන්ද විමසීම සඳහා ඒ පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් නාම යෝජනා කර ඇති යම් අපේක්ෂකයකු වෙත පවරනු ලැබිය හැකි ය. එහෙත් එක් එක් ඡන්ද ප්‍රදේශය වෙනුවෙන් එක් අපේක්ෂකයකුට වැඩි ගණනකට ඒ බලතල පවරනු නො ලැබිය යුතු ය. ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට පෙර දින හතකට කලින් නොවන දිනයක මේ උපවගන්තිය යටතේ කරන ලද යම් බලතල පැවරීමක් පිළිබඳව තේරීම් භාර නිලධරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

(3) ඒ ඡන්ද පොළෙහි කටයුතු කිරීමට පත් කරන ලද යම් ඡන්ද ස්ථාන නියෝජිතයකුගේ පත්වීම ඡන්ද ස්ථානාධිපතිවරයාට ඇනුම් දෙනු ලැබීමෙන් පසු ඒ ලේකම්, බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් නැතහොත් (2) වන උපවගන්තියෙහි සඳහන් අපේක්ෂකයා විසින් ඒ ඡන්ද ස්ථාන නියෝජිතයාගේ පත්වීම අවලංගු කොට ඒ ඡන්ද පොළට වෙනත් ඡන්ද ස්ථාන නියෝජිතයකු පත් කරනු ලබන අවස්ථාවක, ඒ පත්වීම අවලංගු කිරීම පිළිබඳව ද ඒ ඡන්ද පොළට පත් කරනු ලැබූ අලුත් ඡන්ද ස්ථාන නියෝජිතයාගේ නාම සහ ලිපිනය ද, අවස්ථාවෝචිත පරිදි ඒ ලේකම්, බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් නැතහොත් ඒ අපේක්ෂකයා විසින් ඒ ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත ලිඛිතව ඇනුම් දිය යුතු ය.

(4) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ ඡන්ද ස්ථාන නියෝජිතයන් දෙදෙනකුට වැඩි සංඛ්‍යාවක් කවර හෝ වේලාවක දී යම් ඡන්ද පොළකට ඇතුළු කර ගනු නොලැබිය යුතු අතර, එසේ දෙදෙනකුට වැඩි සංඛ්‍යාවකට ඡන්ද පොළෙහි රැඳී සිටීමට ද ඉඩ දෙනු නොලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියෙන් හෝ (3) වන උපවගන්තියෙන් නියමිත පරිදි තමාගේ නාම ඡන්ද ස්ථානාධිපතිවරයාට ඇනුම් දෙනු ලැබ නොමැති කිසිම ඡන්ද ස්ථාන නියෝජිතයකු ඡන්ද පොළකට ඇතුළු කර ගනු නොලැබිය යුතු ය.

**ඡන්ද විමසීම් පවත්වාගෙන යෑම පිළිබඳ සාමාන්‍ය කරුණු.**

**33.** (1) යම් තැනැත්තකු යම් ඡන්දදායක කණ්ඩායමකට අයත් වන්නේ ද ඒ ඡන්දදායක කණ්ඩායම සඳහා වෙන් කර ඇති ඡන්ද පොළෙහි දී හැර වෙනත් කිසිම ඡන්ද පොළක දී ඒ තැනැත්තා ඡන්දය දීම සඳහා ඇතුළත් කර ගනු නොලැබිය යුතු ය.

(2) ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් තම ඡන්ද පොළෙහි මනා පැවැත්ම රැක ගත යුතු අතර වරකට ඇතුළු කළ යුතු ඡන්දදායකයන්ගේ සංඛ්‍යාව ද ඔහු විසින් විධිමත් කළ යුතු ය; තව ද ඔහු විසින් පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම් සහ අපේක්ෂකයන්, ඡන්ද ස්ථාන නියෝජිතයන්, රාජකාරියෙහි නියුක්ත පොලිස් නිලධරයන් සහ නිල වශයෙන් ඡන්ද පොළෙහි සේවයෙහි නියුක්ත කර ඇති වෙනත් තැනැත්තන් හැර සෙසු සියලු තැනැත්තන් ඡන්ද පොළෙන් බැහැර කළ යුතු ය.

(3) යම් තැනැත්තකු ඡන්ද පොළ ඇතුළත නොමනා ලෙස හැසිරුණහොත් හෝ ඡන්ද ස්ථානාධිපතිවරයාගේ නීත්‍යනුකූල අණට කීකරු වීම පැහැර හැරියහොත් ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඒ තැනැත්තා යම් පොලිස් නිලධරයකු ලවා හෝ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් හෝ තේරීම් භාර නිලධරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තකු ලවා හෝ ඡන්ද පොළෙන් වහාම ඉවත් කරනු ලැබීමට සැලැස්විය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ඡන්ද පොළකින් ඉවත් කරනු ලැබූ යම් තැනැත්තකුට—

(අ) ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අවසරය ඇතිව හැර, ඡන්ද විමසීම පැවැත්වෙන වේලාව ඇතුළත ඡන්ද පොළට නැවත ඇතුල්වීමට ඉඩ දෙනු නොලැබිය යුතු ය; තව ද

(ආ) ඒ ඡන්ද පොළෙහි දී යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් චෝදනා නගා ඇත්නම්, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියට පමුණුවන තෙක් ඒ තැනැත්තා අත්අඩංගුවේ තබා ගනු ලැබිය හැකි ය :

එසේ වුව ද යම් ඡන්ද පොළක දී ඡන්දය දීමට අන්‍යාකාරයකින් හිමිකම් ඇති යම් ඡන්දදායකයකුට ඒ ඡන්ද පොළෙහි දී ඡන්දය දීමේ අවස්ථාවක් ලැබීමෙන් වැළැක්වෙන පරිදි මේ උපවගන්තියෙන් පවරන ලද බලතල ක්‍රියාත්මක කරනු නොලැබිය යුතු ය.

ඡන්ද පෙට්ටිවලට මුද්‍රා තැබීම සහ ඡන්ද විමසීම ආරම්භ කිරීම.

34. (1) ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙරාතුව ම ඡන්ද පොළක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්—

(අ) ඡන්ද විමසීමේ දී පාවිච්චි කිරීමට ඇති ඡන්ද පත්‍රිකා, නීල මුද්‍රාව, නීල ලකුණ සහ ඡන්ද හිමියන්ගේ නාමලේඛනයේ කොටස්වල පිටපත් ඒ ඡන්ද පොළට පැමිණ සිටින යම් තැනැත්තන් වෙතොත්, ඒ තැනැත්තන්ට පෙන්විය යුතු ය ; තව ද

(ආ) පාවිච්චි කිරීමට ඇති එක් එක් ඡන්ද පෙට්ටිය හිස්ව තිබෙන බව බලා ගත හැකි වන සේ ඉහත කී තැනැත්තන්ට ඡන්දය විමසීම් ආරම්භයේ දී ම එය හිස්ව පෙන්විය යුතු ය. ඉක්බිති ඊට යතුරු ලා, මුද්‍රාව නොකඩා එය විවෘත කිරීම වැළැක්වෙන ආකාරයට ඒ මත ස්වකීය මුද්‍රාව තබා ඡන්ද පත්‍රිකා බහාලීම සඳහා එය තමන්ට පෙනෙන ස්ථානයක තැබිය යුතු ය. තව ද යතුරු ලා මුද්‍රා තැබූ පරිදිම එය තබා ගත යුතු ය.

මේ පනතින් නියමිත වේලාවට ඡන්දය විමසීම ආරම්භ වීම තහවුරු වන පරිදි යම් ආකාරයකින් ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන මගින් නියම වී ඇති කාර්ය ඉටු කළ යුතු ය.

(2) ඡන්ද විමසීම ආරම්භ වීමෙන් පසුව පාවිච්චි කරනු ලබන සෑම ඡන්ද පෙට්ටියක් සම්බන්ධයෙන් ම (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම.

35. (1) එක් එක් ඡන්දදායකයා වෙත එක් ඡන්ද පත්‍රිකාවක් දෙනු ලැබිය යුතු අතර ඔහුට එක් ඡන්දයක් තිබිය යුතු ය.

(2) ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් නැතහොත් ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා වෙත භාර දෙනු ලැබිය යුතු ය. ඡන්ද පත්‍රිකාව ඡන්දදායකයා වෙත භාරදීමට පෙරාතුව ම—

(අ) ඡන්ද හිමි නාමලේඛනයේ පිටපතෙහි සඳහන් පරිදි ඡන්දදායකයාගේ අංකය, නම සහ විස්තරය හඬ නගා කියවිය යුතු ය ;

(ආ) ඡන්දදායකයාගේ අංකය උපපත්‍රිකාවෙහි ලකුණු කොට ඡන්ද පත්‍රිකාව එයින් වෙන් කළ යුතු ය ;

(ඇ) ඡන්ද පත්‍රිකාව නිල ලකුණෙන් මුද්‍රා තැබිය යුතු ය; නැතහොත් නිල ලකුණ එහි තෙරපිය යුතු ය; නැතහොත් නිල ලකුණ එහි සිදුරු කළ යුතු ය; තව ද

(ඈ) ඡන්දදායකයා විසින් ඡන්ද පත්‍රිකාවක් ලබා ඇති බව දැක්වීම පිණිස, එහෙත් ඔහු ලැබූ නිශ්චිත ඡන්ද පත්‍රිකාව කුමක්දැයි නොදක්වා, නාම ලේඛනයෙහි ඔහුගේ අංකය ඉදිරියෙන් ලකුණක් තැබිය යුතු ය.

ඡන්දදායකයා පරීක්ෂා කිරීම හා උචිත ලකුණ සලකුණු කිරීම.

**36.** (1) ඡන්ද විමසීමක දී යම් ඡන්දදායකයකු—

(අ) ඡන්ද ස්ථානාධිපතිවරයාට හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකුට හෝ උචිත පරීක්ෂණය කිරීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කරතහොත්; හෝ

(ආ) එසේ පරීක්ෂණයට ඉඩ දීමෙන් පසු, ඒ ඡන්දදායකයා ඒ වනවිටත් උචිත ලකුණින් සලකුණු කරනු ලැබ ඇති බව ඒ පරීක්ෂණයෙන් අනාවරණය වුවහොත්; හෝ

(ඇ) ඒ වන විට ඒ ඡන්දදායකයා ඒ පරීක්ෂණයට ඉඩදීමෙන් පසු උචිත ලකුණින් සලකුණු කර නොමැති බව අනාවරණය වුව ද ඒ ඡන්දදායකයා උචිත ලකුණින් තමා සලකුණු කරනු ලැබීමට ඒ නිලධරයාට හෝ තැනැත්තාට ඉඩ දීම ප්‍රතික්ෂේප කරතහොත්

ඒ ඡන්දදායකයාට කිසිම ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු නොලැබිය යුතු අතර, ඒ අනුව, මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුවද, ඒ ඡන්දදායකයා ඒ ඡන්ද විමසීමේ දී ඡන්දය දීමට හිමිකම් නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඡන්ද පොළක දී ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු නොලැබූ එක් එක් ඡන්දදායකයාට අදාළ, පහත සඳහන් විස්තර ඒ ඡන්ද පොළ භාර ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් පළමුවන උපලේඛනයේ දක්වා ඇති "ඇ" ආකෘතියට සාරානුකූල වූ ලැයිස්තුවක ඇතුළත් කළ යුතු ය:—

(අ) ඡන්ද හිමි නාම ලේඛනයෙහි දැක්වෙන පරිදි ඒ ඡන්දදායකයාගේ අංකය;

(ආ) ඡන්ද හිමි නාම ලේඛනයේ දැක්වෙන පරිදි ඒ ඡන්දදායකයාගේ නාම; සහ

(ඇ) ඒ ඡන්දදායකයාට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු නොලැබූ හේතුව.

ඒ ලැයිස්තුව "36 වන වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකා නිකුත් කරනු නොලැබූ ඡන්දදායකයන්ගේ ලැයිස්තුව" යනුවෙන්, මේ පනතෙහි සඳහන් කරනු ලැබේ.

(3) මේ වගන්තියෙහි—

(අ) "උචිත ලකුණ" යන යෙදුමෙන්, නොමැකිය හැකි තීන්තෙන් කරන ලද ලකුණක් අදහස් වේ;

(ආ) ඡන්දදායකයකු පරීක්ෂා කිරීම හෝ ලකුණු කිරීම හා සම්බන්ධ හෝ ඊට අදාළ යම් පද සම්බන්ධයක දී "උචිත" යන පාඨයෙන්—

(i) ඒ ඡන්දදායකයාගේ වම් අතේ සුළැඟිල්ල හෝ ඒ සුළැඟිල්ල නොමැති නම්, ඔහුගේ වම් අතේ වෙනත් යම් ඇඟිල්ලක් ; හෝ

(ii) ඔහුගේ වම් අතේ ඇඟිලි සියල්ලම නොමැති නම්, ඔහුගේ දකුණු අතේ සුළැඟිල්ල හෝ ඒ සුළැඟිල්ල නොමැති නම්, ඔහුගේ දකුණු අතේ වෙනත් යම් ඇඟිල්ලක් ; හෝ

(iii) ඔහුගේ වම් හා දකුණු අත්වල සියලු ම ඇඟිලි නොමැති නම්, ඔහුට ඇති ඔහුගේ වම් හෝ දකුණු අතෙහි කෙළවර

අදහස් වේ.

ඡන්දය දෙන ආකාරය.

37. (1) ඡන්ද පත්‍රිකාව ලැබුණු විට ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් නැතහොත් ඒ නිලධරයාගේ බලය යටතේ ක්‍රියා කරන යම් නැනැත්තකු විසින් හෝ පෙන්වා දෙනු ලබන ආවෘත ස්ථානයකට ඡන්දදායකයා වහාම යා යුතු අතර, මේ පනතේ තුන්වන උපලේඛනයේ ඡන්දදායකයන්ට මග පෙන්වීම සඳහා දී ඇති උපදෙස්වලට හැකිතාක් අනුකූලව එහි දී ඒ ඡන්ද පත්‍රිකාව රහසින් ලකුණු කළ යුතු ය. ඉක්බිති ඡන්දදායකයා විසින් තම ඡන්දය නොපෙනෙන සේ ඡන්ද පත්‍රිකාව නමා, නිල ලකුණ පෙනෙන සේ පත්‍රිකාවේ පිටුපස ඡන්ද ස්ථානාධිපතිවරයාට පෙන්වා, එසේ නවන ලද ඡන්ද පත්‍රිකාව, ඡන්ද ස්ථානාධිපතිවරයා ඉදිරිපිට දී ඡන්ද පෙට්ටිය තුළට බහාලිය යුතු ය.

(2) ඡන්ද පත්‍රිකා ලකුණු කිරීම සඳහා වෙන් කරන ලද යම් ස්ථානයක කිසිම ඡන්දදායකයකු නුවුවමනා ලෙස ප්‍රමාද නොවන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය පියවර, ඡන්ද විමසීමක් පැවැත්වෙන අතරතුර කවර හෝ වේලාවක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ගනු ලැබිය හැකි ය.

ඡන්දදායකයන්ට ඡන්දය දිය හැකි වීම පිණිස සහාය වීම.

38. (1) යම් ඡන්දදායකයකු විසින් ඉල්ලා සිටි විටක, ඡන්ද ස්ථානාධිපතිවරයා හෝ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් බලය දෙනු ලැබූ යම් නැනැත්තකු හෝ සුදුසු යයි කල්පනා කරන්නේ නම්, ඡන්ද ස්ථාන නියෝජිතයන් පැමිණ සිටි නම් ඔවුන්ට පෙනෙන හා ඇසෙන පරිදි, මේ පනතේ තුන්වන උපලේඛනයේ ඡන්දදායකයන්ට මග පෙන්වීම සඳහා දී ඇති උපදෙස්වල දක්වා ඇති ඡන්දය දීමේ ක්‍රමය ඔහු විසින් ඒ ඡන්දදායකයාට පහදා දිය හැකි ය. එහෙත් එසේ කිරීමේ දී යම් නිශ්චිත පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දෙන ලෙස උපදෙස් දීමක් හෝ මග පෙන්වීමක් වශයෙන් ඡන්දදායකයා විසින් තේරුම් ගත හැකි යම් ක්‍රියාවක් කිරීමෙන් ඔහු තරයේ වැළකිය යුතු ය.

(2) අන්ධභාවය නිසා හෝ වෙනත් ශාරීරික හේතුවක් නිසා මේ පනතේ තුන්වන උපලේඛනයේ ඡන්දදායකයන්ට මග පෙන්වීම සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව ඡන්දය දීමට අපොහොසත්

වන යම් ඡන්දදායකයකු විසින් ඉල්ලා සිටි විටක, ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්, ඡන්ද පොළෙහි තම කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු ඉදිරිපිට ඒ ඡන්දදායකයාගේ ඡන්ද පත්‍රිකාව ඔහු විසින් නියම කරනු ලබන ආකාරයෙන් ලකුණු කළ යුතු අතර ඒ ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුළ බහාලීමට සැලැස්විය යුතු ය.

ප්‍රතියුක්තයකු මගින් ඡන්දය දීම තහනම් බව.

**39.** යම් සංවර්ධන සභාවක් සඳහා වූ යම් ඡන්ද විමසීමක දී ප්‍රතියුක්තයකු මගින් ඡන්දය දීමට කිසිම ඡන්දදායකයකු හිමිකම් නොලැබිය යුතු ය.

ඔහු ඡන්ද දීම නීති විරෝධී ක්‍රියාවක් බව.

**40.** මේ පනත යටතේ වූ ඡන්ද විමසීමක දී යම් තැනැත්තකු—

(අ) එක් සංවර්ධන සභා ප්‍රදේශයකට වඩා වැඩි ගණනක දී ඡන්දය දුනහොත් හෝ එසේ ඡන්දය දීමේ කාර්යය සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටියහොත් ; හෝ

(ආ) එකම සංවර්ධන සභා ප්‍රදේශයක දී එක් වරකට වඩා වැඩි වාර ගණනක් ඡන්දය දුනහොත් හෝ එසේ ඡන්දය දීමේ කාර්යය සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටියහොත්

ඔහු මේ පනත යටතේ නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

ප්‍රකාශ කරන ලෙස ඡන්දදායකයාට නියම කිරීමට ඇති බලය.

**41.** (1) යම් ඡන්දදායකයකුට ඡන්ද පත්‍රිකාවක් දීමට පෙර, මේ පනතේ පළමුවන උපලේඛනයේ "ඉ", "ඊ" සහ "උ" ආකෘති වල සඳහන් ප්‍රකාශ සියල්ලම හෝ ඉන් යම් ප්‍රකාශයක් කර ඒවා හෝ එය අත්සන් කරන ලෙස යම් ඡන්ද පොළක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්, ස්වකීය අභිමතය පරිදි, ඒ ඡන්දදායකයාට නියම කළ හැකි ය ; තව ද යම් ඡන්දදායකයකුට ඡන්ද පත්‍රිකාවක් දීමට පෙර, ඒ ඡන්දදායකයා විසින් එකී ආකෘතිවල සඳහන් ප්‍රකාශ සියල්ලම හෝ ඉන් යම් ප්‍රකාශයක් කර ඒවා හෝ එය අත්සන් කළ යුතු යයි ඡන්ද ස්ථාන නියෝජිතයකු විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඒ ඡන්දදායකයාට එසේ කරන ලෙස නියම කළ යුතු ය. ඒ සෑම ප්‍රකාශයක් ම මුද්දර ගාස්තුවලින් නිදහස් විය යුතු ය.

(2) එවැනි යම් ප්‍රකාශයක් කිරීමට යම් තැනැත්තකු ප්‍රතික්ෂේප කළහොත්, ඔහුට ඡන්ද පත්‍රිකාවක් දීම ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

(3) යම් තැනැත්තකු විසින් එවැනි යම් ප්‍රකාශයක ඕනෑකමින් ම අසත්‍ය ප්‍රකාශයක් කළහොත් ඔහු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

තරක් වූ ඡන්ද පත්‍රිකා.

**42.** ස්වකීය ඡන්ද පත්‍රිකාව, ඡන්ද පත්‍රිකාවක් ලෙස නිසියාකාරව පාවිච්චි කළ නොහැකි වන සේ අනවධානයෙන් පරිහරණය කර ඇති ඡන්දදායකයකු විසින්, එසේ අනවධානයෙන් පරිහරණය කරන ලද ඡන්ද පත්‍රිකාව ඡන්ද ස්ථානාධිපතිවරයාට භාර දී ඡන්ද ස්ථානාධිපතිවරයා සෑහීමට පත්වන පරිදි අනවධානය පිළිබඳ සිද්ධිය ඔප්පු කරනු ලැබූ කල්හි, ඔහු විසින් එසේ භාර දෙන ලද (මේ පනතෙහි "තරක් වූ ඡන්ද පත්‍රිකාවක්" යනුවෙන් සඳහන් කරනු ලබන) ඡන්ද පත්‍රිකාව වෙනුවට වෙනත් ඡන්ද පත්‍රිකාවක් ලබා ගත හැකි ය. ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඒ තරක් වූ ඡන්ද පත්‍රිකාව වහාම අවලංගු කරනු ලැබිය යුතු ය.

ද්විත්ව ඡන්ද.

**43.** ඡන්ද හිමි නාම ලේඛනයෙහි නම සඳහන් එක්තරා ඡන්ද හිමියකු ලෙස පෙනී සිටින තැනැත්තකු, වෙනත් තැනැත්තකු විසින් ඒ ඡන්ද හිමියා ලෙස ඡන්දය දීමෙන් පසු ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටියහොත්, මුද්දර ගාස්තුවලින් නිදහස් විය යුතු වූ ද මේ පනතේ පළමුවන උපලේඛනයෙහි "ඍ" ආකෘතියට සාරානුකූල වූ ද ප්‍රකාශයක් ඉල්ලුම්කරු විසින් කර එය පිළිගෙන අත්සන් කළ කල්හි, ඡන්ද පත්‍රිකාවක් ලැබීමට සහ වෙනත් යම් ඡන්දදායකයකු ඡන්දය දෙන ආකාරයෙන් ම ඡන්දය දීමට ඒ ඉල්ලුම්කරු හිමිකම් ලැබිය යුතු ය. එහෙත් මේ පනතෙහි "ද්විත්ව ඡන්ද පත්‍රිකාවක්" යනුවෙන් සඳහන් කරනු ලබන ඒ ඡන්ද පත්‍රිකාව අනෙක් ඡන්ද පත්‍රිකාවලින් වෙනස් වූ වර්ණයකින් යුක්ත විය යුතු අතර ඡන්ද පෙට්ටිය තුළට බහා ලීමට පෙර ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඡන්දදායකයාගේ නමත්, නාම ලේඛනයෙහි වූ ඔහුගේ අංකයත් එහි පිටසන් කළ යුතු ය; තව ද ඒ අංකය මේ පනතෙහි "ද්විත්ව ඡන්ද ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන ලැයිස්තුවක ඇතුළත් කරනු ලැබිය යුතු ය. ඒ ලැයිස්තුව මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති "එ" ආකෘතියට සාරානුකූල විය යුතු ය. ද්විත්ව ඡන්ද පත්‍රිකා සම්බන්ධයෙන් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් කටයුතු කළ යුතු ය.

ඡන්ද විමසීම අවසන් කිරීම.

**44.** ඡන්ද විමසීම අවසන් කිරීම සඳහා නියමිත වේලාවෙන් පසු, ඡන්දදායකයකුට කිසිම ඡන්ද පත්‍රිකාවක් භාර දෙනු නොලැබිය යුතු ය. එහෙත් ඡන්ද පත්‍රිකාවක් භාර දෙනු ලැබූ යම් ඡන්දදායකයකු ඉහත කී වේලාවේ දී යම් ඡන්ද පොළක් තුළ සිටියහොත් ඒ ඡන්දදායකයාට ඔහුගේ ඡන්දය සටහන් කිරීමට ඉඩ දෙනු ලැබිය යුතු ය.

ඡන්ද විමසීම අවසන් කරනු ලැබූ විට කාර්ය පටිපාටිය.

**45.** (1) එක් එක් ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින්, ඡන්ද විමසීම අවසන් කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, ඡන්ද ස්ථාන නියෝජිතයන් ඉදිරිපිට දී පහත සඳහන් දේ වෙන වෙනම පැකට්ටුවලට දමා ඒ පැකට්ටුවලට තමාගේ මුද්‍රාව සහ, ස්වකීය මුද්‍රා තැබීමට කැමති ඡන්ද ස්ථාන නියෝජිතයන්ගේ ද මුද්‍රා තබා ඒ පැකට්ටු ගණන් කිරීමේ නිලධරයාට භාර දිය යුතු ය:—

(අ) ඒ ඡන්ද පොළෙහි පාවිච්චි කරන ලද එක් එක් ඡන්ද පෙට්ටිය; ඒ එක් එක් පෙට්ටිය ඡන්ද විමසීම ආරම්භ කරනු ලැබූ වේලාවෙහි තිබුණු ආකාරයෙන්ම යතුරු දමා

තිබිය යුතු අතර ඡන්ද විමසීම අවසන් කරනු ලැබීමෙන් පසු යම් ඡන්ද පත්‍රිකා එහි බහාලිය නොහැකිවන සේ එය මුද්‍රා තබා තිබිය යුතු ය;

(ආ) එක් එක් ඡන්ද පෙට්ටියේ යතුර;

(ඇ) ගොනු කොටගත්, පාවිච්චි නොකළ හා නරක් වූ ඡන්ද පත්‍රිකා;

(ඈ) ඡන්ද හිමි නාමලේඛනයේ ලකුණු කළ පිටපත් සහ ඡන්ද පත්‍රිකාවල උපපත්‍රිකා;

(ඉ) 36 වන වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකා භාර දෙනු නොලැබූ ඡන්දදායකයන්ගේ ලැයිස්තුව; සහ

(ඊ) ද්විත්ව ඡන්ද ලැයිස්තුව.

(2) ඡන්ද ස්ථානාධිපතිවරයාට භාර දෙන ලද ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව දැක්වෙන්නා වූ ද—

(අ) නරක් වූ ඡන්ද පත්‍රිකා හැර, ඡන්දදායකයන් වෙත නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකා;

(ආ) නරක් වූ ඡන්ද පත්‍රිකා; සහ

(ඇ) පාවිච්චි නොකරන ලද ඡන්ද පත්‍රිකා

යන ශීර්ෂ යටතේ ඒ පිළිබඳ ගණන් පෙන්වන්නා වූ ද මේ පනතේ පළමුවන උපලේඛනයේ "ඒ" ආකෘතියට සාරානුකූල වූ ද (මෙහි මින් මතු "ඡන්ද පත්‍රිකා විස්තරය" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රකාශයක් ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් සකස් කොට පැකැට්ටු සමග භාර දිය යුතු ය.

තමාට සහායවීම පිණිස පත් කර ඇති නිලධරයන් මගින් ඡන්ද ස්ථානාධිපතිවරයාට ක්‍රියා කළ හැකි බව.

46. යම් තැනැත්තකු සිරභාරයට ගැනීමට හෝ ඡන්ද පොළෙන් බැහැර කිරීමට හෝ ඉවත් කිරීමට නියම කිරීම හැර, ඡන්ද පොළක දී කිරීමට මේ පනතින් ඡන්ද ස්ථානාධිපතිවරයාට නියමිත හෝ බලය දී ඇති යම් ක්‍රියාවක්, තමාට සහාය වීම පිණිස පත් කර ඇති නිලධරයන් මගින් ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඒ ඡන්ද පොළෙහි දී කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස

### ඡන්ද ගණන් කිරීම සහ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම

ගණන් කිරීමේ නිලධරයෝ.

47. (1) කොමසාරිස්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, එක් එක් තේරීම් භාර නිලධරයා විසින් එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ ඡන්ද ගණන් කිරීම භාරව කටයුතු කිරීම සඳහා ගණන් කිරීමේ නිලධරයකු ද ඒ ගණන් කිරීමේ නිලධරයාගේ කාර්ය ඉටු කිරීමෙහි ලා ඔහුට සහාය වීම පිණිස අවශ්‍ය සහායකයන්, ලිපිකරුවන් සහ වෙනත් නිලධරයන් යම් සංඛ්‍යාවක් ද පත් කළ යුතු අතර ඔහු විසින් ඒ පත්වීම් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(2) සුදුසු යයි තේරීම් භාර නිලධරයා කල්පනා කරන්නේ නම්, ඔහු විසින් ගණන් කිරීමේ නිලධරයකුගේ කාර්ය ඉටු කළ හැකි අතර ගණන් කිරීමේ නිලධරයකු සම්බන්ධයෙන් වූ මේ පනතේ විධි විධාන ඒ තේරීම් භාර නිලධරයාට අදාළ විය යුතු ය.

ගණන් කිරීම පිළිබඳ දැන්වීම.

48. ඡන්ද විමසීම අවසන් කළ පසු හැකි ඉක්මණින් ඡන්ද ගණන් කිරීම සඳහා තේරීම් භාර නිලධරයා විසින් කටයුතු පිළියෙළ කළ යුතු අතර එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ පිහිටීම හා ගණන් කිරීම ආරම්භ කරන දිනය සහ වේලාව පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක් ද ගණන් කිරීමේ මධ්‍යස්ථානය සහ ඒ එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයට වෙන් කරන ලද ගණන් කිරීමේ මධ්‍යස්ථානය සහ ඡන්ද පොළ හෝ ඡන්ද පොළවල් දැක්වෙන ප්‍රකාශයක් ද ඡන්ද විමසීම තරඟ කරන එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට හෝ බලයලත් නියෝජිතයාට සහ යම් ස්වාධීන කණ්ඩායමක කණ්ඩායම් නායකයාට තේරීම් භාර නිලධරයා විසින් දෙනු ලැබිය යුතු ය.

ගණන් කිරීමේ නියෝජිතයන් පත් කිරීම.

49. (1) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් හෝ බලයලත් නියෝජිතයා විසින් හෝ කණ්ඩායම් නායකයකු විසින්—

(අ) එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයෙහි ඡන්ද ගණන් කරනු ලබන විට පැමිණ සිටීම සඳහා, ඒ ගණන් කිරීමේ මධ්‍යස්ථානයට 48 වන වගන්තිය යටතේ ඡන්ද පොළවල් එකකට වැඩි සංඛ්‍යාවක් පවරා ඇති අවස්ථාවක, (මෙහි මින් මතු "ගණන් කිරීමේ නියෝජිතයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) නියෝජිතයන් පස්දෙනකුට නොවැඩි ගණනක් ද ;

(ආ) 48 වන වගන්තිය යටතේ ඒ ගණන් කිරීමේ මධ්‍යස්ථානයට පවරා ඇත්තේ එක් ඡන්ද පොළක් පමණක් වූ අවස්ථාවක එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයෙහි ඡන්ද ගණන් කරනු ලබන විට පැමිණ සිටීම සඳහා ගණන් කිරීමේ නියෝජිතයන් දෙදෙනකුට නොවැඩි ගණනක් ද

පත් කරනු ලැබිය හැකි ය.

(2) ඡන්ද ස්ථාන නියෝජිතයකු පත්කර ගැනීමට 32 වන වගන්තිය යටතේ බලය පවරනු ලැබූ අපේක්ෂකයකු වෙත (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් කරනු ලැබූ ගණන් කිරීමේ මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් ගණන් කිරීමේ නියෝජිතයන් පත් කිරීමේ බලය ඒ ආකාරයෙන්ම පවරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපින ප්‍රකාශ කරන, ඒ පත්වීම් පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක්, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ බලයලත් නියෝජිතයා විසින් හෝ කණ්ඩායම් නායකයා විසින් හෝ (2) වන උපවගන්තියේ සඳහන් අපේක්ෂකයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ වීමට පෙර ගණන් කිරීමේ නිලධරයාට දෙනු ලැබිය යුතු ය. යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ නම සහ ලිපිනය එසේ දැනුම් දී නොමැත්තේ ද

ඒ ගණන් කිරීමේ නියෝජිතයා ගණන් කිරීමේ මධ්‍යස්ථානයට ඇතුළු කර ගැනීම, ගණන් කිරීමේ නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

ගණන් කිරීම.

**50.** (1) 48 වන වගන්තිය යටතේ තමාගේ ගණන් කිරීමේ මධ්‍යස්ථානයට වෙන් කරන ලද සෑම ඡන්ද පොළකින්ම සියලුම ඡන්ද පෙට්ටි සියල්ල ම තමාට ලැබුණු පසු ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ කළ යුතු ය.

(2) ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට කලින්, ඔහු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්, පැමිණ සිටින ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිට දී—

(අ) ඡන්ද පත්‍රිකා විස්තරය ඒ ගණන් කිරීමේ නියෝජිතයන්ට පෙන්විය යුතු අතර එහි පිටපත් ගැනීමට ඔවුන්ට අවසර දිය යුතු ය; තව ද

(ආ) එක් එක් ඡන්ද පෙට්ටිය විවෘත කොට, එහි ඇති ඡන්ද පත්‍රිකා පිටතට ගනු ලැබීමෙන් පසු ඒ එක් එක් පෙට්ටියේ ඇති ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව ගණන් කොට වාර්තාගත කර ගෙන ඡන්ද පෙට්ටිවල තිබුණු සියලු ම පත්‍රිකා එකට මිශ්‍ර කළ යුතු ය.

(3) ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කරනු ලබන විට ඡන්ද පත්‍රිකා මුහුණත උඩුකුරුව සිටින සේ තැබිය යුතු අතර ඒ පත්‍රිකාවල පිටුපස මුද්‍රණය කොට ඇති අංක යම් තැනැත්තකු විසින් දැකීම වළක්වාලීම සඳහා නිසි සියලු පූර්වෝපායයන් යෙදිය යුතු ය.

(4) ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම හැකි තාක් දුරට අඛණ්ඩව කරගෙන යා යුතු අතර, අවලංගු යයි ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි යම් ඡන්ද පත්‍රිකාවක "ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන පිටසන් කළ යුතු ය.

(5) ගණන් කිරීමේ නිලධරයා විසින් ද්විත්ව ඡන්ද පත්‍රිකා ගණන් කරනු නොලැබිය යුතු අතර ඒවායින් ආධාර කෙරෙන පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම අනුව වෙන වෙන පැකැට්ටුවල ඒවා තැන්පත් කළ යුතු ය. තව ද, අවස්ථෝචිත පරිදි, ඒ දේශපාලන පක්ෂයේ නාම හෝ "ස්වාධීන කණ්ඩායම" යන වචන සහ ඒ කණ්ඩායමේ හඳුනා ගැනීමේ අංකයක් ඇත්නම් එය ඔහු විසින් එක් එක් පැකැට්ටුවේ සටහන් කොට ඒ පැකැට්ටු තේරීම් භාර නිලධරයා වෙත භාර දිය යුතු ය.

(6) ඡන්ද ගණන් කරන අවස්ථාවේ දී ගණන් කිරීමේ නිලධරයාට, ඔහුගේ සහායකයන්ට හා ලිපිකරුවන්ට සහ ගණන් කිරීමේ නියෝජිතයන්ට පැමිණ සිටිය හැකි නමුත් ගණන් කිරීමේ නිලධරයාගේ කැමැත්ත ඇතිව මිස, වෙනත් තැනැත්තකුට එහි පැමිණ සිටිය නොහැකි ය.

ප්‍රතික්ෂේප කළ යුතු ඡන්ද පත්‍රිකා.

51. (1) (අ) නිල ලකුණ නොමැති යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ආ) (i) පිළිගත් දේශපාලන පක්ෂ එකකට වැඩි ගණනකට ; හෝ

(ii) ස්වාධීන කණ්ඩායම් එකකට වැඩි ගණනකට ; හෝ

(iii) පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් එකක හෝ ඊට වැඩි ගණනක සංකලනයකට

ඡන්ද සටහන් කර ඇති යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ඇ) පිට පැත්තෙහි ඇති මුද්‍රිත අංකය හැර, ඡන්ද දායකයා හඳුනා ගත හැකි යම් දෙයක් ලියන ලද හෝ ලකුණු කරන ලද යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ඈ) ලකුණු නොකරන ලද යම් ඡන්ද පත්‍රිකාවක් ; හෝ

(ඉ) අවිනිශ්චිත භාවය නිසා අවලංගු වන්නා වූ යම් ඡන්ද පත්‍රිකාවක්

ගණන් කිරීමේ නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය. එවැනි යම් ඡන්ද පත්‍රිකාවක "ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන ගණන් කිරීමේ නිලධරයා විසින් පිටසන් කළ යුතු ය.

(2) ඡන්ද පත්‍රිකාවක් මත යොදා ඇති යම් ලකුණකින් ඡන්ද දායකයාගේ ඡන්දය දීමේ චේතනාවක්, ඔහු විසින් ඡන්දය දෙනු ලබන පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායමක් පැහැදිලිව දැක්වෙන බවට ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඡන්දදායකයාගේ මග පෙන්වීම සඳහා මේ පනතේ තුන්වන උපලේඛනයේ දී ඇති උපදෙස්වලට සෑම අන්දමකින් ම අනුකූලව ඡන්ද පත්‍රිකාව ලකුණු කොට නොතිබීමේ හේතුව නිසාම පමණක් ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ ඡන්ද පත්‍රිකාව (1) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

(3) ඡන්ද පත්‍රිකාවක් ව්‍යාජ හෝ කූට ඡන්ද පත්‍රිකාවක් නොවන බවට ගණන් කිරීමේ නිලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, නිල ලකුණින් මුද්‍රා තබා හෝ සිදුරු කර නොතිබීමේ හේතුව නිසාම පමණක් ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ ඡන්ද පත්‍රිකාව ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය. මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප නොකිරීමට නිරණය කිරීමට පෙර ගණන් කිරීමේ නිලධරයා විසින්, ගණන් කිරීමේ නියෝජිතයන් පැමිණ සිටින්නේ නම් ඒ එක් එක් නියෝජිතයාට එය පෙන්වා ඒ පිළිබඳව ඔහුගේ අදහස්වලට සවන් දිය යුතු ය.

(4) ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කිරීමට පෙර ගණන් කිරීමේ නිලධරයා විසින්, ඡන්ද පත්‍රිකාවේ පිටුපස මුද්‍රණය කොට ඇති අංකය යම් තැනැත්තකු දැකීම වළක්වාලීම සඳහා නිසි සියලු පූර්වෝපාය යන් යොදා ගණන් කිරීමේ නියෝජිතයන් පැමිණ සිටින්නේ නම් ඒ එක් එක් නියෝජිතයාට එය පෙන්වා ඒ පිළිබඳව ඔහුගේ අදහස් වලට සවන් දිය යුතු ය.

(5) ගණන් කිරීමේ නිලධරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද යම් ඡන්ද පත්‍රිකාවක් ඔහු විසින් ගණන් කරනු නොලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තියෙහි සඳහන් එක් එක් හේතුව යටතේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා ගණන වෙන වෙන ම දක්වෙන ප්‍රකාශයක් ගණන් කිරීමේ නිලධරයා විසින් පිළියෙල කළ යුතු අතර යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ ඉල්ලීම පිට ඒ ප්‍රකාශය පිටපත් කර ගැනීමට ඔහුට ඉඩ දිය යුතු ය.

(7) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට හා ස්වාධීන කණ්ඩායමට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳව වචනයෙන් මෙන්ම ඉලක්කමෙන් වූ ලිඛිත ප්‍රකාශයක් ගණන් කිරීමේ නිලධරයා විසින් පිළියෙළ කළ යුතු ය. ඒ ප්‍රකාශය ගණන් කිරීමේ නිලධරයා විසින් සහතික කරනු ලැබිය යුතු අතර ඔහුගේ සහායකයන් හෝ ලිපිකරුවන් අතුරින් එක් කෙනකු විසින් ද පැමිණ සිටින හා අත්සන් කිරීමට කැමැත්තක් දක්වන යම් පක්ෂයක හෝ කණ්ඩායමක ගණන් කිරීමේ නියෝජිතයන් විසින් ද ඊට සාක්ෂි වශයෙන් අත්සන් තබනු ලැබිය යුතු ය. යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ ඉල්ලීම පිට ඒ ප්‍රකාශය පිටපත් කර ගැනීමට ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ නියෝජිතයාට ඉඩ දෙනු ලැබිය යුතු ය.

(8) ගණන් කිරීමේ නිලධරයා විසින් (7) වන උපවගන්තියෙ සඳහන් ලිඛිත ප්‍රකාශය පිළියෙළ කිරීමට පෙර, අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන නැවත ගණන් කිරීම් යම් සංඛ්‍යාවක් ඔහු විසින් කරනු ලැබිය හැකි ය; ගණන් කිරීමේ නියෝජිතයකුගේ ඉල්ලීම පිට නැවත ගණන් කිරීමක් හෝ නැවත ගණන් කිරීම් කරනු ලැබිය යුතු ය; එසේ වුව ද යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ හෝ සියලුම ගණන් කිරීමේ නියෝජිතයන්ගේ ඉල්ලීම පිට එසේ කරනු ලැබිය යුතු උපරිම නැවත ගණන් කිරීම් සංඛ්‍යාව දෙකක් නොඉක්මවිය යුතු ය.

(9) යම් ඡන්ද පත්‍රිකාවක් පිළිබඳව පැන නැගෙන යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ගණන් කිරීමේ නිලධරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

50 වන සහ 51 වන වගන්ති යටතේ වූ බලතල, කාර්ය හා කර්තව්‍ය සම්බන්ධයෙන් අදාළ විශේෂ විධිවිධාන.

52. 50 වන වගන්තිය හෝ 51 වන වගන්තිය යටතේ ගණන් කිරීමේ නිලධරයකු සතු යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ඒ නිලධරයාගේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ ක්‍රියා කරන ඔහුගේ සහායකයන්ගෙන් හෝ ලිපිකරුවන්ගෙන් යම් කෙනකු විසින්, ඒ නිලධරයා සඳහා සහ ඔහු වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

**53.** යම් ගණන් කිරීමේ මධ්‍යස්ථානයක ගණන් කිරීම අවසන් කරනු ලැබූ විට, ගණන් කිරීමේ නිලධරයා විසින්—

ගණන් කිරීම අවසන් කිරීම.

(අ) ගණන් කරන ලද ඡන්ද පත්‍රිකා ;

(ආ) ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා ;

(ඇ) ද්විත්ව ඡන්ද පත්‍රිකා ;

(ඈ) ඡන්ද පත්‍රිකා විස්තරය ;

(ඉ) 45 (1) වන වගන්තියේ (ඈ) ඡේදයේ සිට (ඊ) ඡේදය තෙක් වූ ඡේදවල සඳහන් පැකැට්ටු ;

(ඊ) 50 වන වගන්තියේ (2) (ආ) උපවගන්තිය යටතේ වූ ගණන් කිරීම පිළිබඳ වාර්තාව ;

(උ) 51 (6) වන වගන්තිය යටතේ වූ ප්‍රකාශය ; සහ

(ඌ) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳව 51 (7) වන වගන්තිය යටතේ වූ ලිඛිත ප්‍රකාශය

මුද්‍රා තබන ලද පැකැට්ටුවල බහා තේරීම් භාර නිලධරයා වෙත නොපමාව භාර දිය යුතු ය.

**54.** යම් සංවර්ධන සභා ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ තැපැල් ඡන්ද පත්‍රිකා මේ පනතේ දෙවන උපලේඛනයෙහි දක්වා ඇති තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝගවලට අනුකූලව තේරීම් භාර නිලධරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වෙනම ඇති ගණන් කිරීමේ මධ්‍යස්ථානයක දී හෝ මධ්‍යස්ථාන ගණනක දී ගණන් කරනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කිරීම.

**55.** තේරීම් භාර නිලධරයා විසින් ඡන්ද විමසීමක ප්‍රතිඵල ප්‍රකාශ කිරීමට කටයුතු කිරීමට පෙර ඔහු විසින්, ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලබන වේලාව සහ ස්ථානය පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක් ඒ ඡන්ද විමසීම තරග කරන දේශපාලන පක්ෂයක ලේකම්ට හෝ බලයලත් නියෝජිතයාට හෝ ස්වාධීන කණ්ඩායමක කණ්ඩායම් නායකයාට දෙනු ලැබිය යුතු ය.

ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම හා සම්බන්ධ දැන්වීම.

**56.** යම් සංවර්ධන සභාවක් සඳහා වූ යම් ඡන්ද විමසීමකට අපේක්ෂකයන් නාම යෝජනා කර ඇති එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින්, ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ කටයුතුවල දී පැමිණ සිටීම සඳහා නියෝජිතයන් දෙදෙනකුට නොවැඩි ගණනක් පත් කරනු ලැබිය හැකි ය. පත් කරන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපින ප්‍රකාශ කරන ඒ පත්වීම් පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක් ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ එහි බලයලත් නියෝජිතයා විසින් නැතහොත් කණ්ඩායම් නායකයා විසින්, ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු ආරම්භ වීමට පෙර තේරීම් භාර නිලධරයා වෙත දෙනු ලැබිය යුතු ය. යම් නියෝජිතයකුගේ නම සහ ලිපිනය එසේ දැනුම් දී නොමැත්තේ ද ඒ නියෝජිතයා ඒ කටයුතු කෙරෙන ස්ථානයට ඇතුළු කර ගැනීමට තේරීම් භාර නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලබන අවස්ථාවේ දී පැමිණ සිටීම සඳහා නියෝජිතයන් පත් කිරීම.

ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලබන අවස්ථාවේ දී පැමිණ සිටීමට හිමිකම් ඇති තැනැත්තෝ.

**57.** තේරීම් භාර නිලධරයාගේ කැමැත්ත ඇතිව මිස, තේරීම් භාර නිලධරයා ද ඔහුට සහාය වීමට පත් කර ඇති තැනැත්තන් ද, 56 වන වගන්තිය යටතේ පත් කරන ලද නියෝජිතයන් ද හැර, වෙනත් කිසිම තැනැත්තකුට ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේ දී පැමිණ සිටිය නොහැකි ය.

ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම.

**58.** (1) (අ) 53 වන වගන්තියේ සඳහන් ලේඛන ලැබුණු පසු තේරීම් භාර නිලධරයා විසින් තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලැබූ ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ හෝ මධ්‍යස්ථානවල ගණන් කිරීමේ නිලධරයන් ද ඇතුළු සියලු ම ගණන් කිරීමේ නිලධරයන් විසින් 51 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ තමා වෙත සපයන ලද ප්‍රකාශවලින් එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට සහ ස්වාධීන කණ්ඩායමට දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව එකතු කොට නිශ්චය කළ යුතු ය. 53 වන වගන්තියේ (උ) ඡේදයේ සඳහන් මුද්‍රා තබන ලද පැකැට්ටුවක් විවෘත කිරීමට පෙර, 56 වන වගන්තිය යටතේ පත් කරන ලද නියෝජිතයකු විසින් ඉල්ලා සිටි විට, ඒ පැකැට්ටුවේ මුද්‍රා පරීක්ෂා කිරීමට තේරීම් භාර නිලධරයා විසින් ඒ නියෝජිතයාට අවසර දිය යුතු ය.

(ආ) ඡන්ද විමසීමේ දී දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාවෙන් අටෙන් එකකට අඩු ඡන්ද සංඛ්‍යාවක් ලැබූ සෑම පිළිගත් දේශපාලන පක්ෂයක් ම සහ ස්වාධීන කණ්ඩායමක් ම, සංවර්ධන සභාවේ සභිකයන් වශයෙන් කවර හෝ අපේක්ෂකයකු තෝරා පත් කරවා ගැනීමට සුදුසුකම් නොලබන්නේ ය.

(ඇ) සුදුසුකම් නොලැබූ දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වේ නම්, ඒ පක්ෂ සහ කණ්ඩායම් විසින් ලැබූ ඡන්ද සංඛ්‍යාව ඒ ඡන්ද විමසීමේ දී දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාවෙන් අඩු කිරීමෙන් පසු ඉතිරි ඡන්ද සංඛ්‍යාව මෙහි මින් මතු "අදාළ ඡන්ද සංඛ්‍යාව" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(ඈ) අදාළ ඡන්ද සංඛ්‍යාව, තෝරා පත් කර ගත යුතු සභික සංඛ්‍යාවෙන් බෙදිය යුත්තේ ය. එම බෙදීමේ ප්‍රතිඵලය වන පූර්ණ සංඛ්‍යාව (ඉතිරිව ඇති යම් ඡන්ද සංඛ්‍යාවක් ගණන් නොගෙන) මෙහි මින් මතු "සම්ප්‍රයුක්ත සංඛ්‍යාව" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(ඉ) ((ආ) ඡේදය යටතේ සුදුසුකම් නොලැබූ දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හැර) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම ලැබූ ඡන්ද සංඛ්‍යාව එසේ වැඩිම ඡන්ද සංඛ්‍යාව ලැබූ පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් ආරම්භ කොට සම්ප්‍රයුක්ත සංඛ්‍යාවෙන් බෙදිය යුත්තේ ය. ඒ පක්ෂය හෝ කණ්ඩායම ලැබූ ඡන්ද සංඛ්‍යාව සම්ප්‍රයුක්ත සංඛ්‍යාවෙන් බෙදීමෙන් ලැබෙන පූර්ණ සංඛ්‍යාවට සමාන අපේක්ෂකයන් සංඛ්‍යාවක් නාම යෝජනා පත්‍රයෙහි ඔවුන්ගේ නම් දැක්වෙන අනුපිළිවෙළ අනුව, ඒ එක් එක් පක්ෂයෙන් සහ කණ්ඩායමෙන් තෝරා පත්කර ගන්නා ලදැයි තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුත්තේ ය. එසේ බෙදීමෙන් පසු ශේෂ වන යම් ඡන්ද සංඛ්‍යාවක් වේ නම් ඒ ඡන්ද සංඛ්‍යාව සම්බන්ධයෙන්, අවශ්‍ය වෙතොත්, (ඊ) ඡේදය යටතේ ක්‍රියා කළ යුත්තේ ය.

(ඊ) (ඉ) ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිදි සභිකයන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් පසුව තවත් එක් සභිකයකු හෝ ඊට වැඩි සභිකයන් සංඛ්‍යාවක් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කිරීමට ඇති විට, (ඉ) ඡේදය යටතේ සභිකයන් තෝරා පත් කිරීම ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, එක් එක් පක්ෂයේ හෝ කණ්ඩායමේ වාසියට ඇති, (ඉ) ඡේදයෙහි සඳහන්, ශේෂ වූ ඡන්ද සංඛ්‍යාව මත හා (ඉ) ඡේදය යටතේ එකද අපේක්ෂකයකුවත් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබ නොමැති යම්කිසි දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායමක් හෝ විසින් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යාව මත, තෝරා පත් කර ගත යුතු මුළු සභික සංඛ්‍යාව තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරන තෙක්, එවැනි ඡන්ද වැඩිම සංඛ්‍යාවක් ඇති පක්ෂයේ හෝ කණ්ඩායමේ නාම යෝජනා පත්‍රයෙහි ප්‍රමුඛත්ව අනුපිළිවෙළ අනුව, ඊළඟට නම සඳහන් අපේක්ෂකයා ඊළඟ සභිකයා වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කිරීමෙන්, යථාකාරයෙන්, හෝ එකී සභිකයා නැතහොත් සභිකයන් සංඛ්‍යාව තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කළ යුතු ය.

(උ) සංවර්ධන සභාවක සියලු ම සභිකයන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, උපරිම ඡන්ද සංඛ්‍යාවක් දෙනු ලැබූ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නාම යෝජනා පත්‍රයෙහි පළමුව නම සඳහන් අපේක්ෂකයා ඒ සංවර්ධන සභාවේ සභාපතිවරයා වශයෙන් තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(2) ඡන්ද විමසීමක් තරඟ කරන, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් හෝ ලැබූ මුළු ඡන්ද සංඛ්‍යාව (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් සම්ප්‍රයුක්ත සංඛ්‍යාවට අඩු නම්, වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලැබූ දේශපාලන පක්ෂයට හෝ කණ්ඩායමට ඒ පක්ෂයේ හෝ කණ්ඩායමේ නාම යෝජනා පත්‍රයෙහි පළමුවෙන් ම නම සඳහන් අපේක්ෂකයා තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරවා ගැනීමට හිමිකම් ඇත්තේ ය. තවත් එක් සභිකයකු හෝ ඊට වැඩි සභිකයන් සංඛ්‍යාවක් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කිරීමට ඉතිරිව ඇත් නම්, ඊළඟ වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබා ඇති පක්ෂයට හෝ කණ්ඩායමට ඒ පක්ෂයේ හෝ කණ්ඩායමේ නාමයෝජනා පත්‍රයෙහි පළමුවෙන් ම නම සඳහන් අපේක්ෂකයා තෝරා පත් කර ගන්නා ලදැ යි ප්‍රකාශයට පත් කරවා ගැනීමට හිමිකම ඇත්තේ ය. ඒ සංවර්ධන සභාව සඳහා තෝරා පත් කළ යුතු මුළු සභික සංඛ්‍යාව තෝරා පත් කර ගන්නා ලදැයි මේ උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන තෙක් එසේ අනුපිළිවෙළින් ප්‍රකාශයට පත් කර ගෙන යා යුත්තේ ය.

(3) පිළිගත් දේශපාලන පක්ෂ දෙකක් හෝ වැඩි ගණනක් නැතහොත් ස්වාධීන කණ්ඩායම් දෙකක් හෝ වැඩි ගණනක් නැතහොත් ඒ පක්ෂ හා කණ්ඩායම් එකක හෝ වැඩි ගණනක සංයුක්තයක් (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ ලැබූ ඡන්ද සංඛ්‍යාවෙහි සමානත්වයක් පවත්නා අවස්ථාවක එක ඡන්දයක් එකතු කිරීමෙන් ඒ එක් පක්ෂයක හෝ කණ්ඩායමක හෝ අපේක්ෂකයා තෝරා පත් කර ගනු ලැබීමට හිමිකම් ලැබෙන විට ඒ වැඩිපුර ඡන්දය දෙන ලදැයි සැලකිය යුත්තේ කිනම් පක්ෂයට ඇයි නැත

හොත් කණ්ඩායමට දැයි නිශ්චය කිරීම තේරීම් භාර නිලධරයා විසින් ස්වකීය පරම අභිමතය පරිදි නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් ඔහු ඉදිරිපිට දී කුසපත් ඇදීමෙන් කළ යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා යම් ඡන්ද විමසීමක දී දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව සැබැවින්ම ගණන් කරනු ලැබූ ඡන්ද සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු අතර, ශුන්‍ය ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබූ යම් ඡන්ද එයට ඇතුළත් නොවිය යුතු ය.

(5) පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රයෙහි නම් ඇතුළත් තැනැත්තන්ගේ ප්‍රමුඛත්ව අනුපිළිවෙළ, මේ වගන්තියේ මෙයට ඉහතින් ඇති විධිවිධාන යටතේ යම් සංවර්ධන සභාවක් සඳහා සියලු සභිකයන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, කලින් කල වෙනස් කිරීමට ද මිය ගොස් ඇති හෝ ඒ පක්ෂයෙහි සාමාජිකයන්ව සිටීම අවසන් වී ඇති හෝ තැනැත්තන් වෙනුවට වෙනත් තැනැත්තන්ගේ නම් ආදේශ කිරීමට ද ඒ පක්ෂයට අයිතිය ඇත්තේ ය.

58 වන වගන්තිය යටතේ දී ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය සම්බන්ධයෙන් අදාළ විශේෂ විධිවිධාන.

**59.** 58 වන වගන්තිය යටතේ තේරීම් භාර නිලධරයකු සතු යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ඒ නිලධරයාගේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ ක්‍රියා කරන ඔහුගේ සහායකයන්ගෙන් හෝ ලිපිකරුවන්ගෙන් යම් කෙනකු විසින් ඒ නිලධරයා සඳහා ඔහු වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

ප්‍රතිඵල ගැසට් පත්‍රයේ පළ කිරීම.

**60.** තේරීම් භාර නිලධරයා විසින් ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් පසු නොපමාව ම, මේ පනතේ පළමුවන උපලේඛනයේ "ඕ" ආකෘතියට සාරානුකූල වූ වාර්තාවක් කොමසාරිස්වරයා වෙත සපයනු ලැබිය යුතු අතර, එසේ තෝරා පත් කර ගන්නා ලද සභිකයන්ගේ නම් සහ සභාපතිවරයාගේ නම, කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

ඡන්ද පත්‍රිකා බැහැර කිරීම.

**61.** (1) 53 වන වගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද පැකැට්ටු සහ සියලු ලේඛන ඒවා ලැබුණු දින සිට ගණන් ගනු ලබන මාස හයක කාලයක් සඳහා තේරීම් භාර නිලධරයා විසින් තබා ගත යුතු අතර, ඉතික්බිතිව කොමසාරිස්වරයා විසින් අන්‍යාකාරයෙන් විධාන කරතහොත් මිස, තේරීම් භාර නිලධරයා විසින් ඒ පැකැට්ටු සහ ලේඛන විනාශ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(2) මේ පනතින් නියම කර ඇති පරිදි මුද්‍රා තබා ඇති ඡන්ද විමසීම හා සම්බන්ධ යම් ඡන්ද පත්‍රිකාවක් හෝ වෙනත් ලේඛනයක්, අවස්ථාවෝචිත යයි අභියාචනාධිකරණය විසින් සලකනු ලබන යම් වේලාවක දී සහ ස්ථානයක දී සහ අවස්ථාවෝචිත යයි ඒ අධිකරණය සලකනු ලබන යම් කොන්දේසිවලට යටත්ව පරීක්ෂා කරන ලෙස පිටපත් කරන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස ඒ අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය. එහෙත්, ඒ පරීක්ෂා කිරීම, පිටපත් කිරීම හෝ ඉදිරිපත් කිරීම ඡන්ද විමසීම හා සම්බන්ධ නඩුවක් හෝ වෙනත් යම් නඩු කටයුතු පැවැරීමේ හෝ පවත්වාගෙන යාමේ කාර්යය සඳහා අවශ්‍ය බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම් මිස

එවැනි ආඥාවක් කරනු නො ලැබිය යුතු ය. එවැනි යම් ඡන්ද පත්‍රිකාවක් හෝ ලේඛනයක් තේරීම් භාර නිලධරයාගේ භාරයේ තිබෙන අතරතුර ඒ ඡන්ද පත්‍රිකාව හෝ ලේඛනය, ඉහත කී පරිදි හැර, පරීක්ෂා කිරීමට කිසිම තැනැත්තකුට ඉඩ දෙනු නොලැබිය යුතු ය.

## V වන කොටස

### පුරප්පාඩු පිරවීම

සභික ධුරය අත් හැරීම.

62. (1) මේ පනතේ 9 වන වගන්තියේ හෝ 63 වන වගන්තියේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් හෝ 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ විධිවිධාන ක්‍රියාත්මකවීමේ හේතුවෙන් සංවර්ධන සභාවක යම් සභිකයකු ඒ සභාවේ සභිකයකු ලෙස අසුන් ගැනීමට හෝ එහි දී ඡන්දය දීමට නුසුදුස් සකු වන අවස්ථාවක, ඒ හේතුවෙන් ම, ඔහුගේ අසුන හෝ ධුරය හිස් වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ හේතුවෙන් සංවර්ධන සභාවක සභිකයකුගේ අසුන හෝ ධුරය හිස් වූ අවස්ථාවක, ඒ හිස් වූ අසුන හෝ ධුරය පිරවීමේ කාර්යය සඳහා මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක සාමාජිකයකු වීම අවසන් වීම මත ධුරය හිස් වීම.

63. (1) සංවර්ධන සභාවක සභිකයකු, ඔහු එසේ සභිකයකු වූ අවස්ථාවේ දී ඔහුගේ නම ඇතුළත් වූයේ යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නාමයෝජනා පත්‍රයේ ද ඒ දේශපාලන පක්ෂයේ හෝ කණ්ඩායමේ සාමාජිකයකුව සිටීම, ඉල්ලා අස්වීමෙන් හෝ පහ කිරීමෙන් හෝ අන් හේතුවක් නිසා හෝ අවසන් වූ අවස්ථාවක, ඔහු එසේ සාමාජිකයකුව සිටීම අවසන් වූ දින සිට එක් මාසයක කාලසීමාවක් ඉකුත් වූ විට, ඔහුගේ අසුන හිස් වන්නේ ය :

එසේ වුවද සංවර්ධන සභාවක සභිකයකු පහකරනු ලැබූ අවස්ථාවක ඉහත කී මාසයක කාල සීමාව ඉකුත් වීමට පෙර ඔහු අභියාචනාධිකරණය වෙත ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින් ඉල්ලීමක් කළහොත් සහ ඒ පහකිරීම වලංගු නොවන බව ඒ ඉල්ලීම මත අභියාචනාධිකරණය විසින් තීරණය කළහොත් ඔහුගේ අසුන හිස් නොවන්නේ ය. ඒ පෙත්සම මහාධිකරණයේ විනිශ්චයකාරවරයන් තිදෙනකු විසින් විභාග කළ යුතු අතර, ඒ පෙත්සම ඉදිරිපත් කළ තැන් පටන් මාස දෙකක කාල සීමාවක් ඇතුළත, අභියාචනාධිකරණයේ තීරණය දෙනු ලැබිය යුත්තේ ය. ඒ පහකිරීම වලංගු බව අභියාචනාධිකරණය විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, ඒ තීරණයේ දිනයේ සිට ඒ පුරප්පාඩුව ඇති විය යුතු ය.

(2) සංවර්ධන සභාවක සභිකයකුගේ අසුන, (1) වන උපවගන්තිය හෝ මේ පනතේ 9 වන වගන්තිය හෝ 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ විධිවිධාන හෝ ක්‍රියාත්මක වීමෙන් හිස් වූ අවස්ථාවක, (තෝරා පත් කර ගනු ලැබුවේ යයි කලින් ප්‍රකාශයට පත් කරන ලද යම් තැනැත්තන්ගේ නම් හැර) අවස්ථාවෝචිත පරිදි, පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ හෝ නාම

යෝජනා පත්‍රයෙහි ප්‍රමුඛත්ව අනුපිළිවෙළ අනුව පළමුවෙන් ම නම සඳහන් තැනැත්තා, ඒ පුරප්පාඩුව පිරවීම පිණිස තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කළ යුත්තේ ය.

ධුරය අත්හරිනු ලැබීමෙන් පසු සභිකයකු වශයෙන් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

64. 62 වන වගන්තියේ හෝ 63 වන වගන්තියේ විධිවිධාන යටතේ ස්වකීය අසුන හෝ ධුරය හිස් වීමෙන් පසු යම් සංවර්ධන සභාවක සභික ධුරයෙහි දැන දැන ම කටයුතු කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, සභිකයකු වශයෙන් ඔහු එසේ කටයුතු කරන එක් එක් දිනය වෙනුවෙන් රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට ඒ සෑම තැනැත්තකු ම යටත් විය යුතු ය.

පුරප්පාඩුව පිරවීම.

65. (1) මිය යාම, ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා සංවර්ධන සභාවක සභිකයකුගේ ධුරය හිස් වන අවස්ථාවක, ඒ පුරප්පාඩුව ඇතිවීම පිළිබඳ කාරණය දිසා ලේකම් විසින් සංවර්ධන සභා ප්‍රදේශයේ තේරීම් භාර නිලධරයා වෙත දනුම් දෙනු ලැබිය යුතු ය. තේරීම් භාර නිලධරයා විසින් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයාගේ ධුරය හිස් වුවහොත්, ධුරය හිස් කළ සභාපතිවරයා අයත් වූයේ යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ද, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නාමයෝජනා පත්‍රයෙහි ධුරය හිස් කළ ඒ සභාපතිවරයාගේ නමට ඉක්බිතිව ම නම සඳහන්ව ඇති සභිකයා සභාපතිවරයා වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(3) මියයාම, ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා සභිකයකුගේ ධුරය හිස් වුවහොත්, ධුරය හිස් කළ සභිකයා අයත් වූයේ යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ද, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නාම යෝජනා පත්‍රයෙහි තෝරා පත්කර ගන්නා ලද අන්තිම සභිකයාගේ නමට ඉක්බිතිව ම නම සඳහන්ව ඇති අපේක්ෂකයා සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය යටතේ සභාපතිවරයා හෝ අපේක්ෂකයකු තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු තේරීම් භාර නිලධරයා විසින් මේ පනතේ පළමුවන උපලේඛනයෙහි දක්වා ඇති "ඕ" ආකෘතියට සාරානුකූල වාර්තාවක් කොමසාරිස්වරයා වෙත නොපමාව යැවිය යුතු අතර, එසේ තෝරා පත් කර ගන්නා ලද බව ප්‍රකාශයට පත් කරනු ලැබූ සභාපතිවරයාගේ නම හෝ සභිකයාගේ හෝ සභිකයන්ගේ නම හෝ නම් කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(5) සංවර්ධන සභා ප්‍රදේශයක් වෙනුවෙන් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍රයෙහි නම් දක්වෙන සියලුම අපේක්ෂකයන් තේරී පත්වීම නිසා හෝ අන්‍යාකාරයකින් අවසන් වී ඇති හා

ඉන් පසුව ඒ පක්ෂය හෝ කණ්ඩායම විසින් නාමයෝජනා කරන ලද සාමාජිකයකුගෙන් පිරවිය යුතු පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක, අසුන හිස් කළ සභිකයා අයත්ව සිටි පක්ෂයේ හෝ කණ්ඩායමේ නාමයෝජනා පත්‍රයෙහි ඒ පුරප්පාඩුව පිරවීමට තෝරා පත් කර ගන්නා ලද බව ප්‍රකාශයට පත් කිරීම සඳහා අපේක්ෂකයකු ඉතිරිවී නොමැති බව ඒ සංවර්ධන සභා ප්‍රදේශයේ තෝරීම් භාර නිලධරයා විසින් කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතු ය.

(6) ඒ තොරතුරු ලැබුණු විට, ආසනය හිස් කළ සභිකයා අයත් වූයේ යම් පිළිගත් දේශපාලන පක්ෂයකට ද නැතහොත් ස්වාධීන කණ්ඩායමකට ද, ඒ දේශපාලන පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමෙන් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සාමාජිකයකු නාම යෝජනා කරන ලෙස ඒ පක්ෂයේ ලේකම්ට හෝ කණ්ඩායමේ නායකයාට කොමසාරිස්වරයා විසින් නියම කළ යුතු ය. ඒ නාම යෝජනාව ලැබුණු විට, ඒ පුරප්පාඩුව ඇති වූයේ යම් සංවර්ධන සභාවක් සම්බන්ධයෙන් ද ඒ සංවර්ධන සභාව සඳහා ඒ තැනැත්තා සභිකයකු ලෙස කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කර, එසේ ප්‍රකාශයට පත් කරනු ලැබූ සභිකයාගේ නම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට ඔහු විසින් සැලැස්විය යුතු ය.

## VI වන කොටස

## වැරදි

66. (අ) යම් නාමයෝජනා පත්‍රයක් කූට ලෙස පිළියෙළ කරන හෝ වංචනික ලෙස විරූප කරන හෝ වංචනික ලෙස විනාශ කරන, නැතහොත් කූට ලෙස පිළියෙළ කළ නාමයෝජනා පත්‍රයක් බව දැන දැනම යම් නාම යෝජනා පත්‍රයක් තෝරීම් භාර නිලධරයාට භාර දෙන ; හෝ

නාමයෝජනා පත්‍ර, ඡන්ද පත්‍රිකා සහ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා ආදිය හා සම්බන්ධ වැරදි.

(ආ) යම් ඡන්ද පත්‍රිකාවක් හෝ යම් ඡන්ද පත්‍රිකාවක වූ නිල ලකුණක් කූට ලෙස පිළියෙළ කරන හෝ එහි ව්‍යාජ අනුකරණයක් කරන හෝ එය වංචනික ලෙස විරූප කරන හෝ වංචනික ලෙස විනාශ කරන ; හෝ

(ඇ) නිසි බලය නොමැතිව යම් ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තකු වෙත සපයන ; හෝ

(ඈ) යම් ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තකුට විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් වන නැතහොත් යම් ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තකුගෙන් මිල දී ගන්නා හෝ මිල දී ගැනීමට ඉදිරිපත් වන ; හෝ

(ඉ) මේ පනත අනුව නිල ලකුණ යොදා ඇති යම් ඡන්ද පත්‍රිකාවක් තම සන්තකයෙහි තබා ගැනීමට මේ පනතේ හිමිකම් ලත් තැනැත්තකු නොවී සිටිය දී එවැනි යම් ඡන්ද පත්‍රිකාවක් තම සන්තකයෙහි තබා ගෙන සිටින ; හෝ

(ඊ) ඡන්ද පෙට්ටියක් තුළ බහාලීමට නීතියෙන් නාමාව බලය පැවරී ඇති ඡන්ද පත්‍රිකාව නොවන වෙනත් යමක් යම් ඡන්ද පෙට්ටියක් තුළ බහාලන ; හෝ

(උ) නිසි බලය නොමැතිව යම් ඡන්ද පත්‍රිකාවක් යම් ඡන්ද පොළකින් පිටතට ගෙන යන හෝ ඡන්ද පොළකින් පිටත දී යම් ඡන්ද පත්‍රිකාවක් තම සන්තකයෙහි තිබී හසුවන ; හෝ

(ඌ) ඡන්ද විමසීමක කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කොට ඇති යම් ඡන්ද පෙට්ටියක් හෝ ඡන්ද පත්‍රිකා පැකැට්ටුවක් නිසි බලය නොමැතිව විනාශ කරන, ලබා ගන්නා, විවෘත කරන හෝ අන්‍යාකාරයකින් ඊට යමක් කරන ; හෝ

(එ) යම් ඡන්ද විමසීමක දී යම් ඡන්ද පත්‍රිකාවක් නැත හොත් ඡන්ද පත්‍රිකාවක් ලෙස සැලකෙන හෝ පාවිච්චි කළ හැකි කිසිවක් නිසි බලය නොමැතිව මුද්‍රණය කරන ; හෝ

(ඒ) යම් ඡන්ද විමසීමක දී, ඡන්ද විමසීම පවත්වනු ලබන අතරතුර ඡන්ද පෙට්ටියක් තුළ බහාලනු ලැබීමෙන් පසු ඡන්ද පත්‍රිකාවක් ඉවතට ගැනීමට, විකෘත කිරීමට හෝ වංචනික ලෙස වෙනස් කිරීමට උපයෝගී කර ගත හැකි යම් උපකරණයක්, සූත්‍රයක් හෝ යන්ත්‍රයක් ඡන්ද විමසීමේ කාර්යය සඳහා සාදන, තනන, ජනරජයට ආනයනය කරන, තම සන්තකයෙහි තබා ගන්නා, සපයන හෝ පාවිච්චි කරන නැතහොත් ඡන්ද විමසීමක කාර්යය සඳහා එය සෑදීමට, තැනීමට, ජනරජයට ආනයනය කිරීමට, සැපයීමට හෝ පාවිච්චි කිරීමට සලස්වන ; හෝ

(ඔ) මේ පනත යටතේ තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන යම් ඉල්ලීමක හෝ මේ පනතේ දෙවන උපලේඛනයෙහි දක්වා ඇති තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝග යටතේ තමා වෙත එවන් ලද යම් අනන්‍යතා ප්‍රකාශයක හිතාමතාම අසත්‍ය ප්‍රකාශයක් කරන ; හෝ

(ඕ) මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති තැපැල් ඡන්දදායකයන් පිළිබඳ නියෝගවල අර්ථානුකූල වූ තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම පිණිස කරනු ලබන යම් ඉල්ලීමක් හෝ යම් අනන්‍යතා ප්‍රකාශයක් හෝ යම් ආවරණ ලියුම් කවරයක් හෝ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් නිසි බලය නොමැතිව විනාශ කරන, ලබා ගන්නා, විවෘත කරන හෝ අන්‍යාකාරයකින් එයට අයුතු දෙයක් කරන නැතහොත් එයට යමක් කරන ; හෝ

(ක) යම් ඡන්ද විමසීමක දී යම් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් නැතහොත් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් ලෙස සැලකෙන හෝ පාවිච්චි කළ හැකි කිසිවක් නිසි බලය නොමැතිව මුද්‍රණය කරන ; හෝ

(ග) යම් ඡන්ද විමසීමක දී යම් ඡන්දදායකයකුට උචිත ලකුණක් හෝ ඒ ලකුණ වශයෙන් සැලකෙන හෝ වරදවා තේරුම් ගනු ලැබිය හැකි කිසිවක් නිසි බලය නොමැතිව තබන ; හෝ

(ච) යම් ඡන්ද විමසීමක දී යම් ඡන්දදායකයකු සම්බන්ධයෙන් තබන ලද උචිත ලකුණක් නිසි බලය නොමැතිව වංචනික ලෙස විරූප කරන ; හෝ

(ජ) ඡන්දය දීමට තමාට නීත්‍යනුකූලව නොහැකි බව හෝ ඡන්දය දීමට තමා නුසුදුස්සකුව සිටින බව දැන දැනම යම් ඡන්ද විමසීමක දී ඡන්දය දෙන

සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය. තව ද, වරදකරු කරනු ලැබීම හේතු කොටගෙන, වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු හතක කාලයක් සඳහා මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචිවීම හෝ ඡන්දය දීම හෝ සංවර්ධන සභාවක සභිකයකු ලෙස තේරී පත්වීම කළ නොහැකි විය යුතු අතර වරදකරු කරනු ලැබූ දිනයෙහි දී ඔහු සංවර්ධන සභාවක සභිකයකු ලෙස තේරී පත්ව සිටියහොත් එසේ වරදකරු කරනු ලැබූ දින සිට ඔහු තම තේරී පත්වීම අත්හල යුතු ය.

67. (1) යම් තැනැත්තකු— ඇතැම් තැනැත්තන් විසින් ඡන්දය දීමට නුසුදුසු බව.

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 38 දරන පළාත් පාලන ආයතන (ප්‍රජා අශක්තුතා නියම කිරීමේ) (අංක 1) පනතෙහි හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 39 දරන පළාත් පාලන (ප්‍රජා අශක්තුතා නියම කිරීමේ) (අංක 2) පනතෙහි දක්වා ඇති නුසුදුසුකම්වලට යටත් වන්නා වූ තැනැත්තකු නම් ;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතයක් මගින් තමා සම්බන්ධයෙන් ප්‍රජා අශක්තුතා නියම කර ඇත්තා වූ ද ඒ යෝජනා සම්මතයෙහි නියම කර ඇති එකී ප්‍රජා අශක්තුතා කාල සීමාව ඉකුත් වී නොමැති තැනැත්තකු නම්

මේ පනත යටතේ ඡන්ද විමසීමක දී ඡන්දය දෙනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයේ දී ඇතැම් ක්‍රියා තහනම් බව.

68. (1) ඡන්ද පොළක ඡන්ද විමසීමක් පවත්වනු ලබන යම් දිනයක ඒ ඡන්ද පොළ සීමාව ඇතුළත හෝ ඡන්ද පොළට ඇතුළු වන ස්ථානයේ සිට කිලෝ මීටර භාගයක දුරක් ඇතුළත කිසිම තැනැත්තකු විසින්, පහත දැක්වෙන ක්‍රියා අතුරින් කිසිවක් නොකළ යුතු ය :—

(අ) ඡන්ද ආයාචනය කිරීම ;

(ආ) යම් ඡන්ද හිමියකුගේ ඡන්දය ඉල්ලීම ;

(ඇ) යම් නිශ්චිත පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය නොදෙන ලෙස යම් ඡන්ද හිමියකු පෙළඹවීම ;

(ඈ) ඡන්ද විමසීමේ දී ඡන්දය නොදෙන ලෙස යම් ඡන්ද හිමියකු පෙළඹවීම ;

(ඉ) ඡන්ද විමසීම හා සම්බන්ධ (යම් නිල අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක් හෝ දැන්වීමක් නොවන) යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, අපේක්ෂකයකුගේ ඡායාරූපයක් හෝ දැන්වීමක් හෝ යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට 20 වන වගන්තිය යටතේ වෙන් කරන ලද යම් ලකුණක් බෙදා හැරීම හෝ ප්‍රදර්ශනය කිරීම.

මේ උපවගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නො ඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නො ඉක්මවන කාලයක් සඳහා දෙය කාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් ඡන්ද පොළක ඡන්ද විමසීමක් පවත්වනු ලබන යම් දිනයක කිසිම තැනැත්තකු විසින්, ඡන්ද විමසීම සඳහා ඡන්ද පොළට පැමිණෙන යම් තැනැත්තකුට කරදරයක් වන පරිදි හෝ ඡන්ද පොළෙහි රාජකාරියෙහි යෙදී සිටින නිලධරයන්ගේ සහ වෙනත් තැනැත්තන්ගේ වැඩට බාධා ඇති වන පරිදි—

(අ) ඡන්ද පොළක් ඇතුළත හෝ ඡන්ද පොළකට ඇතුළුවන දොරටුව ළඟ ඡන්ද පොළ අසල වූ යම් පොදු හෝ පෞද්ගලික ස්ථානයක දී යම් මෙගපෝනයක් හෝ ශබ්ද විකාශන යන්ත්‍රයක් හෝ මිනිස් කටහඬ විස්තාරණය කිරීම හෝ ප්‍රත්‍යුත්පාදනය කිරීම සඳහා වූ වෙනත් උපකරණයක් පාවිච්චි කිරීම හෝ ක්‍රියා කරවීම නොකළ යුතුය ; නැතහොත්

(ආ) ඡන්ද පොළක් ඇතුළත හෝ ඡන්ද පොළකට ඇතුළුවන දොරටුව ළඟ හෝ ඡන්ද පොළ අසල වූ යම් පොදු හෝ පෞද්ගලික ස්ථානයක දී කෑගැසීම හෝ වෙනත් අන්දමකින් අසංවර ලෙස ක්‍රියා කිරීම නොකළ යුතු ය.

මේ උපවගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්

සියයක් නො ඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නො ඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙක ටම හෝ ඔහු යටත් විය යුතු ය.

පෙරහැරවල් පරිසීමා කිරීම.

69. කිසිම තැනැත්තකු විසින්—

(අ) යම් ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් වූ නාම යෝජනා කාල සීමාවේ පළමු දිනයෙන් ආරම්භව ඒ ඡන්ද විමසීමේ දී ගන්නා ලද ඡන්ද විමසීමේ ප්‍රතිඵලය මේ පනත යටතේ තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයට එක් සතියකට පසුව අවසන් වන කාලසීමාව ඇතුළත, යම් වේලාවක, ඒ වර්ෂයේ මැයි මස 1 වන දින පවත්වනු ලබන පෙරහැරක් හෝ ආගමික හෝ සමාජ සීය කාර්ය සඳහා පවත්වනු ලබන යම් පෙරහැරක් නොවන, වෙනත් යම් පෙරහැරක් මෙහෙය වීම, සැවැත් වීම හෝ ඊට සහභාගිවීම ; නැතහොත්

(ආ) (අ) ඡේදයෙහි සඳහන් කාලසීමාව ඇතුළත පවත්වනු ලබන හෝ මෙහෙයවනු ලබන යම් පෙරහැරක දී එකී (අ) ඡේදයෙහි සඳහන් ඡන්ද විමසීමට අනුබල දීම අරමුණු කොට ගත් යම් ක්‍රියාවක් හෝ දෙයක්

කරනු නොලැබිය යුතු ය.

මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් කඩ කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරද කරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

ප්‍රසිද්ධ රැස්වීම් පරිසීමා කිරීම.

70. ඡන්ද විමසීමේ දිනයට පැය හතලිස් අටකට කලින් ආරම්භව, එම දිනයේ දී ඡන්ද විමසීමක් පවත්වනු ලැබුවේ යම් සංවර්ධන සභා ප්‍රදේශයක් සම්බන්ධයෙන් ද, ඒ සංවර්ධන සභා ප්‍රදේශය සඳහා සතිකයන් තෝරා පත්කර ගත් බව තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කිරීමෙන් එක් සතියකට පසුව අවසන් වන කාලසීමාව ඇතුළත ඒ සංවර්ධන සභා ප්‍රදේශයෙහි කිසිම ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු නොලැබිය යුතු ය.

ඉහතින් වූ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් කඩ කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

66 වන, 67 වන, 68 වන, 69 වන සහ 70 වන වගන්ති යටතේ වූ වැරදි හා සම්බන්ධ පොදු විධිවිධාන.

**71.** (1) 66 වන වගන්තියේ හෝ 67 වන වගන්තියේ හෝ 68 වන වගන්තියේ හෝ 69 වන වගන්තියේ හෝ 70 වන වගන්තියේ සඳහන් යම් වරදක් කිරීමට තැත් කරන සෑම තැනැත්තකුම ඒ වරදට නියමිත දඬුවමට යටත් විය යුතු ය.

(2) 66 වන වගන්තිය හෝ 67 වන වගන්තිය හෝ 68 වන වගන්තිය හෝ 69 වන වගන්තිය හෝ 70 වන වගන්තිය යටතේ වූ සෑම වරදක් ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥෙය වරදක් විය යුතු ය.

(3) යම් ඡන්ද විමසීමක නාම යෝජනා පත්‍රයකට, ඡන්ද පෙට්ටියකට, ඡන්ද පත්‍රිකාවකට හෝ ලකුණු කිරීමේ උපකරණයකට අදාළ වරදක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක දී ඒ නාම යෝජනා පත්‍රයෙහි, ඡන්ද පෙට්ටියෙහි, ඡන්ද පත්‍රිකාවෙහි හෝ ලකුණු කිරීමේ උපකරණයෙහි අයිතිය මෙන් ම යම් ඡන්ද පත්‍රිකාවක උපපත්‍රිකාවේ අයිතිය ද ඒ ඡන්ද විමසීමේ තේරීම් භාර නිලධරයා වෙත පැවරී ඇතැයි සඳහන් කරනු ලැබිය හැකි ය.

(4) 66 වන වගන්තිය හෝ 67 වන වගන්තිය හෝ 68 වන වගන්තිය හෝ 69 වන වගන්තිය හෝ 70 වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක් නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව කරනු නොලැබිය යුතු ය.

අපේක්ෂකයන් නොවන තැනැත්තන් විසින් ඡන්ද විමසීම් ප්‍රකාශන මුද්‍රණය කිරීම ආදිය.

**72.** යම් ඡන්ද විමසීමක් ගැන සඳහන් කෙරෙන සහ මුද්‍රණකරුගේ සහ ප්‍රකාශකගේ නාම සහ ලිපිනය මුහුණතෙහි නොදක්වෙන යම් ප්‍රචාරක දැන්වීමක්, අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක් හෝ දැන්වීම් කොළයක් මුද්‍රණය කරන, පළ කරන, බෙදා හරින හෝ අලවා තබන නැතහොත් මුද්‍රණය කිරීමට, පළ කිරීමට, බෙදා හැරීමට හෝ අලවා තැබීමට සලස්වන, අපේක්ෂකයකු නොවන, සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය:

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි, ඉහත කී නම සහ ලිපින නැත හොත් එවැනි යම් නමක් හෝ ලිපිනයක් සඳහන් කර නොතිබීම ප්‍රමාදයකින් හෝ ඒ හා සමාන වෙනත් යම් සාධාරණ හේතුවකින් සිදු වූ බවටත් යම් අනවධානයක් නිසා සිදු නොවූ බවටත් යම් තැනැත්තකු මහේස්ත්‍රාත්වරයා සෑහීමට පත් කරතහොත් යම් ප්‍රචාරක දැන්වීමක්, අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක් හෝ දැන්වීම් කොළයක් සම්බන්ධයෙන් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඒ තැනැත්තා වරදකට වරදකරු නොවිය යුතු ය.

ඡන්ද විමසීම් කාර්යාල ගණන පරිසීමා කිරීම.

**73.** (1) යම් සංවර්ධන සභා ප්‍රදේශයක යම් ඡන්ද විමසීමක බලය ලත් නියෝජිතයකු වන හෝ කණ්ඩායම් නායකයකු වන නැතහොත් එකී බලයලත් නියෝජිතයාගේ හෝ කණ්ඩායම් නායකයාගේ නියෝජිතයකු වන තැනැත්තකුට—

(අ) ඒ ඡන්ද විමසීමේ නාම යෝජනා කාලසීමාවේ පළමු දින යෙන් ආරම්භව ඒ ඡන්ද විමසීම හා සම්බන්ධ ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට ඉහතින්ම වූ දිනයෙන් අවසන් වන කාලසීමාව ඇතුළත, ඒ සංවර්ධන සභා

ප්‍රදේශයේ එක් නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලයක් හා එක් එක් ඡන්ද කොට්ඨාසයේ එක් නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලයක් හැර වෙනත් යම් ඡන්ද කාර්යාල යක් නොතිබිය යුතු ය ;

(ආ) ඒ ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට ඉහතින් ම වූ දිනයෙන් ආරම්භව ඒ දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් අවසන් වන කාලසීමාව ඇතුළත සංවර්ධන සභා ප්‍රදේශයේ එක් නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලයක් සහ ඒ සංවර්ධන සභා ප්‍රදේශය සඳහා වූ යම් පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාම යෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් එක් නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලයක් හැර වෙනත් යම් ඡන්ද කාර්යාලයක් නොතිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් බලයලත් නියෝජිත යකුගේ හෝ කණ්ඩායම් නායකයකුගේ හෝ අපේක්ෂකයකුගේ සාමාන්‍ය පදිංචි ස්ථානය ඡන්ද කාර්යාලයක් ලෙස පාවිච්චි කිරීම ඒ උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත් තකුම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත් වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(4) මේ වගන්තියෙහි සඳහන් යම් වරදක් කිරීමට තැත් කරන සෑම තැනැත්තකුම ඒ වරදට නියමිත දඬුවමට යටත් විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක්, නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව කරනු නොලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා "නිවේදිත" යන පාඨය යම් ඡන්ද කාර්යාලයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ කාර්යාලය පිහිටුවනු ලැබීමට පෙර එය පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ද ඒ කාර්යාලය පිහිටි සංවර්ධන සභා ප්‍රදේශයේ තේරීම් භාර නිලධරයා වෙත ද දැනුම් දෙනු ලැබූ බව ඉන් අදහස් වේ.

අත් පත්‍රිකා, දැන්වීම් කොළ ආදිය ප්‍රදර්ශනය කිරීම හා සම්බන්ධ විධිවිධාන.

74. (1) යම් ඡන්ද විමසීමක දී නාම යෝජනා කාලසීමාවේ පළමු දිනයෙන් ආරම්භව ඒ ඡන්ද විමසීම හා සම්බන්ධ ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් අවසන් වන කාලසීමාව ඇතුළත, ඒ ඡන්ද විමසීමට අනුබල දීමේ කාර්යය සඳහා කිසිම තැනැත්තකු විසින්—

(අ) ඒ ඡන්ද විමසීමේ දී එහි අපේක්ෂකයකු ගෙන යාම සඳහා පාවිච්චි කරනු ලබන යම් වාහනයක් තුළ හෝ වාහනයක හැර පොදු හෝ පෞද්ගලික කවර හෝ ස්ථානයක යම් කොඩියක් හෝ පතාකයක් ; හෝ

(ආ) ඒ ඡන්ද විමසීමේ දී එහි අපේක්ෂකයකුට ආධාර වශයෙන් යම් ස්ථානයක රැස්වීමක් පැවැත්වීමට ඇති යම් දිනයක ඒ ස්ථානය තුළ හෝ ඒ ස්ථානයෙහි හැර මහජන යාට යාමට අයිතිවාසිකමක් ඇති හෝ ඉඩ දී ඇති යම් ස්ථානයක යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, අපේක්ෂකයකු ගේ ඡායාරූපයක්, ලකුණක් හෝ සලකුණක් ; හෝ

(ඇ) යම් මහා මාර්ගයක් මත හෝ හරහා යම් අත් පත්‍රිකා වක්. ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, අපේක්ෂකයකුගේ ඡායාරූපයක්, ලකුණක්, සලකුණක්, කොඩියක් හෝ පතාකයක් ; හෝ

(ඈ) ඒ ඡන්ද විමසීමේ දී එහි අපේක්ෂකයකු ගෙන යාම සඳහා පාවිච්චි කරනු ලබන යම් වාහනයක් තුළ හෝ වාහනයක හැර යම් වාහනයක් තුළ හෝ වාහනයක යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, අපේක්ෂකයකුගේ ඡායාරූපයක්, ලකුණක් හෝ සලකුණක්

ප්‍රදර්ශනය නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(3) මේ වගන්තියෙහි සඳහන් යම් වරදක් කිරීමට තැත් කරන සෑම තැනැත්තකු ම ඒ වරදට නියමිත දඬුවමට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ සෑම වරදක් ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංජ්ඥෙය වරදක් විය යුතු ය.

(5) (1) වන උපවගන්තියෙහි විධිවිධාන කඩ කිරීමක් වැළැක්වීම සඳහා යම් පොලිස් නිලධරයකු විසින් යුක්ති සහගත ලෙස තමාට අවශ්‍ය විය හැකි යම් පියවරක් ගැනීම හා බලය පාවිච්චි කිරීම කළ හැකි අතර ඒ කඩ කිරීමෙහි ලා පාවිච්චි කරන ලද යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, දැන්වීමක්, චිත්‍රයක්, ලකුණක්, අපේක්ෂකයකුගේ ඡායාරූපයක්, සලකුණක්, කොඩියක් හෝ පතාකයක් තහනමට ගැනීම හා ඉවත් කිරීම ද ඔහු විසින් කළ හැකි ය.

ඡන්ද ආයාචනය කිරීම ආදිය සඳහා අපේක්ෂකයා නිවාසවලට නොයා යුතු බව.

75. (1) නාම යෝජනා කාලසීමාවේ අවසන් දිනයෙන් ආරම්භව, ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට ඉක්බිතිව ම එළඹෙන දින යෙන් අවසන් වන කාලසීමාව ඇතුළත කවර හෝ වේලාවක යම් ඡන්ද හිමියකුගේ නිවසට—

(අ) ඒ ඡන්ද හිමියාගේ ඡන්දය ඉල්ලීමේ නැතහොත් ආයාචන ය කිරීමේ ; හෝ

(ආ) යම් නිශ්චිත පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය නොදෙන ලෙස ඒ ඡන්ද හිමියා පෙළඹවීමේ; හෝ

(ඇ) ඒ ඡන්ද විමසීමේ දී ඡන්දය නොදෙන ලෙස ඒ ඡන්ද හිමියා පෙළඹවීමේ; හෝ

(ඈ) යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, අපේක්ෂකයකුගේ ඡායාරූපයක්, ලකුණක් හෝ සළකුණක් බෙදා හැරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ

කාර්යය සඳහා යන යම් අපේක්ෂකයකු හෝ අපේක්ෂකයකුගේ පවුලේ සාමාජිකයකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "පවුලේ සාමාජිකයා" යන්නෙන්, අපේක්ෂකයකුගේ භාර්යාව/ස්වාමිපුරුෂයා, පුතා, දූව හෝ මව/පියා නැතහොත් අපේක්ෂකයකුගේ පුතාගේ භාර්යාව හෝ දූවගේ ස්වාමිපුරුෂයා අදහස් වේ.

76. (1) යම් තැනැත්තකු—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 38 දරන පළාත් පාලන ආයතන (ප්‍රජා අශක්තුතා නියම කිරීමේ) (අංක 1) පනතෙහි හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 39 දරන පළාත් පාලන ආයතන (ප්‍රජා අශක්තුතා නියම කිරීමේ) (අංක 2) පනතෙහි හෝ දක්වා ඇති නුසුදුසුකම්වලට යටත් වන්නා වූ හෝ යම් මහ නගර සභාවකට හෝ නගර සභාවකට හෝ සභිකයන් තෝරා පත් කර ගැනීමක දී ඡන්දය දීමෙන්, තත් කාලයෙහි බල පවත්නා වෙනත් යම් නීතියක් යටතේ නුසුදුස්සකු වන තැනැත්තකු නම්;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතයක් මගින් තමා සම්බන්ධයෙන් ප්‍රජා අශක්තුතාව නියම කර ඇත්තා වූ ද ඒ යෝජනා සම්මතයෙහි නියම කර ඇති එකී ප්‍රජා අශක්තුතා කාලසීමාව ඉකුත් වී නොමැති තැනැත්තකු නම්

එවැනි කිසිම තැනැත්තකු විසින් අපේක්ෂකයකු වෙනුවෙන් ඡන්දය ආයාචනය කිරීම හෝ අපේක්ෂකයකුගේ නියෝජිතයකු වශයෙන් කටයුතු කිරීම හෝ අපේක්ෂකයකු වෙනුවෙන් කථාකිරීම සඳහා හෝ ඡන්ද විමසීමක දී කවර ආකාරයකින් සහභාගි වීම හෝ නොකළ යුතු ය.

ඇතැම් තැනැත්තන් විසින් ඡන්ද ආයාචනය කිරීම් හෝ නියෝජිතයන් ආදීන් වශයෙන් කටයුතු කිරීම හෝ නොකළ යුතු බව.

(2) යම් තැනැත්තකු—

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 38 දරන පළාත් පාලන ආයතන (ප්‍රජා අශක්නුතා නියම කිරීමේ) (අංක 1) පනතෙහි හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 39 දරන පළාත් පාලන ආයතන (ප්‍රජා අශක්නුතා නියම කිරීමේ) (අංක 2) පනතෙහි හෝ දක්වා ඇති නුසුදුසුකම්වලට යටත් වන්නා වූ හෝ යම් මහ නගර සභාවකට හෝ නගර සභාවකට හෝ සභිකයන් තෝරා පත් කර ගැනීමක දී ඡන්දය දීමෙන්, තත් කාලයෙහි බල පවත්නා යම් නීතියක් යටතේ නුසුදුස්සකු වන තැනැත්තකු නම්;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතයක් මගින් තමා සම්බන්ධයෙන් ප්‍රජා අශක්නුතාව නියම කර ඇත්තා වූ ද ඒ යෝජනා සම්මතයෙහි නියම කර ඇති එකී ප්‍රජා අශක්නුතා කාලසීමාව ඉකුත් වී නොමැති තැනැත්තකු නම්

කිසිම අපේක්ෂකයකු විසින් දැන දැන ම එවැනි තැනැත්තකු තමාගේ ඡන්ද ආයාචක වශයෙන් හෝ නියෝජිතයා වශයෙන් හෝ තමා වෙනුවෙන් කතා කිරීමට හෝ නිරත නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

ඡන්ද විමසීම් වල දී රහස්‍යතාව රැක ගැනීම.

77. (1) ඡන්ද පොළකට හෝ ඡන්ද ගණන් කරනු ලබන අවස්ථාවේ දී හෝ පැමිණ සිටීමට බලය දෙනු ලැබූ සෑම නිලධරයකු, ලිපිකරුවකු, අපේක්ෂකයකු සහ නියෝජිතයකු විසින් එසේ පැමිණීමට පෙර මේ පනතෙහි පළමුවන උපලේඛනයෙහි 'ක' ආකෘතියට සානුකූල, ව්‍යවස්ථාපිත රහස්‍යතා ප්‍රකාශය කළ යුතු ය. තේරීම් භාර නිලධරයා විසින් සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී ද ඡන්ද ස්ථානාධිපතිවරයකු හෝ ගණන් කිරීමේ නිලධරයකු විසින් සමාදාන විනිශ්චයකාරවරයකු හෝ තේරීම් භාර නිලධරයා ඉදිරිපිට දී ද ඒ ප්‍රකාශය කළ යුතු අතර වෙනත් යම් තැනැත්තකු විසින් ඒ ප්‍රකාශය කරනු ලබන විට තේරීම් භාර නිලධරයා හෝ සමාදාන විනිශ්චයකාරවරයකු හෝ ඡන්ද ස්ථානාධිපතිවරයකු හෝ ගණන් කිරීමේ නිලධරයකු ඉදිරිපිට දී එය කළ යුතු ය.

(2) ඡන්ද පොළකට පැමිණ සිටින සෑම නිලධරයකු, ලිපිකරුවකු, අපේක්ෂකයකු හෝ නියෝජිතයකු විසින් ඒ ඡන්ද පොළෙහි ඡන්දය දීම පිළිබඳ රහස්‍යතාව රැක ගැනීම සහ රැක ගැනීමට ආධාර වීම කළ යුතු අතර, නීතියෙන් බලය දෙනු ලැබූ යම් කාර්යයක් සඳහා හැර, ඡන්ද පත්‍රිකාවක් සඳහා ඉල්ලුම් කර ඇති හෝ නැති තැනැත්තකු ඒ ඡන්ද පොළෙහි දී ඡන්දය දී ඇති යම් ඡන්දහිමියකුගේ

ඡන්ද හිමි නාමලේඛනයෙහි සඳහන් නම හෝ අංකය පිළිබඳ වූ හෝ නිල ලකුණ පිළිබඳ වූ යම් තොරතුරක් ඒ කිසිම තැනැත්තකු විසින් ඡන්ද විමසීම අවසන් කරනු ලැබීමට පෙර යම් තැනැත්තකුට දැනුම් දෙනු නොලැබිය යුතු ය.

(3) ඒ කිසිම නිලධරයකු, ලිපිකරුවකු, අපේක්ෂකයකු හෝ නියෝජිතයකු විසින් සහ කවර හෝ තැනැත්තකු විසින්, ඒ ඡන්ද පොළෙහි දී යම් ඡන්දදායකයකු ඡන්දය දීමට යන හෝ ඡන්දය දී ඇති පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම කවරක් ද යන වග පිළිබඳ තොරතුරු ඒ ඡන්ද පොළෙහි දී, ලබා ගැනීමට තැත් කිරීම, නැතහොත් ඡන්ද පොළක දී යම් ඡන්දදායකයකු ඡන්දය දීමට යන හෝ ඡන්දය දී ඇති පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම කවරක්ද යන වග පිළිබඳව හෝ ඒ ඡන්ද පොළෙහි දී යම් ඡන්දදායකයකුට දෙන ලද ඡන්ද පත්‍රිකාවෙහි පිටපැත්තේ සඳහන් අංකය කුමක් ද යන වග පිළිබඳව ඒ ඡන්ද පොළෙහි දී ලබාගත් යම් තොරතුරක් කවර හෝ විටක යම් තැනැත්තකුට දැනුම් දීම නොකළ යුතු ය.

(4) ඡන්ද ගණන් කිරීමේ දී පැමිණ සිටින සෑම නිලධරයකු, ලිපිකරුවකු, අපේක්ෂකයකු හෝ නියෝජිතයකු විසින් ඡන්දය දීම පිළිබඳ රහස්‍යතාව රැක ගැනීම සහ රැක ගැනීමට ආධාර වීම කළ යුතු අතර යම් ඡන්ද පත්‍රිකාවක පිට පැත්තේ සඳහන් අංකය ඒ ගණන් කිරීමෙහි දී නිසැකව දැන ගැනීමට තැත් කිරීම හෝ යම් කිසි ඡන්ද පත්‍රිකාවක් මගින් යම් ඡන්දයක් දෙන ලද පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම කවරක් ද යන වග පිළිබඳව ඒ ගණන් කිරීමෙහි දී ලබා ගත් යම් තොරතුරක් කිසිවකුට දැනුම් දීම හෝ නොකළ යුතු ය.

(5) මේ පනතින් බලය දෙනු ලැබූ කාර්යයක් සඳහා ක්‍රියා කරන ඡන්ද ස්ථානාධිපතිවරයකු විසින් හෝ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඉහත කී යම් කාර්යයක් සඳහා බලය දෙනු ලැබ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ හැර කිසිම තැනැත්තකු විසින්, යම් ඡන්දදායකයකු ඡන්ද පත්‍රිකාවක් ලැබීමෙන් පසුව හා ඔහු එය ඡන්ද පෙට්ටියක් තුළට බහාලීමට පෙර ඒ ඡන්දදායකයා සමඟ කතා බහ් කිරීම හෝ කතා බස් කිරීමට තැත් කිරීම හෝ නොකළ යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම, ඔහු වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු හතක කාලසීමාවක් සඳහා මේ පනත යටතේ ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීමට හෝ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දීමට හෝ ඒ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් නුසුදුසු විය යුතු ය.

4—ඒ 54793 (81/02)

### දූෂණ ක්‍රියා

හොර ඡන්ද දීම.

78. (1) යම් ඡන්ද විමසීමක දී—

(අ) ජීවත්ව සිටින හෝ මිය ගොස් ඇති හෝ ව්‍යාජ වූ හෝ වෙනත් යම් තැනැත්තකු වශයෙන් පෞද්ගලිකව හෝ තැපෑලෙන් ඡන්දය දෙන ; හෝ

(ආ) තමාගේ ම නමින් හෝ නම යටතේ ඒ ඡන්ද විමසීමේ දී එක් වරකට වඩා ඡන්දය දෙන

සෑම තැනැත්තකු ම 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥේය වරදක් විය යුතු හොර ඡන්ද දීමේ වරදට වරදකරු විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) පෞද්ගලිකව ඡන්දය දීමේ කාර්යය සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලුම් කොට ඇති ; හෝ

(ආ) තැපැල් ඡන්දදායකයකු ලෙස සලකනු ලැබීමට ඉල්ලීමක් කර ඇති ; හෝ

(ඇ) තැපෑලෙන් ඡන්දය දීමේ කාර්යය සඳහා නිකුත් කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් වලංගු ලෙස හෝ නො එසේ ව ලකුණු කොට එවා ඇති

තැනැත්තකු ඡන්දය දී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

සංග්‍රහ කිරීම.

79. ඡන්ද විමසීමකට පෙර, ඡන්ද විමසීමක් පවත්වනු ලබන අතරතුර හෝ ඡන්ද විමසීමකින් පසු තමා විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකුගේ මාර්ගයෙන් යම් තැනැත්තකුට හෝ ඒ තැනැත්තා උදෙසා හෝ ඒ තැනැත්තාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ ඡන්දය ඒ ඡන්ද විමසීමෙහි දී දීමට හෝ දීමෙන් වැළකී සිටීමට දූෂිත ලෙස බලපෑමේ කාර්යය සඳහා නැතහොත් ඒ ඡන්ද විමසීමෙහි දී එබඳු යම් තැනැත්තකු හෝ වෙනත් යම් තැනැත්තකු ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හෝ ඡන්දය දීමට නැතහොත් ඡන්දය දීමෙන් වැළකීමට සූදානම්ව සිටීම නිසා කෙළින් ම හෝ අන් අයුරකින් යම් කෑමක්, බීමක්, අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් දෙන හෝ සපයන නැතහොත් දීමට හෝ සැපයීමට සලස්වන හෝ දීමෙහි හෝ සැපයීමෙහි ලා ආධාර වන නැතහොත් දීමේ හෝ සැපයීමේ වියදම් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් ගෙවන හෝ ගෙවීමට සලස්වන නැතහොත් යම් කෑමක්, බීමක්, අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් ලබා ගත හැකි වනු පිණිස යම් මුදලක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් මාර්ගයක් හෝ උපක්‍රමයක් ඉහත සඳහන් පරිදි දෙන හෝ සපයන නැතහොත් දීමෙහි හෝ සැපයීමෙහිලා ආධාර වන නැතහොත් දීමේ හෝ සැපයීමේ වියදම් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් ගෙවන හෝ ගෙවීමට පොරොන්දුවන සෑම තැනැත්තකුම සහ එවැනි යම් කෑමක්, බීමක් හෝ අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් නැතහොත් එවැනි යම් මුදලක් හෝ බලපත්‍රයක් දූෂිත ලෙස භාර ගන්නා හෝ ලබාගන්නා නැතහොත් එවැනි යම් කෑමක්, බීමක්, අන්නපාන

යක් හෝ ආහාර ද්‍රව්‍යයක් ලබාගත හැකි වනු පිණිස එවැනි වෙනත් මාර්ගයක් හෝ උපක්‍රමයක් යොදා ගන්නා සෑම ඡන්ද හිමියකු ම සංග්‍රහ කිරීමේ වරදට වරදකරු විය යුතු ය.

80. (1) යම් ඡන්ද විමසීමක දී යම් තැනැත්තකුගේ ඡන්දය දීමට හෝ දීමෙන් වැළකී සිටීමට ඒ තැනැත්තා පෙළඹවීම හෝ ඔහුට බල කිරීම සඳහා නැතහොත් ඒ තැනැත්තා යම් ඡන්ද විමසීමක දී ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතු කොට ගෙන කෙළින් ම හෝ අන් අයුරකින්, තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුගේ මාර්ගයෙන් ඒ තැනැත්තාට හෝ ඔහුට එරෙහිව යම් බලපෑමක්, සාහසික කමක් නැතහොත් අවහිර කිරීමක් කරන හෝ කරන බවට තර්ජනය කරන හෝ වෙනත් යම් තැනැත්තකුගේ මාර්ගයෙන් ඒ තැනැත්තාට හෝ ඔහුට එරෙහිව යම් ලෞකික හෝ අධ්‍යාත්මික පීඩාවක්, පාඩුවක්, හානියක්, අලාභයක් පමුණුවන හෝ පමුණුවන බවට තර්ජනය කරන නැතහොත් පැහැරගෙන යාමෙන්, අන්තර්ජනය කිරීමෙන් හෝ යම් වංචනික උපායකින් හෝ උපක්‍රමයකින් යම් ඡන්ද හිමියකුට ඔහුගේ ඡන්ද බලය නිදහස් ලෙස පාවිච්චි කිරීමට බාධා පමුණුවන හෝ එසේ කිරීම වළක්වන නැතහොත් යම් ඡන්ද විමසීමක දී යම් ඡන්ද හිමියකුට තම ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට එමගින් බලකරන, පොළඹවන හෝ කැමති කරවන සෑම තැනැත්තකු ම අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය. අයුතු බලපෑම.

(2) යම් ඡන්ද විමසීමක නාම යෝජනා කාල සීමාවේ පළමු දින යෙන් ආරම්භව ඒ ඡන්ද විමසීමේ දී ඡන්දය විමසීම පවත්වනු ලබන දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ යම් වේලාවක—

(අ) ඡන්ද විමසීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති කිරීමේ කාර්යය සඳහා හෝ ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දෙන ලෙස හෝ දීමෙන් වළකින ලෙස යම් ඡන්ද හිමියකු පෙළඹවීමේ කාර්යය සඳහා යම් ආගමික රැස්වීමක දී යම් වචන පවසන ; හෝ

(ආ) ඒ කාර්යය සඳහා යම් ආගමික රැස්වීමක දී යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, අපේක්ෂකයකුගේ ඡායාරූපයක්, ලකුණක්, සලකුණක්, කොඩියක් හෝ පතාකයක් බෙදා හරින හෝ ප්‍රදර්ශනය කරන ; හෝ

(ඇ) ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් තෝරා පත්කර ගැනීම හෝ යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක ඡන්ද ව්‍යාපාරය හෝ ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා පූජනීය ස්ථානයක මහජන රැස්වීමක් පවත්වන හෝ පැවැත්වීමට සලස්වන

සෑම තැනැත්තකු ම අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

(3) යම් ඡන්ද විමසීමක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට හෝ ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ආධාර දීමට හෝ ආධාර දීමෙන් වැළකී සිටීමට ආගමික නිකායක හෝ සංවිධානයක යම් සාමාජිකයකු හෝ අනුගාමිකයකු පෙළඹවීම සඳහා හෝ ඔහුට බල කිරීම සඳහා, නැතහොත් ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන, හෝ ඔහු ඒ ඡන්ද විමසීමේ දී එවැනි යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ආධාර දී තිබීම හෝ ආධාර දීමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන—

(අ) ඒ සාමාජිකයාට හෝ අනුගාමිකයාට හෝ ඒ සාමාජිකයාගේ හෝ අනුගාමිකයාගේ පවුලේ යම් සාමාජිකයකුට, ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා සාමාන්‍යයෙන් කටයුතු කිරීමේ දී හිමිකම් ලබන යම් අධ්‍යාත්මික සේවාවක්, මෙහෙයක් හෝ ප්‍රතිලාභයක් ප්‍රතික්ෂේප කරන හෝ ප්‍රතික්ෂේප කරන බවට තර්ජනය කරන ; හෝ

(ආ) ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා ඒ නිකායෙන් හෝ සංවිධානයෙන් බැහැර කරන හෝ බැහැර කරන බවට තර්ජනය කරන

ඒ ආගමික නිකායේ හෝ සංවිධානයේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

(4) යම් ඡන්ද විමසීමක දී යම් පිළිගත් දේශපාලන පක්ෂය කට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට හෝ ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ආධාර දීමට හෝ ආධාර දීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකුගේ සේවා යෝජකයකු වන්නාවූ යම් තැනැත්තකු විසින් ඒ වෙනත් තැනැත්තා පෙළඹවීම සඳහා ඔහුට බල කිරීම සඳහා නැතහොත් ඒ වෙනත් තැනැත්තා ඒ ඡන්ද විමසීමෙහි දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන, හෝ ඔහු ඒ ඡන්ද විමසීමේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ආධාර දී තිබීම හෝ ආධාර දීමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන—

(අ) ඒ වෙනත් තැනැත්තාගේ සේවා නියුක්තිය අවසන් කරත හොත් හෝ අවසන් කරන බවට තර්ජනය කරතහොත් හෝ; නැතහොත්

(ආ) ඒ වෙනත් තැනැත්තා විසින් එකී සේවා නියුක්තියෙහි සාමාන්‍යයෙන් යෙදී සිටීමේ දී එවකටත් ඔහු භුක්ති විඳිමින් සිටි හෝ ඔහු විසින් භුක්ති විඳින්නට තිබුණු යම්

ප්‍රතිලාභයක් හෝ සේවාවක් ඔහුට ප්‍රතික්ෂේප කරත හොත් හෝ ප්‍රතික්ෂේප කරන බවට තර්ජනය කරත හොත්

ඒ සේවායෝජක අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු ය.

81. පහත සඳහන් තැනැත්තන්, එනම්— අල්ලස්.

(අ) ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට යම් ඡන්ද හිමියකු පෙළඹවීම සඳහා තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින්, යම් ඡන්දහිමියකුට හෝ ඡන්දහිමියකු සඳහා නැතහොත් යම් ඡන්ද හිමියකු වෙනුවෙන් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා කෙළින් ම හෝ අන් අයුරකින් යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් දෙන, ණයට දෙන නැත හොත් දීමට හෝ ණයට දීමට එකඟ වන, හෝ දීමට ඉදිරිපත් වන, පොරොන්දු වන නැතහොත් ලබාදීමට හෝ ලබා දීම පිණිස උත්සාහ කිරීමට පොරොන්දුවන නැතහොත් මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඒ ඡන්ද හිමියා ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොටගෙන ඉහත කී එවැනි යම් ක්‍රියාවක් දූෂිත ලෙස කරන සෑම තැනැත්තකුම;

(ආ) ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට යම් ඡන්ද හිමියකු පෙළඹවීම සඳහා තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින්, ඒ ඡන්දහිමියාට හෝ ඡන්දහිමියා සඳහා හෝ යම් ඡන්දහිමියකු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා නැතහොත් වෙනත් යම් තැනැත්තකුට හෝ තැනැත්තකු සඳහා කෙළින් ම හෝ අන් අයුරකින් යම් නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් දෙන හෝ ලබා දෙන නැතහොත් දීමට හෝ ලබාදීමට එකඟවන හෝ ඉදිරිපත් වන හෝ පොරොන්දු වන හෝ ලබාදීමට හෝ ලබාදීම පිණිස උත්සාහ කිරීමට පොරොන්දු වන නැතහොත් මේ පනත යටතේ වූ යම් ඡන්දහිමියකු ඡන්ද විමසීමක දී ඡන්දය දී තිබීම හෝ දීමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන ඉහත කී එවැනි යම් ක්‍රියාවක් දූෂිත ලෙස කරන සෑම තැනැත්තකුම;

(ඇ) සංවර්ධන සභා සභිකයකු ලෙස යම් තැනැත්තකු තෝරාපත් කර ගැනීම හෝ මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී යම් ඡන්දහිමියකුගේ ඡන්දය හෝ ලබා දීම සිදු කිරීමට හෝ සිදු කිරීමෙහිලා උත්සාහ කිරීමට යම් තැනැත්තකු පෙළඹවීම සඳහා තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් හෝ ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තා සඳහා කෙළින් ම හෝ අන් අයුරකින් ඉහත කී පරිදි එවැනි යම් තෑග්ගක්, ණයක්, යෝජනාවක්, පොරොන්දුවක්, ලබාදීමක් හෝ එකඟවීමක් දෙන හෝ කරන සෑම තැනැත්තකුම;

(ඈ) එවැනි යම් තෑග්ගක්, ණයක්, යෝජනාවක්, පොරොන්දුවක්, ලබාදීමක් හෝ ගිවිසුමක් ලැබුණු විටක නැතහොත් එවැනි යම් තෑග්ගක, ණයක, යෝජනාවක, පොරොන්දුවක, ලබාදීමක හෝ ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන්, සංවර්ධන සභා සභිකයකු ලෙස යම් තැනැත්තකු තෝරා පත් කර ගැනීම හෝ මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී යම් ඡන්දහිමියකුගේ ඡන්දය ලබාදීම සිදු කරන හෝ සිදු කිරීමෙහි යෙදෙන හෝ සිදුකිරීමෙහිලා පොරොන්දු වන නැතහොත් උත්සාහ කරන සෑම තැනැත්තකුම;

(ඉ) මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමකදී අල්ලස් වශයෙන් යම් මුදලක් හෝ එහි යම් කොටසක් වියදම් කළ යුතු ය යන චේතනාවෙන් වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය පිණිස ඒ මුදල හෝ එහි යම් කොටස කලින් දෙන, ගෙවන හෝ ගෙවීමට සලස් වන නැතහොත් ඒ ඡන්ද විමසීමේ දී අල්ලස් වශයෙන් වියදම් කරන ලද යම් මුදලක් සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් නිදහස් කිරීම හෝ ආපසු ගෙවීම සඳහා දැන දැනම යම් තැනැත්තකුට යම් මුදලක් ගෙවන හෝ ගෙවීමට සලස්වන සෑම තැනැත්තකුම;

(ඊ) මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමකට පෙර හෝ යම් ඡන්ද විමසීමක් පවත්වනු ලබන අතරතුර, ඒ ඡන්ද විමසීමේ දී ඡන්දය දීම හෝ ඡන්දය දීමට එකඟවීම නැත හොත් ඡන්දය දීමෙන් වැළකී සිටීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට එකඟවීම හේතුකොට ගෙන තමා සඳහා ම හෝ වෙනත් යම් තැනැත්තකු සඳහා යම් මුදලක්, තෑග් ගක්, ණයක් හෝ වටිනා ප්‍රතිඥාවක්, නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් තමා විසින් ම හෝ තමා වෙනු වෙන් වෙනත් යම් තැනැත්තකු මගින් කෙළින් ම හෝ අන් අයුරකින් ලබා ගන්නා හෝ ලබා ගැනීමට එකඟවන, හෝ ඒ සඳහා ගිවිසුමක් ඇති කර ගන්නා සෑම ඡන්ද හිමියකු ම;

(උ) මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමකින් පසු, ඒ ඡන්ද විමසීමේ දී යම් තැනැත්තකු ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම නැතහොත් ඡන්දය දීමට හෝ ඡන් දය දීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවා තිබීම හේතුකොට ගෙන යම් මුදලක් හෝ වටිනා ප්‍රතිඥාවක් තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් කෙළින් ම හෝ අන් අයුරකින්, ලබා ගන්නා සෑම තැනැත්තකුම;

(ඌ) ඡන්ද විමසීමක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දීම හෝ ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමට එකඟවීම හෝ ඡන්දය දීමට එකඟව සිටීම හේතු කොට ගෙන හා ඒ සඳහා වූ ගෙවීමක් වශයෙන්, නැතහොත් ඡන්ද විමසීමක දී යම් පිළිගත් දේශපාලන

පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට සහාය වී තිබීම හෝ සහාය වීමට එකඟව සිටීම හේතු කොට ගෙන හා ඒ සඳහා වූ ගෙවීමක් වශයෙන් යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් තෑගි කරන ලෙස හෝ ණයට දෙන ලෙස නැත හොත් යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් තෑගි කිරීමට හෝ ණයට දීමට පොරොන්දු වන ලෙස නැතහොත් යම් නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් ලබා දෙන ලෙස නැතහොත් යම් නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් ලබා දීමට පොරොන්දු වන ලෙස ඒ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් නාම යෝජනා කරනු ලැබ ඇති යම් අපේක්ෂකයකු වෙත නැතහොත් ඔහුගේ නියෝජිතයා හෝ නියෝජිතයන් වෙත තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් කෙළින් ම හෝ අන් අයුරකින් ඉල්ලුම් කරන සෑම තැනැත්තකුම ;

(එ) අපේක්ෂකයකු ලෙස නාම යෝජනා ලැබීමට හෝ අපේක්ෂක යකු වීමෙන් වැළකී සිටීමට හෝ අපේක්ෂකයකු වී ඇත්නම් ඉල්ලා අස්වීමට හෝ එකඟවන ලෙස වෙනත් යම් තැනැත් තකු පෙලඹවීම සඳහා තමා විසින් ම හෝ තමා වෙනුවෙන් යම් තැනැත්තකු මගින් කෙළින් ම හෝ අන් අයුරකින් ඒ වෙනත් තැනැත්තාට යම් නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් දෙන හෝ ලබාදෙන නැතහොත් යම් නිල යක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් දීමට හෝ ලබා දීමට එකඟ වන නැතහොත් ලබා දීමට හෝ ලබා දීම පිණිස උත්සාහ කිරීමට ඉදිරිපත්වන හෝ පොරොන්දු වන නැත හොත් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා හෝ ඒ වෙනත් තැනැත්තාට හෝ ඒ වෙනත් තැනැත්තා සඳහා හෝ ඒ වෙනත් තැනැත්තා වෙනුවෙන් යම් තැනැත් තකුට හෝ යම් තැනැත්තකු සඳහා යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් දෙන හෝ ණයට දෙන නැතහොත් දීමට හෝ ණයට දීමට එකඟවන නැතහොත් ලබාදීමට හෝ ලබා දීම පිණිස උත්සාහ කිරීමට ඉදිරිපත්වන හෝ පොරොන්දු වන සෑම තැනැත්තකුම

අල්ලස් වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් දඬුවම සහ අශක්‍යතා නියම කිරීම.

**82.** (1) (අ) හොර ඡන්ද දීමේ වරද සිදු කරන හෝ හොර ඡන්ද දීමේ වරද සිදු කිරීමෙහි ලා ආධාර කරන, අනුබල දෙන, උපදෙස් දෙන හෝ ඒ වරද කිරීම සිදු කරවන ; හෝ

(ආ) සංග්‍රහ කිරීමේ, අයුතු බලපෑමේ හෝ අල්ලස් පිළිබඳ වරද සිදු කරන ; හෝ

(ඇ) ඡන්ද විමසීමකට පෙර හෝ ඒ ඡන්ද විමසීම පවත් වනු ලබන අතරතුර ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති කිරීමේ කාර්යය සඳහා යම් අපේක්ෂකයකුගේ පෞද්ගලික චරිතය හෝ හැසිරීම සම්බන්ධයෙන් සිද්ධි පිළිබඳ වූ යම් අසත්‍ය ප්‍රකාශයක් කරන හෝ පළ කරන ; හෝ

(ඈ) ඡන්ද විමසීමකට පෙර හෝ ඒ ඡන්ද විමසීම පවත් වනු ලබන අතරතුර, ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති කිරීමේ කාර්යය සඳහා ඒ ඡන්ද විමසීමෙන් යම් අපේක්ෂකයකු ඉල්ලා අස් වූ බවට යම් අසත්‍ය ප්‍රකාශයක් කරන හෝ පළ කරන

සෑම තැනැත්තකුම, දූෂණ ක්‍රියාවකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, මේ උපවගන්ති යේ (අ) ඡේදයේ සඳහන් වරදක් සම්බන්ධයෙන් වන විට, බරපතල වැඩ ඇතිව මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනා ගාරගත කිරීමකට ද වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම, ඔහු වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු හතක කාලයක් සඳහා මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හෝ ඡන්දය දීමට හෝ සංවර්ධන සභාවක සභිකයකු ලෙස තෝරා පත් කර ගනු ලැබීමට හෝ ඒ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් අශක්‍යතාවකට පත් විය යුතු අතර, ඒ වරදකරු කරනු ලැබූ දිනයෙහි ඔහු සංවර්ධන සභාවක සභිකයකු ලෙස තෝරා පත් කර ගනු ලැබ සිටියේ නම්, ඔහුගේ තේරී පත්වීම ඒ වරදකරු කරනු ලැබීමේ දින සිට නිෂ්ප්‍රභ විය යුතු ය.

(3) දූෂණ ක්‍රියාවක් සඳහා වූ නඩු පැවරීමක් නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව කරනු නොලැබිය යුතු ය.

යම් ඡන්ද විමසීමක දී පරාජිත අපේක්ෂකයකු විසින් කරනු ලද දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ දඬුවමට හා අශක්‍යතාවට අදාළ විශේෂ විධිවිධාන.

83. (1) මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී සභිකයකු වශ යෙන් තෝරා පත් කර ගනු නොලැබූ යම් අපේක්ෂකයකු විසින් හෝ ඔහුගේ දැනුම හෝ කැමැත්ත ඇතිව හෝ ඔහුගේ නියෝජිතයන් අතුරින් යම් නියෝජිතයකු විසින් හෝ ඒ ඡන්ද විමසීම සම්බන්ධ යෙන් යම් දූෂණ ක්‍රියාවක් සිදු කරනු ලැබූ අවස්ථාවක, ඒ අපේක්ෂ කයා මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ කල්හි, හොර ඡන්ද දීමේ වරද සම්බන්ධයෙන් වන විට මාස දොළහක් නොඉක්ම වන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට ද, වෙනත් යම් වර දක් සම්බන්ධයෙන් වන විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම ඔහු යටත් විය යුතු ය:

එසේ වුව ද ඒ අපේක්ෂකයා විසින්—

(අ) ඡන්ද විමසීමේ දී තමා විසින් කිසිම දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු නොකරන ලද බව සහ එවැනි යම් වරදක් සිදුකර ඇත්තේ තමාගේ විධානවලට පටහැනිව හා තමා ගේ අනුමතය හෝ අපසහායකත්වය නොමැතිව බව; සහ

(ආ) ඡන්ද විමසීමේදී දූෂණ හෝ නීති විරෝධී ක්‍රියා සිදු කිරීම වැළැක්වීම සඳහා තමා විසින් සියලු යුක්ති සහගත ක්‍රියා මාර්ග ගත්තා ලද බව ; සහ

(ඇ) එවැනි යම් වරදක් සුළු, නොවැදගත් හා සීමිත ස්වභාවයේ වරදක් වන බව ; සහ

(ඈ) වෙනත් සියලු කරුණු සැලකිල්ලට ගනු ලැබූ විට, තමා විසින් හෝ තම නියෝජිතයන් විසින් සිදු කරන ලද කිසියම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවකින් ඒ ඡන්ද විමසීම තොර වූ බව

මහේස්ත්‍රාත්වරයාට ඔප්පු කරනු ලැබුවහොත්, ඔහුගේ නියෝජිත යන් අතුරින් යම් නියෝජිතයකු විසින් සිදු කරන ලද සංග්‍රහකිරීමේ හෝ අයුතු බලපෑමේ වරදින් සමන්විත එවැනි දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඒ අපේක්ෂකයා මේ වගන්තිය යටතේ වරදකරු කරනු නොලැබිය යුතු ය.

(2) දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ වරද කරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම, ඔහු වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු හතක කාලයක් සඳහා මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඡන්දහිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හෝ ඡන්දය දීමට හෝ සංවර්ධන සභාවක සභිකයකු ලෙස තෝරා පත් කර ගනු ලැබීමට හෝ ඒ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් අශක්‍යතාවකට පත්විය යුතු අතර, ඒ වරදකරු කරනු ලැබූ දිනයෙහි ඔහු එලෙස තෝරා ගනු ලැබ සිටියේ නම් ඔහුගේ තේරී පත්වීම ඒ වරදකරු කරනු ලැබීමේ දින සිට නිෂ්ප්‍රභ විය යුතු ය.

(3) මේ පනත යටතේ වූ ඡන්ද විමසීමක දී සභිකයකු ලෙස තෝරාපත් කර ගනු නොලැබූ යම් අපේක්ෂකයකුට විරුද්ධව නීති පතිවරයාගේ අනුමතය ඇතිව හැර මේ වගන්තිය යටතේ වූ දූෂණ ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් කරනු නොලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ වූ ඡන්ද විමසීමක දී සභිකයකු ලෙස තෝරා පත් කර ගනු නොලැබූ අපේක්ෂකයකුට විරුද්ධව, ඒ ඡන්ද විමසීම හා සම්බන්ධ දූෂණ ක්‍රියාවකට 82 වන වගන්තිය යටතේ නඩු පවරනු ලැබීම, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අතුරින් කිසිවකින් නිවාරණය වේතැයි හෝ වළක්වනු ලැබේතැයි සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එසේ අර්ථ නිරූපණය කරනු නොලැබිය යුතු ය.

### නීති විරෝධී ක්‍රියා

84. (1) යම් ඡන්ද විමසීමක දී— ඇතැම් වියදම් නීති විරෝධී ක්‍රියා විය යුතු බව.

(අ) ඡන්ද විමසන ස්ථානයට හෝ ඡන්ද විමසන ස්ථානයේ සිට ඡන්දහිමියන් ගෙන යාම හේතු කොට ගෙන කවර හෝ වර්ගයක වාහන හෝ ප්‍රවාහන සතුන් කුලියට ගැනීම සඳහා හෝ දුම්රිය ගාස්තු හෝ අන්‍යාකාරයකින් කිසිම ගෙවීමක් කරනු නොලැබිය යුතු ය ; නැතහොත් ගෙවීම සඳහා වූ ගිවිසුමක් ඇති කර ගනු නොලැබිය යුතු ය ; නැතහොත්

(ආ) යම් ඇමතීම් පත්‍රිකාවක්, පත්‍රිකාවක් හෝ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් ගෙයක්, ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීම හේතුකොට ගෙන නැත හොත් යම් ඇමතීම් පත්‍රිකාවක්, පත්‍රිකාවක් හෝ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හේතුකොට ගෙන ඡන්ද හිමියකුට කිසිම ගෙවීමක් කරනු නොලැබිය යුතු ය; නැත හොත් ඡන්ද හිමියකු සමග කිසිම ගිවිසුමක් ඇතිකර ගනු නොලැබිය යුතු ය.

(2) මේ පනත අනුව ඉඩදෙනු ලැබිය හැකි යම් ව්‍යතිරේකයකට යටත්ව, ඡන්ද විමසීමකට පෙර හෝ ඡන්ද විමසීමක් පවත්වනු ලබන අතරතුර හෝ ඡන්ද විමසීමකින් පසුව හෝ මේ වගන්තියේ විධිවිධාන කඩකරමින්, දැන දැනම යම් ගෙවීමක් කරනු ලැබුව හොත්, නැතහොත් ගෙවීම සඳහා වූ ගිවිසුමක් ඇතිකර ගනු ලැබුවහොත්, ඒ ගෙවීම කළ හෝ ගිවිසුම ඇතිකර ගත් තැනැත්තා නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු අතර, මේ වගන්තියේ විධිවිධාන කඩකිරීමක් බව දැන දැනම ඒ ගෙවීම ලබන හෝ එවැනි යම් ගිවිසුමකට පාර්ශ්වකරුවකු වන යම් තැනැත්තකු ද නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

(3) මේ පනතින් හෝ ඒ යටතේ ඉඩදෙනු ලැබූ හෝ ඉඩදෙනු ලැබිය හැකි යම් ප්‍රකාශිත ව්‍යතිරේකවලට යටත්ව, යම් සංවර්ධන සභා ප්‍රදේශයක යම් ඡන්ද විමසීමක දී ඡන්ද විමසීම ආරම්භ වන වේලාවට එක් පැයකට පෙර ආරම්භ වන්නා වූ ද ඒ ඡන්ද විමසීම අවසන් කරන ලද වේලාවට පසු එක් පැයකින් අවසන් වන්නා වූ ද කාලය ඇතුළත යම් තැනැත්තකු විසින් ඒ ප්‍රදේශයෙහි—

(අ) ඡන්ද විමසන ස්ථානයට හෝ ඡන්ද විමසන ස්ථානයේ සිට ඡන්දදායකයන් ගෙන යාමේ කාර්යය සඳහා; හෝ

(ආ) (i) යම් නීත්‍යනුකූල කටයුත්තක්; නැතහොත්

(ii) යම් නිල කටයුත්තක්, එනම් තමා විසින් දරනු ලබන හෝ කරනු ලබන හෝ කරගෙන යනු ලබන යම් නිලයකින්, සේවයකින් හෝ සේවා නියුක්තියකින් පැන නැගෙන්නා වූ හෝ ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටුකිරීම පිණිස

නොවන වෙනත් යම් කාර්යයක් සඳහා

යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු කුලියට දීම, අත මාරුවට දීම, සේවයෙහි යෙදවීම, කුලියට ගැනීම, අතමාරුවට ගැනීම හෝ පාවිච්චි කිරීම හෝ යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු කුලියට දීමට, අතමාරුවට දීමට, සේවයෙහි යෙදවීමට, කුලියට ගැනීමට, අතමාරුවට ගැනීමට හෝ පාවිච්චි කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර හෝ අනුබලදීම හෝ කරනු නොලැබිය යුතු ය.

මේ උපවගන්තියෙහි විධිවිධාන කඩකරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද—

(අ) ඇන්වීම් නියෝජිතයකු වශයෙන් ගාස්තු අයකර පත්‍රිකා හා ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම ඡන්දහිමියකුගේ සාමාන්‍ය ව්‍යාපාර කටයුත්ත වන අවස්ථාවක, ඒ ඡන්ද හිමියාට කරනු ලබන ගෙවීමක් හෝ ඔහු සමග ඇති කර ගනු ලබන ගිවිසුමක්, ඒ ගෙවීම හෝ ගිවිසුම හෝ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී කරන ලද්දේ නම් හෝ ඇති කරගනු ලැබුවේ නම්, මේ වගන්තියේ අර්ථානුකූලව එය නීති විරෝධී ක්‍රියාවක් ලෙස සලකනු නොලැබිය යුතු ය ;

(ආ) ඡන්ද විමසීමක දී ඡන්ද හිමියන්ට ස්වකීය පදිංචි ස්ථාන යෙහි සිට මුහුද හෝ මුහුදෙහි ශාඛාවක් හෝ මුහුදු කඩිත්තක් නැතහොත් ගංගාවක් හරහා නොගොස් තම ඡන්ද පොළවල් කරා ළඟාවිය නොහැකිවන අවස්ථාවක, ඒ ඡන්ද හිමියන්ගේ ඡන්ද පොළවල් කරා ඔවුන් මුහුදින් ගෙන යාම පිණිස හෝ ඔවුන්ගේ ඡන්ද පොළවලට ළඟාවීම සඳහා ඔවුන්ට ගඟින් එතෙර විය හැකි වනු පිණිස හෝ විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය ;

(ඇ) ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ දුම්රිය සේවය මගින් සලසනු ලබන යම් මහජන ප්‍රවාහන සේවයකින් යම් ඡන්ද විමසීමක දී යම් තැනැත්තකු තමාගේ ම වියදමින් ඡන්දය විමසන ස්ථානයට හෝ ඡන්දය විමසන ස්ථානයේ සිට යාමට සහ ඊමට නැතහොත් ඡන්ද විමසන ස්ථානයේ සිට තමාට යාමේ සහ ඊමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් තමාගේ වියදමින් එබඳු සේවයක් පාවිච්චි කිරීම හෝ මේ වගන්තියෙහි අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් ලෙස සලකනු නො ලැබිය යුතු ය ;

(ඈ) යම් සංවර්ධන සභා ප්‍රදේශයක යම් ඡන්ද විමසීමක දී ඡන්ද විමසීමක් පවත්වනු ලැබීමට ඇති දිනට දින හතකට පෙර ඒ ප්‍රදේශය සඳහා වූ තේරීම් භාර නිලධරයාට ලැබෙන පරිදි යම් තැනැත්තකු විසින් හෝ ඒ තැනැත්තා වෙනුවෙන් අපේක්ෂකයකු නොවන වෙනත් යම් තැනැත් තකු විසින් කරනු ලැබූ ලිඛිත ඉල්ලීමක් අනුව, යම් ශාරීරික දුර්වලතාවක් නිසා ඡන්ද විමසන ස්ථානයට සහ ඡන්ද විමසන ස්ථානයේ සිට පයින් හෝ මේ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි සඳහන් යම් මහජන ප්‍රවාහන සේවයකින් යාමට සහ ඊමට ඒ තැනැත්තාට නොහැකි බවට තේරීම් භාර නිලධරයා සෑහීමට පත්වන අවස්ථාවක ඡන්ද විමසන ස්ථානයට සහ ඡන්ද විමසන ස්ථානයේ සිට යාමේ සහ ඊමේ කාර්යය සඳහා යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කිරීමට ලිඛිත බලයක් ඒ තේරීම් භාර නිලධරයා විසින් ඒ තැනැත්තාට දිය හැකි අතර, ඒ අනුව

එසේ තමාට යාමේ සහ ඊමේ කාර්යය සඳහා ඒ තැනැත්තා විසින් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කිරීම මේ වගන්තියේ අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් ලෙස සලකනු නො ලැබිය යුතු ය.

(5) යම් සංවර්ධන සභා ප්‍රදේශයක පවත්වනු ලබන යම් ඡන්ද විමසීමක දී යම් පොලිස් නිලධරයකු විසින් ස්වකීය මෙහෙය වීමෙන් ම හෝ යම් තැනැත්තකු විසින් කරනු ලබන පැමිණිල්ලක් මත පොලිස් නිලධරයකු විසින් පැවැත්විය යුතු යයි මෙයින් නියම කරනු ලබන විමර්ශනයකින් පසු හෝ යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු (1) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් පාවිච්චි කරනු ලබන බවට ඒ පොලිස් නිලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ නිලධරයා විසින් ඒ වාහනය, ජල යාත්‍රාව හෝ සතා නවත්වා තහනමට ගෙන පොලිස් ස්ථානයට ගෙන ගොස් ඡන්දය විමසීම අවසන් වන තෙක් එහි රඳවා තබාගත යුතු ය.

(6) මේ වගන්තියෙහි අර්ථානුකූල වූ නීති විරෝධී ක්‍රියාවක් සිදු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට, ඒ ක්‍රියාව සිදු කිරීමෙහි ලා හෝ ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු ජනරජය සතු කළ යුතු යයි ප්‍රකාශ කරමින් ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කළ හැකි ය.

ප්‍රවෘත්ති පත්‍රවල අසත්‍ය වාර්තා.

85. (1) යම් ප්‍රවෘත්ති පත්‍රයක—

(අ) යම් ඡන්ද විමසීමක දී ඒ ඡන්ද විමසීම තරග කරන යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක යම් අපේක්ෂකයකුගේ කථා හෝ කටයුතු සම්බන්ධයෙන් හෝ පිළිබඳව ; නැතහොත්

(ආ) ඒ අපේක්ෂකයා විසින් හෝ එවැනි යම් පිළිගත් දේශ පාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් ඒ ඡන්ද විමසීම පවත්වා ගෙන යාම හෝ එහි ලා කටයුතු කිරීම සම්බන්ධයෙන් හෝ පිළිබඳව

යම් අසත්‍ය ප්‍රකාශයක් පළ කරනු ලැබූ සහ ඒ ප්‍රකාශය ඒ ඡන්ද විමසීමෙහි ප්‍රතිඵල කෙරෙහි බල පෑ හැකි වන අවස්ථාවක දී, එසේ එය පළ කරනු ලැබූ වේලාවෙහි ඒ ප්‍රවෘත්ති පත්‍රයෙහි අයිතිකරු, කළමනාකරු, සංස්කාරක, ප්‍රකාශක හෝ වෙනත් එවැනි නිලධරයකුව සිටි හෝ එවැනි තත්වයකින් ක්‍රියා කරනු ලැබුවේ යයි කියනු ලබන සෑම තැනැත්තකු ම, ඒ පළකිරීම කරන ලද්දේ තමාගේ අනුමතය හෝ අපසහායකත්වය නොමැතිව බව සහ ඒ තත්වයෙන් වූ ස්වකීය කටයුතුවල ස්වභාවය හා සියලු අවස්ථානුගත කරුණු කෙරෙහි සැලකිලිමත්ව තමා විසින් යෙදිය යුතුව තිබුණු සියලු උද්යෝගය ඒ පළකිරීම වැළැක්වීම පිණිස තමා විසින් යොදන ලද බව, ඒ තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ එක් එක් තැනැත්තා නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වරදකරු විය යුතු ය.

(2) මේ වගන්තියෙහි, "ප්‍රවෘත්ති පත්‍රය" යන යෙදුමට යම් සංග්‍රහයක්, සඟරාවක්, පත්‍රිකාවක් හෝ වෙනත් ප්‍රකාශයක් ඇතුළත් වේ.

86. (1) පහත දැක්වෙන කාර්යය සඳහා හෝ තත්ත්වයන් ගෙන් හැර, වෙනත් කවර හෝ කාර්යයක් සඳහා හෝ තත්ත්වය කින් කිසිම තැනැත්තකු ගෙවීම් ලැබීමට හෝ ගෙවීම් ලබන පොරොන්දුව පිට, සේවයෙහි යොදාගැනීමට හෝ නිදුක්ත කර ගැනීම යම් ඡන්ද විමසීමකට ආධාරදීමේ කාර්යය සඳහා නොකළ යුතු ය:— ඇතැම් සේවා නියුක්ති නීති විරෝධී විය යුතු බව.

(අ) ඡන්ද විමසීම පවත්වනු ලබන අතරතුර එක් එක් ඡන්ද පොළ සඳහා වූ යම් ඡන්ද ස්ථාන නියෝජිතයකුගේ පත් වීම අවලංගු කිරීමට ඇතිවිය හැකි අවශ්‍යතාව කෙරෙහි සැලකිලිමත්ව, ඒ එක් එක් ඡන්ද පොළ සඳහා ඡන්ද ස්ථාන නියෝජිතයන් යුක්තිසහගත සංඛ්‍යාවක් සහ එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානය සඳහා 49 වන වගන්තියේ සඳහන් කරනු ලැබූ ගණන් කිරීමේ නියෝජිත යන් ගණනකට නොවැඩි සංඛ්‍යාවක්;

(ආ) සංවර්ධන සභා ප්‍රදේශයට අයත් ප්‍රදේශයේ ප්‍රමාණය සහ ඒ ප්‍රදේශයේ ඡන්ද හිමි නාම ලේඛනයෙහි වූ ඡන්ද හිමියන් ගේ සංඛ්‍යාව කෙරෙහි සැලකිලිමත්ව, ලිපිකරුවන් හා පණිවුඩ කරුවන් යුක්ති සහගත සංඛ්‍යාවක්.

(2) මේ පනත අනුව ඉඩදෙනු ලැබිය හැකි යම් ව්‍යතිරේකයකට යටත්ව, ඡන්ද විමසීමකට පෙර, ඡන්ද විමසීමක් පවත්වනු ලබන අතරතුර හෝ ඡන්ද විමසීමකින් පසු මේ වගන්තියේ විධිවිධාන කඩකරමින් යම් තැනැත්තකු සේවයෙහි යොදා ඇත්නම් නැත හොත් සේවයෙහි නියුක්ත කර ඇත්නම්, ඔහු සේවයෙහි යොදා ගත් නැතහොත් නියුක්ත කරගත් තැනැත්තා නීති විරෝධී ක්‍රියාව කට වරදකරු විය යුතු ය.

87. යම් ඡන්ද විමසීමක් පිළිබඳව සඳහන් වන, එහෙත් මුද්‍රණ කරුගේ සහ ප්‍රකාශකගේ නම සහ ලිපිනය මුහුණතෙහි නො දැක්වෙන යම් ප්‍රචාරක දැන්වීමක්, අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, හෝ දැන්වීම් කොළයක් මුද්‍රණය කරන, පළ කරන, බෙදා හරින හෝ අලවන නැතහොත් මුද්‍රණය කිරීමට, පළකිරීමට, බෙදා හැරීමට හෝ ඇලවීමට සලස්වන අපේක්ෂකයකු හෝ ඔහුගේ නියෝජිතයකු නීති විරෝධී ක්‍රියාවකට වරදකරු විය යුතු ය. ඡන්ද විමසීම් ප්‍රකාශන මුද්‍රණය කිරීම ආදිය.

88. (1) නීති විරෝධී ක්‍රියාවක් සිදුකළ සෑම තැනැත්තකු ම, ඔහු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් තුන් සියයක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු අතර, වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා, මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හෝ ඡන්දය දීමට හෝ සංවර්ධන සභා සභිකයකු නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට දඬුවම.

ලෙස තෝරා පත්කර ගනු ලැබීමට, ඒ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන්, අශක්‍යතාවකට පත්විය යුතු ය. තව ද ඒ වරදකරු කරනු ලැබූ දිනයෙහි ඔහු සංවර්ධන සභා සභිකයකු ලෙස තෝරා පත්කර ගනු ලැබ සිටියේ නම්, ඔහුගේ ඒ තේරී පත්වීම ඒ වරද කරු කරනු ලැබීමේ දින සිට නිෂ්ප්‍රභ විය යුතු ය.

(2) නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක් නීතිපතිවරයාගේ අනුමතය නොමැතිව කරනු නොලැබිය යුතු ය.

යම් ඡන්ද විමසීමක දී පරාජිත අපේක්ෂකයකු විසින් කරන ලද නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ දඬුවමට හා අශක්‍යතාවට අදාළ විශේෂ විධිවිධාන.

89. (1) මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී සභිකයකු වශයෙන් තෝරා පත්කරගනු නොලැබූ යම් අපේක්ෂකයකු විසින් හෝ ඔහුගේ අනුදැනුම හෝ කැමැත්ත ඇතිව ඔහුගේ නියෝජිත යන්ගෙන් කිසිවකු විසින් හෝ ඒ ඡන්දවිමසීම සම්බන්ධයෙන් යම් නීති විරෝධී ක්‍රියාවක් සිදු කරනු ලැබූ අවස්ථාවක, මහෙස්ත්‍රාත් වරයකු විසින් වරදකරු කරනු ලැබූවිට ඒ අපේක්ෂකයා රුපියල් සුන්සියයක් නො ඉක්මවන දඩයකට යටත් විය යුතු ය :

එසේ වූව ද ඒ අපේක්ෂකයා විසින්—

(අ) ඒ ඡන්ද විමසීමේ දී තමා විසින් කිසිදු දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු නො කරන ලද බව සහ නඩු පැවරී මට විෂය කරුණ වී ඇති නීති විරෝධී ක්‍රියාව සිදුකර ඇත්තේ තමාගේ විධානවලට පටහැනිව හා තමාගේ අනුදැනුම හෝ අපසහායකත්වය නොමැතිව බව ; සහ

(ආ) ඒ ඡන්ද විමසීමේ දී දූෂණ හා නීති විරෝධී ක්‍රියා සිදු කිරීම වැළැක්වීම පිණිස තමා විසින් සියලු යුක්තිසහගත ක්‍රියා මාර්ග ගන්නා ලද බව ; සහ

(ඇ) ඒ නීති විරෝධී ක්‍රියාව සංයුක්තවන වරද හෝ වැරදි, සුළු. නොවැදගත් හා සීමිත ස්වභාවයේ වරදක් හෝ වැරදි බව ; සහ

(ඈ) ඒ වෙනත් සියලු කරුණු සැලකිල්ලට ගනු ලැබූ විට තමා විසින් හෝ තම නියෝජිතයන් විසින් සිදුකරන ලද කිසියම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවකින් ඒ ඡන්ද විමසීම තොර වූ බව

මහෙස්ත්‍රාත්වරයාට ඔප්පු කරනු ලැබුවහොත්, ඔහුගේ නියෝජිත යන් අතුරෙන් යම් නියෝජිතයකු විසින් සිදු කරන ලද එවැනි නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ අපේක්ෂකයා මේ වගන්තිය යටතේ වරදකරු කරනු නොලැබිය යුතු ය.

(2) නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම, ඔහු වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හෝ ඡන්දය දීමට හෝ සංවර්ධන සභාවක සභිකයකු ලෙස තෝරා පත්කර ගනු ලැබීමට හෝ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් අශක්‍යතාවකට පත් විය යුතු අතර, ඒ වරදකරු කරනු ලැබූ දිනයෙහි

ඔහු සංවර්ධන සභා සභිකයකු ලෙස තෝරා පත්කර ගනු ලැබ සිටියේ නම් ඔහුගේ තේරී පත්වීම ඒ වරදකරු කරනු ලැබූ දින සිට නිෂ්ප්‍රභ විය යුතු ය.

(3) මේ පනත යටතේ වූ ඡන්ද විමසීමක දී සභිකයකු ලෙස තෝරා පත්කර ගනු නොලැබූ යම් අපේක්ෂකයකුට විරුද්ධව මේ වගන්තිය යටතේ වූ නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් නීතිපතිවරයාගේ අනුමතය ඇතිව හැර පවරනු නො ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ වූ ඡන්ද විමසීමක දී සභිකයකු ලෙස තෝරා පත්කර ගනු නොලැබූ යම් අපේක්ෂකයකුට විරුද්ධව ඒ ඡන්ද විමසීම හා සම්බන්ධ නීති විරෝධී ක්‍රියාවකට 88 වන වගන්තිය යටතේ නඩු පවරනු ලැබීම, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අතුරින් කිසිවකින් නිවාරණය වෙතැයි හෝ වළක්වනු ලැබෙතැයි සලකනු නොලැබිය යුතු ය; නැතහොත් එසේ අර්ථ නිරූපණය කරනු නොලැබිය යුතු ය.

90. 66 වන වගන්තියේ සිට 89 වන වගන්තිය දක්වා වූ වගන්තිවල (දෙක ම ඇතුළුව) සඳහන් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට ඒ වරද සඳහා නියමිත වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව ඔහු වරදකරු කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාල සීමාවක් සඳහා යම් සංවර්ධන සභාවකට තෝරා පත්කර ගනු ලැබීමෙන් හෝ එහි අසුන් ගැනීමෙන් හෝ සභිකයකු වශයෙන් ඡන්දය දීමෙන් හෝ නුසුදුස්සකු කරනු ලැබිය යුතු ය. ඇතැම් වැරදි සඳහා අතිරේක දණ්ඩන.

## VII වන කොටස

### පොදු විධිවිධාන

91. ඡන්ද විමසීම්වලට අදාළ මේ පනතේ දක්වා ඇති විධිවිධානවලින් නියමිත ප්‍රතිපත්තිවලට අනුකූලව ඡන්ද විමසීම පවත්වනු ලැබූ බව සහ එහි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම ඡන්ද විමසීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපා නොමැති බව පෙනී යන්නේ නම්, ඒ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීමේ හේතුව නිසා කිසිම ඡන්ද විමසීමක් අවලංගු නොවිය යුතු ය. පනතේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම.

92. සංවර්ධන සභාවක සභිකයකු ලෙස තෝරා පත් කර ගනු ලැබීමට පෙර වුව ද පසුව වුව ද ඡන්ද විමසීමක දී තෝරාපත් කර ගනු ලැබීම සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාමයෝජනා කර ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් මිය යාම හෝ අස්කර ගැනීම හෝ මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ තෝරා පත්කර ගනු ලැබීමට හෝ සභිකයකු වශයෙන් අසුන් ගැනීමට හෝ ඡන්දය දීමට හෝ නුසුදුස්සකු වීම නිසා ඒ පක්ෂයේ හෝ කණ්ඩායමේ නාමයෝජනා පත්‍රය අවලංගුවීම හෝ එය කෙරෙහි වෙනත් කවර හෝ ආකාරයකින් බලපෑමක් ඇතිවීම හෝ සිදු නොවිය යුතු ය. අපේක්ෂකයකු මිය යාම, අස්කර ගැනීම හෝ නුසුදුස්සකු වීම නිසා පක්ෂයේ හෝ කණ්ඩායමේ නාම යෝජනා පත්‍රය අවලංගු නොවිය යුතු බව.

තව ද, ඒ අනුව ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ මරණය, අස්කර ගැනීම හෝ නුසුදුසුවීම නිසා ම පමණක් ඒ පක්ෂය හෝ කණ්ඩායම විසින් ඒ නාමයෝජනා පත්‍රය මගින් නාමයෝජනා කරනු ලැබ ඇති වෙනත් යම් තැනැත්තකුගේ අපේක්ෂකත්වය හෝ තේරී පත්වීම අවලංගු නොවිය යුතු ය.

ඡන්ද පොළවල් ලෙස පාඨශාලා පාවිච්චි කිරීම.

**93.** (1) පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරන ලද මුදල් වලින් ආධාර මුදලක් ලබන හෝ ආධාර මුදලක් ප්‍රදානය කරනු ලැබූ යම් පාඨශාලාවක් හෝ පාඨශාලාවක යම් කොටසක් ඡන්ද පොළක් ලෙස ගාස්තුවක් නොමැතිව තේරීම් භාර නිලධරයා විසින් පාවිච්චි කරනු ලැබිය හැකි ය.

(2) ඉහත කී පරිදි එවැනි යම් පාඨශාලාවක හෝ එහි කොටසක් ඡන්ද පොළක් ලෙස පාවිච්චි කිරීම හේතුකොට ගෙන එයට සිදු වූ යම් අලාභයක් පියවීම හා එහි පාලනය භාර තැනැත්තන් විසින් දරන ලද යම් වියදමක් ගෙවීම තේරීම් භාර නිලධරයකු විසින් කළ යුතු ය.

පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම් හෝ කණ්ඩායම් නායකයා විසින් තමාගේම නියෝජිතයා ලෙස ක්‍රියා කිරීම හෝ තම නියෝජිතයාට සහායවීම හෝ කළ හැකි බව.

**94.** යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් යම් ඡන්ද ස්ථාන නියෝජිතයකු, ගණන් කිරීමේ නියෝජිතයකු හෝ වෙනත් නියෝජිතයකු පත්කරනු ලැබුවේ නම්, ඒ ඡන්ද ස්ථාන නියෝජිතයාට, ගණන් කිරීමේ නියෝජිතයාට හෝ වෙනත් නියෝජිතයාට කිරීමට නියමිත හෝ බලය දී ඇති යම් ක්‍රියාවක් හෝ යම් දෙයක් මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී තෝරා පත් කර ගනු ලැබීම සඳහා අපේක්ෂකයන් නාමයෝජනා කර ඇති ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ම හෝ එහි බලයලත් නියෝජිතයා විසින් ම නැතහොත් කණ්ඩායම් නායකයා විසින් ම කළ හැකි ය. නැතහොත් එවැනි යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමට එවැනි නියෝජිතයකුට සහාය විය හැකි ය. එහෙත් මේ වගන්තිය යටතේ ක්‍රියා කිරීමට පෙර, එවැනි නියෝජිතයකු විසින් 77 වන වගන්තිය යටතේ කළ යුතු යයි නියමිත ප්‍රකාශය, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ එහි බලයලත් නියෝජිතයා විසින් හෝ කණ්ඩායම් නායකයකු විසින් හෝ කළ යුතු ය.

පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායම් වල නියෝජිතයින් පැමිණ නොසිටීම.

**95.** මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නියෝජිතයා හෝ නියෝජිතයන් ඉදිරියෙහි යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමට නියමිතව හෝ බලය දී ඇති අවස්ථාවක, ඒ පක්ෂයේ හෝ කණ්ඩායමේ යම් නියෝජිතයකු හෝ නියෝජිතයන්, ඒ කාර්යය සඳහා නියමිත වේලාවට එසේ නියමිත ස්ථානයට පැමිණ නොසිටිය ද, ඒ ක්‍රියාව හෝ දෙය අන් සෑම අතින් ම යථා පරිදි කර ඇත්නම්, ඒ පැමිණ නොසිටීමෙන් ඒ ක්‍රියාව හෝ දෙය අවලංගු නොවිය යුතු ය.

**96.** මේ පනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දී ඇති කිසිම තැනැත්තකු විසින් තමා ඡන්දය දෙනු ලැබුවේ කවර පිළිගත් දේශපාලන පක්ෂයට ද නැතහොත් ස්වාධීන කණ්ඩායමට ද යන වග ප්‍රකාශ කිරීමට ඡන්ද විමසීම විවාදයට භාජන කරන යම් නඩු කටයුත්තක දී නියම කරනු නොලැබිය යුතු ය.

ඡන්දය දුන් ආකාරය හෙළි කිරීම නගතම් බව.

**97.** මේ පනත යටතේ හෝ එහි කාර්ය සඳහා හෝ පිළියෙල කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ යම් නාම ලේඛනයක, දැන්වීමක හෝ වෙනත් කවර හෝ ලේඛනයක නම් කර ඇති හෝ විස්තර කර ඇති යම් තැනැත්තකු හෝ ස්ථානයක් හඳුනාගත හැකි වන පරිදි ඒ නාම ලේඛනයෙහි, දැන්වීමෙහි හෝ ලේඛනයෙහි පෙන්වා ඇත්නම්, ඒ තැනැත්තා හෝ ස්ථානය පිළිබඳව එම නාම ලේඛනයේ, දැන්වීමේ හෝ වෙනත් ලේඛනයේ ඇති වැරදි නාමයකින් හෝ සාවද්‍ය විස්තරයකින් ඒ තැනැත්තා හෝ ස්ථානය සම්බන්ධයෙන් මේ පනත ක්‍රියාත්මක වීමෙහි ලා කිසිම ආකාරයක බලපෑමක් ඇති නොවන්නේ ය.

තැනැත්තන් හා ස්ථාන පිළිබඳ සාවද්‍ය විස්තර.

**98.** (1) යම් දැන්වීමක් පළ කරන ලෙස මේ පනතින් නියමිතව ඇත්තා වූ ද පළ කිරීමට නියමිත ක්‍රමයෙන් ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ඒ දැන්වීමට නොලැබෙන බව ඒ දැන්වීම පළ කරන ලෙස නියම කරනු ලැබූ බලධරයාගේ මතය වන්නා වූ ද අවස්ථාවක, මේ පනතින් නියමිත පරිදි දැන්වීම පළකිරීමට අතිරේකව දැන්වීම අදාල සංවර්ධන සභා ප්‍රදේශය ඇතුළත ප්‍රකටව පෙනෙන ස්ථානවල දැන්වීමෙහි පිටපත් ප්‍රදර්ශනය කිරීම හෝ ඊට ප්‍රසිද්ධිය ලබා දීම සඳහා අවශ්‍ය යයි තමා සලකන වෙනත් පියවර ගැනීම හෝ ඔහු විසින් කරනු ලැබිය හැකි ය.

දැන්වීම ආදිය පළ කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලධරයකු විසින් ප්‍රදර්ශනය කරන ලද යම් දැන්වීමක් හෝ මේ පනත අනුව පරීක්ෂණය සඳහා තබා ඇති යම් ලේඛනයක් නීත්‍යනුකූල අවසරයක් නොමැතිව විනාශ කරන, එහි කොටස් කපා හරින, එය විරූප කරන හෝ ඉවත් කරන සෑම තැනැත්තකු ම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට රුපියල් පණහක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

**99.** (1) ඡන්ද විමසීමක දී පෞද්ගලිකව ඡන්දය දීමට හිමිකම් ඇති වෙනත් යම් තැනැත්තකුගේ සේවායෝජකයකු වූ යම් තැනැත්තකු විසින්, ඒ වෙනත් තැනැත්තා ඡන්දය දීම පිණිස නිවාඩු දෙන ලෙස ලියවිල්ලකින් ඉල්ලීමක් කළ විට, ඒ ඡන්ද විමසීමේ දී ඔහුට පෞද්ගලිකව ඡන්දය දීමට හැකිවනු පිණිස ප්‍රමාණවත්

ඡන්දය දීමට හැකිවනු පිණිස සේවා නියුක්තයන්ම නිවාඩු දීම සේවා යෝජකයන්ගේ යුතුකම බව.

යයි ඒ තැනැත්තා විසින් සලකනු ලබන (පැය හතරකට නොඅඩු කාලයක) අඛණ්ඩ කාලයක් වැටුප් අහිමිවීමක් නොමැතිව ඒ වෙනත් තැනැත්තාට නිවාඩු දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි විධිවිධාන කඩකරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

ඡන්ද පොළවල් ලෙස පාවිච්චි කිරීම සඳහා ස්ථාන බලකර ලබා ගැනීම.

**100.** (1) 93 වන වගන්තියේ සඳහන් යම් පාඨශාලාවක් නොවන වෙනත් යම් ස්ථානයක්, ඡන්ද පොළක් ලෙස පාවිච්චි කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය බව කොමසාරිස්වරයා විසින් සලකනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ ස්ථානයෙහි නියම සන්තකය දරන තැනැත්තා නැතහොත් එසේ නියම සන්තකය දරන තැනැත්තකු නොමැති අවස්ථාවක, ඒ ස්ථානයෙහි අයිතිකරු අමතා භාර දෙනු ලබන ලියවිල්ලකින් වූ නියමයක් මගින් ඒ ස්ථානය ඒ කාර්යය සඳහා බලකර ලබාගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ස්ථානයක් බලකර ලබා ගනු ලැබූ අවස්ථාවක, ඒ බලකර ලබා ගැනීමේ කාලය සති හතරකට වැඩි නොවිය යුතු ය.

(3) මේ වගන්තියේ "ස්ථානය" යන්නෙන්, යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් අදහස් වන අතර, පැලක්, මඩුවක් හෝ ඉදිකිරීමක් නැතහොත් එහි යම් කොටසක් ද එයට ඇතුළත් වේ.

ස්ථානය බලකර ලබා ගැනීම සඳහා වන්දි ගෙවීම.

**101.** (1) 100 වන වගන්තිය යටතේ යම් ස්ථානයක් බලකර ලබා ගනු ලැබූ අවස්ථාවක, ඒ බලකර ලබා ගැනීමට පෙරාතුව ම ඒ ස්ථානයෙහි නියම සන්තකය දරූ තැනැත්තාට නැතහොත් එසේ නියම සන්තකය දැරූ තැනැත්තකු නොමැති අවස්ථාවක, ඒ ස්ථානයේ අයිතිකරුට, තත් කාර්යය සඳහා පාර්ලිමේන්තුවෙන් ප්‍රතිපාදනය කරන ලද මුදල්වලින් එසේ බලකර ලබාගැනීම සඳහා කොමසාරිස්වරයා විසින් වන්දි ගෙවිය යුතු අතර, ඒ බලකර ලබාගත් කාලය ඇතුළත ඒ ස්ථානයට සිදුවූ යම් අලාභයක් ද පියවිය යුතු ය.

(2) යම් ස්ථානයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි ප්‍රමාණය—

(අ) ඒ ස්ථානය සම්බන්ධයෙන් ගෙවිය යුතු කුලිය හෝ එසේ ගෙවිය යුතු කුලියක් නොමැති අවස්ථාවක, ප්‍රදේශයෙහි ඒ හා සමාන ස්ථානයකට ගෙවිය යුතු කුලිය ; සහ

(ආ) ඒ ස්ථානය බලකර ලබා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් බලකර ලබා ගැනීමට පෙරාතුව ම ඒ ස්ථානයෙහි නියම සන්තකය දරූ තැනැත්තාට ඔහුගේ පදිංචි ස්ථානය හෝ ව්‍යාපාර ස්ථානය වෙනස් කිරීමට නියම වූයේ නම්, ඒ වෙනස් කිරීමට ආනුෂංගික වූ යම් සාධාරණ වියදමක් වේ නම් ඒ වියදම

කෙරෙහි සැලකිලිමත්ව තීරණය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වන්දි ලැබීමට හිමිකම් ඇති යම් තැනැත්තකු වන්දි ප්‍රමාණය සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත්වන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ තීරණයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත ලියවිල්ලකින් අභියාචනයක් කළ හැකි ය.

**102.** (අ) මේ පනත යටතේ ඡන්දය විමසීම පැවැත්වීම පරිපාලනමය වශයෙන් පොදුවේ මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය ; කොමසාරිස්වරයාගේ බලතල.

(ආ) මේ පනතෙහි විධිවිධාන සාර්ථකව ක්‍රියාවෙහි යොදවනු ලබන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය යයි තමා සලකන යම් විධාන, නියෝජ්‍ය හා සහකාර කොමසාරිස්වරයන්ට, තේරීම් භාර නිලධරයන්ට, ඡන්ද ස්ථානාධිපතිවරයන්ට, වෙනත් ඡන්ද විමසීම් නිලධරයන්ට නිකුත් කිරීමට කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය ;

(ඇ) මේ පනතින් හෝ මේ පනත යටතේ තමා වෙත පැවරී ඇත්තා වූ සහ නියම වී ඇත්තා වූ වෙනත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටුකිරීම කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය යුතු ය.

**103.** මේ පනතේ කවර හෝ විධිවිධානයක් ප්‍රථමවරට ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් දුෂ්කරතාවක් උද්ගත වුවහොත්, යම් විශේෂ හෝ අනපේක්ෂිත කාරණයක් සඳහා විධිවිධාන සැලැස් වීමේ නැතහොත් යම් ප්‍රශ්නයක් හෝ කාරණයක් තීරණය කිරීම දුෂ්කරතා ඉවත් කිරීම.

පිණිස හෝ සැකසුම් කිරීම පිණිස මේ පනතින් විධිවිධාන සලසා නොමැත්තේ ද නැතහොත් ඵලදායී ලෙස විධිවිධාන සලසා නොමැත්තේ ද ඒ ප්‍රශ්නය හෝ කාරණය තීරණය කිරීම පිණිස හෝ සැකසුම් කිරීම පිණිස විධිවිධාන සැලැස්වීමේ අදහස ඇතිව අවශ්‍ය යයි තමා සලකන සියලු විධාන, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

104. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අනුමත කරන ලද ලකුණ" යන්නෙන්, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ලකුණක් අදහස් වේ;

"අපේක්ෂකයා" යන්නෙන්, පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් හෝ ඡන්ද විමසීමක දී අපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරන ලද තැනැත්තෙක් අදහස් වේ;

"කොමසාරිස්වරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද මැතිවරණ කොමසාරිස්වරයා අදහස් වේ;

"දිසා ලේකම්වරයා" යන්නෙන්, 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ 48 වන වගන්තිය යටතේ පරිපාලන දිස්ත්‍රික්කයකට පත් කරනු ලබන දිසා ලේකම්වරයා අදහස් වේ;

"ඡන්ද හිමි නාම ලේඛනය" යන්නෙන්, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ සහතික කරනු ලැබූ ඡන්ද හිමි නාම ලේඛනය අදහස් වේ;

"ඡන්ද විමසීම" යන්නෙන්, සංවර්ධන සභා සභිකයන් තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා වූ ඡන්ද විමසීමක් අදහස් වේ;

"ඡන්දදායකයා" යන්නෙන්, ඡන්ද හිමි නාමලේඛනයක තමාගේ නම ඇතුළත්ව තිබුණ ද නොතිබුණ ද මැතිවරණයක දී ඡන්දය දීමට ඉල්ලුම් කරන හෝ ඡන්දය දෙන තැනැත්තෙක් අදහස් වේ;

"සංවර්ධන සභාව" යන්නෙන්, 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද සංවර්ධන සභාවක් අදහස් වේ;

"සභිකයා" යන්නෙන්, සංවර්ධන සභාවක තෝරා පත් කර ගන්නා ලද සභිකයකු අදහස් වේ.

## පළමුවන උපලේඛනය

"අ" ආකෘතිය

13 වන වගන්තිය

## නාම යෝජනා පත්‍රයේ ආකෘතිය

....................සංවර්ධන සභාව සඳහා වූ නාම යෝජනා පත්‍රයයි

පිළිගත් දේශපාලන පක්ෂයක්/*ස්වාධීන අපේක්ෂක කණ්ඩායමක් වන..............විසින්, මෙහි පහත නම් සඳහන් තැනැත්තන්, ඔවුන්ගේ නම් සඳහන් කර ඇති ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව, ඉහත සඳහන් සංවර්ධන සභාවට සභිකයන් තෝරා පත්කර ගැනීම සඳහා අපේක්ෂක යන් වශයෙන්, මෙයින් නාම යෝජනා කරනු ලැබේ.

| (1) | (2) | (3) | (4) |
|---|---|---|---|
| අපේක්ෂකයාගේ නම | ලිපිනය | රක්ෂාව | තමාගේ කැමැත්ත දක්වන සහ තෝරා පත්කර ගැනීම සඳහා කිසිම නුසුදුසුකමකට තමා යටත් නොවන බවට අපේක්ෂකයාගේ අත්සන. |
| | | | |

................................ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ගේ/*කණ්ඩායම් නායකයාගේ අත්සන..............

නම : ........................................

ලිපිනය : ........................................

........................................

........................................

ඉහත නම් සඳහන් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්/*කණ්ඩායම් නායකයා වන ........................ විසින් 19...ක්වූ ...........මස......වන දින වූ මෙදින.........දී මා ඉදිරියේ අත්සන් තබන ලදී.

........................................

සමාදාන විනිශ්චයකාරවරයා හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයා.

* අදාළ නොවන වචන කපා හරින්න

"ආ" ආකෘතිය

18 වන වගන්තිය

**සභිකයන් තරඟයක් නොමැතිව තෝරා පත්කර ගනු ලැබූ අවස්ථාවක වාර්තාව**

පිළිගත් දේශපාලන පක්ෂයක් වන ..........................පක්ෂයේ/*ස්වාධීන අපේක්ෂක කණ්ඩායමක් වන ..........................කණ්ඩායමේ පහත සඳහන් සාමාජිකයන් .................................. සංවර්ධන සභාව සඳහා නිතරඟයෙන් තෝරා පත්කර ගනු ලැබූ බව මම මෙයින් සහතික කරමි.

| තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයාගේ නම | ලිපිනය |
| --- | --- |
| .................................................... | .................................................... |
| .................................................... | .................................................... |
| .................................................... | .................................................... |
| .................................................... | .................................................... |
| .................................................... | .................................................... |

........................සංවර්ධන සභාවේ සභාපති වශයෙන්.............................. තෝරාපත් කරගන්නා ලදයි ප්‍රකාශයට පත්කරන ලද බව මම තවදුරටත් සහතික කරමි.

...............................................

දිනය.................. තේරීම් භාර නිලධරයා.

* අදාළ නොවන වචන කපා හරින්න.

---

"ඇ" ආකෘතිය

30 වන වගන්තිය

ඡන්ද පත්‍රිකාවේ ඉදිරිපස ආකෘතිය

<table>
<tr><td rowspan="6">උප පත්‍රිකා අංකය :—<br><br>සැලකිය යුතුයි :<br><br>ඡන්ද පත්‍රිකාවේ පසු පස ඇති අංකයට අනුරූප වූ අංකයක් උප පත්‍රිකාවේ තිබිය යුතුය. එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ නම සහ 'ස්වාධීන කණ්ඩායම' යන වචන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් මුද්‍රණය කළ යුතු ය.</td><td>"අ" පක්ෂය</td><td>*</td></tr>
<tr><td>"ආ" පක්ෂය</td><td>*</td></tr>
<tr><td>"ඇ" පක්ෂය</td><td>*</td></tr>
<tr><td>1 වන ස්වාධීන කණ්ඩායම</td><td>*</td></tr>
<tr><td>2 වන ස්වාධීන කණ්ඩායම</td><td>*</td></tr>
<tr><td>3 වන ස්වාධීන කණ්ඩායම</td><td>*</td></tr>
</table>

* එක් එක් පක්ෂයේ හෝ කණ්ඩායමේ ලකුණ මෙහි මුද්‍රණය කරන්න.

"ඇ" ආකෘතිය

36 වන වගන්තිය

**36 වන වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකා භාර නොදෙනු ලැබූ ඡන්දදායකයන්ගේ ලැයිස්තුව**

.................................සංවර්ධන සභාව

මැතිවරණ කොට්ඨාසයේ අංකය : ..............................................................

ඡන්ද ප්‍රදේශය : ..............................................................

ඡන්ද කොට්ඨාසය : ..............................................................

ඡන්ද පොළ : ..............................................................

ඡන්ද විමසීම පවත්වන ලද දිනය : ..............................................................

| ඡන්ද හිමි නාමලේඛනයේ ඡන්ද දායකයාගේ අංකය | ඡන්දදායකයාගේ නම | ඡන්ද පත්‍රිකාව භාර නොදීමට හේතුව | | |
|---|---|---|---|---|
| | | උචිත පරීක්ෂණය ප්‍රතික්ෂේප කරයි | උචිත ලකුණින් කලින් සලකුණු කර තිබේ. | උචිත ලකුණින් සලකුණු කරනු ලැබීම ප්‍රතික්ෂේප කරයි. |
| | | | | |

.........................................................

ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන.

"ඉ" ආකෘතිය

41 වන වගන්තිය

**ප්‍රකාශය**

.................................සංවර්ධන සභාව

.............................................................................................. (ලිපිනය)

පදිංචි.............................................................................................. (සම්පූර්ණ නම)

වන මම, මේ සංවර්ධන සභා ප්‍රදේශය සඳහා 5 වන වගන්තිය යටතේ දනට බලපැවැත්වෙන ඡන්දහිමි නාම ලේඛනයේ "අ, ආ" වශයෙන් නම දක්වෙන තැනැත්තා මා බව, මෙයින් ප්‍රකාශ කරමි.

.........................................................

ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ.

19...... ක් වූ ...................... මස ......... වන දින වූ මෙදින
මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

.........................................................

(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන.)

මැතිවරණ කොට්ඨාසයේ අංකය : ..............................................................

ඡන්ද ප්‍රදේශය : ..............................................................

ඡන්ද කොට්ඨාසය : ..............................................................

ඡන්ද පොළ : ..............................................................

"ඊ" ආකෘතිය

41 වන වගන්තිය

**ප්‍රකාශය**

................................සංවර්ධන සභාව

.......................................................................................... (ලිපිනය)

පදිංචි........................................................................................(සම්පූර්ණ නම)
වන මම, මේ සංවර්ධන සභාව සඳහා සභිකයින් තෝරා පත් කර ගැනීම සඳහා වන මේ ඡන්ද විමසීමේ දී මෙහි දී හෝ වෙනත් ස්ථානයක දී ඡන්දය දී නොමැති බව මෙයින් ප්‍රකාශ කරමි.

...................................................
(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ.)

19......ක් වූ ....................... මස ......... වන දින වූ මෙදින
මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

...............................................
(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන.)

නැතිවරණ කොට්ඨාශයේ අංකය :..................

ඡන්ද ප්‍රදේශය : ...........................................................................................

ඡන්ද කොට්ඨාශය : ....................................................................................

ඡන්ද පොළ : ...............................................................................................

---

"උ" ආකෘතිය

41 වන වගන්තිය

**ප්‍රකාශය**

................................සංවර්ධන සභාව

.......................................................................................... (ලිපිනය)

පදිංචි........................................................................................(සම්පූර්ණ නම)
වන මම, මේ සංවර්ධන සභාව සඳහා සභිකයින් තෝරා පත්කර ගැනීම සඳහා වන මේ ඡන්ද විමසීමේ දී ඡන්දය දීමට නීතියෙන් අශක්‍යතාවකට පත්ව හෝ නුසුදුසු බවට පත්ව නොමැති බව මෙයින් ප්‍රකාශ කරමි.

...................................................
(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ.)

19......ක් වූ ....................... මස ......... වන දින වූ මෙදින
මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

...............................................
(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන.)

නැතිවරණ කොට්ඨාශයේ අංකය : ............................................................

ඡන්ද ප්‍රදේශය : ...........................................................................................

ඡන්ද කොට්ඨාශය : ....................................................................................

ඡන්ද පොළ : ...............................................................................................

"ඍ" ආකෘතිය

43 වන වගන්තිය

ප්‍රකාශය

................................සංවර්ධන සභාව

......................................සංවර්ධන සභා ප්‍රදේශය සඳහා 5 වන වගන්තිය යටතේ බලපවත්නා ඡන්ද හිමි නාම ලේඛනයෙහි අංක ................ (අනුක්‍රමික අංකය) දරන.....................................................(නම) වශයෙන් නම් දක්වෙන තැනැත්තා මා බව ගම්භීරතා පූර්වකව ද අවංකව ද මම ප්‍රකාශ කරමි.

..............................................

(ඡන්දදායකයාගේ අත්සන හෝ මාපටැඟිලි සලකුණ.)

19..... ක් වූ ................................මස ......... වන දින වූ මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

..............................................

(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන)

මැතිවරණ කොට්ඨාසයේ අංකය : ..................................................

ඡන්ද ප්‍රදේශය : ..................................................

ඡන්ද කොට්ඨාසය : ..................................................

ඡන්ද පොළ : ..................................................

---

"එ" ආකෘතිය

43 වන වගන්තිය

................................සංවර්ධන සභාව

ද්විත්ව ඡන්ද ලැයිස්තුව

| ඡන්දදායකයාගේ අංකය | ඡන්දදායකයාගේ නම |
|---|---|
| | |

..............................................

(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන.)

දිනය : ..................................

මැතිවරණ කොට්ඨාසයේ අංකය : ..................................................

ඡන්ද ප්‍රදේශය : ..................................................

ඡන්ද කොට්ඨාසය : ..................................................

ඡන්ද පොළ : ..................................................

7 —ඒ 54793 (81/02)

"ඒ" ආකෘතිය

45 වන වගන්තිය

ඡන්ද පත්‍රිකා විස්තරය

....................................සංවර්ධන සභාව

මැතිවරණ කොට්ඨාසයේ අංකය : ....................................

ඡන්ද ප්‍රදේශය : ....................................

ඡන්ද කොට්ඨාසය : ....................................

ඡන්ද පොළ : ....................................

ලැබුණු ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව : ....................................

නරක් වූ ඡන්ද පත්‍රිකා හැර නිකුත් කරන ලද ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව : ....................................

නරක් වූ ඡන්ද පත්‍රිකා : ....................................

පාවිච්චි නොකරන ලද ඡන්ද පත්‍රිකා : ....................................

ලැබුණු ද්විත්ව ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව : ....................................

ඡන්දදායකයන්ට නිකුත් කරන ලද ද්විත්ව ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව : ....................................

පාවිච්චි නොකරන ලද ද්විත්ව ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව :....................................

....................................

(ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අත්සන.)

දිනය : ....................................

---

"ඔ." ආකෘතිය

60 වන වගන්තිය

ඡන්ද විමසීම පවත්වනු ලැබීමෙන් පසු කරනු ලබන වාර්තාව

මෙහි පහත නම් සඳහන් වන්නා වූ ද එක් එක් සභිකයාගේ නම ඉදිරියෙන් දක්වෙන පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද්දා වූ ද සභිකයින්, .................................... දින දී පවත්වන ලද ඡන්ද විමසීමේ දී ....................................සංවර්ධන සභාව සඳහා තෝරා පත් කර ගන්නා ලද බව මම මෙයින් සහතික කරමි.

| තෝරා පත්කර ගන්නා ලද සභිකයාගේ නම | සභිකයා නාම යෝජනා කළ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම |
|---|---|
| | |

ඉහත සඳහන් සංවර්ධන සභාවේ සභාපති වශයෙන්....................................
....................................තෝරා පත්කර ගන්නා ලදයි ප්‍රකාශයට පත් කරන ලද බව මම තවදුරටත් සහතික කරමි.

19.........ක් වූ .......................... මස ......... වන දින වූ මෙදින
.................................... දී ය.

....................................

තේරීම් භාර නිලධරයා.

"ඔ" ආකෘතිය

65 වන වගන්තිය

පුරප්පාඩුවක් පුරවනු ලැබීමෙන් පසු කරනු ලබන වාර්තාව

පිළිගත් දේශපාලන පක්ෂයක් /*ස්වාධීන අපේක්ෂක කණ්ඩායමක් වන.................... ....................................විසින් භාර දෙන ලද නාම යෝජනා පත්‍රයේ නම් සඳහන් ...............................................සංවර්ධන සභාව සඳහා සභිකයකු වශයෙන් 1981 සංවර්ධන සභා ඡන්ද විමසීම් පනතේ 65 වන වගන්තිය ප්‍රකාර තෝරා පත්කර ගන්නා ලදයි ප්‍රකාශයට පත් කරන ලද බව මම මෙයින් සහතික කරමි.

19......... ක් වූ .............................. මස ......... දින වූ

මෙදින...................................දී ය.

..................................................................

තේරීම් භාර නිලධරයා.

*අදාළ නොවන වචන කපා හරින්න.

"ක" ආකෘතිය

77 වන වගන්තිය

රහස්‍යතා ප්‍රකාශයේ ආකෘතිය

.................................................සංවර්ධන සභාව සඳහා වූ මේ ඡන්ද විමසීමේ දී, මට කියවා දෙන ලද 1981 සංවර්ධන සභා ඡන්ද විමසීම් පනතේ 77 වන වගන්තියෙන් තහනම් කරනු ලැබ ඇති කිසිවක් නොකරන බවට, මම, ගම්භීර හා පූර්වකව පොරොන්දු වී ප්‍රකාශ කරමි.

..................................................................

ප්‍රකාශකයාගේ අත්සන.

19......... ක් වූ ................................ මස ......... වන දින වූ

මෙදින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

..................................................................

ප්‍රකාශය ලබාගන්නා තැනැත්තාගේ අත්සන.

සැලකිය යුතුයි.—ප්‍රකාශය ලබා ගන්නා තැනැත්තා විසින්, වගන්තිය ප්‍රකාශකට කියවා දෙනු ලැබිය යුතුයි.

8—ඒ 54793 (81/02)

දෙවන උපලේඛනය

(24 වන වගන්තිය)

1981 තැපැල් ඡන්දදායකයන් පිළිබඳ (සංවර්ධන සභා ඡන්ද විමසීම්) නියෝග

ලුහුඩු නාමය.

1. මේ නියෝග 1981 තැපැල් ඡන්දදායකයන් පිළිබඳ (සංවර්ධන සභා ඡන්ද විමසීම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

අර්ථ නිරූපණය.

2. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල කාර්යය සඳහා—

'' නිකුත් කිරීම '' යන්නට, මුල් නිකුත් කිරීම සහ පසුව කෙරෙන යම් නිකුත් කිරීමක් ඇතුළත් වේ ;

'' තැපැල් ඡන්ද පත්‍රිකාව '' යන්නෙන්, තැපැල් ඡන්දදායකයකුට නිකුත් කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් අදහස් වේ ;

'' තැපැල් ඡන්දදායකයා '' යන්න ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ ඡන්ද විමසීමේ කාර්යය සඳහා තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තකු ඉන් අදහස් වේ ;

'' උපලේඛනය '' යන්නෙන්, මේ නියෝගවල උපලේඛනය අදහස් වේ ;

'' පනත '' යන්නෙන් 1981 සංවර්ධන සභා ඡන්ද විමසීම් පනත අදහස් වේ.

තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීමේ ආකෘතිය .

3. තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා වූ ඉල්ලීමක් උපලේඛනයේ '' අ '' ආකෘතියට සාරානුකූල විය යුතු ය.

තැපැල් ඡන්දදායකයන් පිළිබඳ වාර්තාව හා ඔවුන්ගේ ලැයිස්තුව.

4. (1) මේ නියෝගයේ විධිවිධානවලට යටත්ව, පනත යටතේ තේරීම් භාර නිලධරයා විසින් තබාගනු ලබන තැපැල් ඡන්දදායකයන් පිළිබඳ වාර්තාව සහ ඔවුන්ගේ ලැයිස්තුව පහසුයයි ඔහුට පෙනී යන ආකෘතියක විය යුතු අතර, තේරීම් භාර නිලධරයා විසින් නිරණය කරනු ලැබිය හැකි යම් සංඛ්‍යාවක් තබාගනු ලැබිය හැකිය.

(2) තැපැල් ඡන්දදායකයකුගේ ඡන්ද පත්‍රිකාවක් යවනු ලැබිය යුතු ලිපිනය තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි ඔහුගේ නමට ඉදිරියෙන් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(3) තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි හෝ එම ලැයිස්තුවේ එක් එක් කොටසක ඇති නම්වලට අනුගාමීකව අංක යෙදිය යුතු ය.

(4) තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුව පිළියෙල කරනු ලැබූ වහාම, තේරීම් භාර නිලධරයා විසින්, එහි පිටපතක් පරීක්ෂණය සඳහා තම කාර්යාලයේ තැබීමෙන්, එය ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකාවේ ආකෘතිය.

5. තැපැල් ඡන්ද පත්‍රිකාවක්, තැපැල් ඡන්දදායකයන් නොවන ඡන්දදායකයන් හට භාරදෙනු ලබන ඡන්ද පත්‍රිකාවල ආකෘතියෙහිම සහ ඒ ඡන්ද පත්‍රිකාවලින් වෙන්ව හඳුනාගත නොහැකි පරිදි විය යුතු ය.

අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය.

6. තැපැල් ඡන්දදායකයකුට ඔහුගේ තැපැල් ඡන්ද පත්‍රිකාව සමග යවනු ලබන අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය, උපලේඛනයේ '' ආ '' ආකෘතියට සාරානුකූල විය යුතු ය.

ලිපිකරුවන් පත් කිරීම.

7. තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතුවල දී තේරීම් භාර නිලධරයාට ලිපිකරුවන් වශයෙන් සහාය වීම සඳහා තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ඡන්ද විමසීමේ දී හෝ ඡන්ද විමසීම සම්බන්ධයෙන් අපේක්ෂකයකු විසින් හෝ ඔහු වෙනුවෙන් සේවයෙහි නියුක්ත කරනු ලැබූ කිසිම තැනැත්තකු එසේ පත් කරනු නොලැබිය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ දී හා භාරගැනීමේ දී පැමිණ සිටීමට හිමිකම ඇති තැනැත්තෝ.

8. (1) (අ) තෝරීම් භාර නිලධරයා සහ ඔහුගේ ලිපිකරුවන් ;

(ආ) බලයලත් නියෝජිතයකු හෝ කණ්ඩායම් නායකයකු ;

(ඇ) බලයලත් නියෝජිතයකු හෝ කණ්ඩායම් නායකයකු විසින් තමා වෙනුවට පැමිණ සිටීම පිණිස පත් කරනු ලැබූ තැනැත්තකු, සහ

(ඈ) මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් නියෝජිතයන් නොවන කිසිම තැනැත්තකුට තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතුවල දී පැමිණ සිටිය නොහැකි ය.

(2) තැපැල් ඡන්ද පත්‍රිකා කාණ්ඩ දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකවර නිකුත් කළ යුතු අවස්ථාවක, එක් එක් බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් එක් නියෝජිතයකු බැගින් හෝ ඒ බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් පත් කරනු ලැබීමට තෝරීම් භාර නිලධරයා විසින් බලය දෙනු ලැබිය හැකි සංඛ්‍යාවක් දක්වා වූ ද ඒ කාණ්ඩ සංඛ්‍යාව නොඉක්මවන්නා වූ ද නියෝජිතයන් වැඩි ගණනක් පත් කරනු ලැබිය හැකි ය. එසේ වුව ද, එක් එක් බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා සම්බන්ධයෙන් බලය දෙනු ලැබූ නියෝජිතයන් ගණන සමාන විය යුතු ය.

(3) මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ පත් කරන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපින දක්වෙන පත් කිරීමේ දැන්වීම, තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම සඳහා නියමිත වේලාවට කලින් බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් තෝරීම් භාර නිලධරයාට දෙනු ලැබිය යුතු ය.

(4) නියෝජිතයකු මිය ගියහොත් හෝ ඔහුට ක්‍රියා කිරීමට නොහැකි වුවහොත් බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින් ඔහු වෙනුවට වෙනත් නියෝජිතයකු පත් කරනු ලැබිය හැකි අතර, පත් කරන ලද නියෝජිතයාගේ නම සහ ලිපිනය පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක් තෝරීම් භාර නිලධරයාට වහාම දෙනු ලැබිය යුතු ය.

(5) නියෝජිතයන් පත් කිරීම හා ඔවුන් පත් කිරීම පිළිබඳ දැන්වීම් තෝරීම් භාර නිලධරයාට දීම බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා හෝ විසින් ම කරනු ලැබීම වෙනුවට නාමයෝජනා පත්‍රයේ දෙවනුව නම සඳහන් අපේක්ෂකයා විසින් කරනු ලැබිය හැකි ය.

(6) මේ නියෝගවල නියෝජිතයන් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම්, ස්වකීය පත්වීම් යථා පරිදි කරනු ලැබූ හා දැනුම් දෙනු ලැබූ නියෝජිතයන් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් වශයෙන් ද, මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ පත් කරන ලද නියෝජිතයන් සම්බන්ධයෙන් වන විට, තෝරීම් භාර නිලධරයා විසින් බලය දෙන ලද සංඛ්‍යාව ඇතුළත වූ නියෝජිතයන් සම්බන්ධයෙන් වූ සඳහන් කිරීම් වශයෙන් ද තේරුම් ගනු ලැබිය යුතු ය.

(7) බලයලත් නියෝජිතයකු හෝ කණ්ඩායම් නායකයකු හෝ විසින් තමාගේ යම් නියෝජිතයකු පත් කරනු ලැබුවහොත්, ඒ නියෝජිතයාට කිරීමට බලය දෙනු ලැබිය හැකි වූ යම් ක්‍රියාවක් හෝ දෙයක් බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් ම කිරීම හෝ එවැනි යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමෙහි ලා තමාගේ නියෝජිතයාට සහාය වීම හෝ කරනු ලැබිය හැකි ය.

(8) බලයලත් නියෝජිතයා, කණ්ඩායම් නායකයා හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ ඉදිරියෙහි යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමට මේ නියෝගවලින් නියමිතව හෝ බලය දී ඇති අවස්ථාවක, එවැනි යම් තැනැත්තකු හෝ තැනැත්තන් ඒ කාර්යය සඳහා නියමිත වේලාවට එසේ නියමිත ස්ථානයට පැමිණ නොසිටිය ද ඒ ක්‍රියාව හෝ දෙය අන් සෑම අතින්ම වලංගු පරිදි කර ඇත්නම් ඒ පැමිණ නොසිටීමෙන් ඒ ක්‍රියාව හෝ දෙය අවලංගු නොවිය යුතු ය.

රහස්‍යතා ප්‍රකාශය.

9. (1) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ කටයුතු සඳහා පැමිණ සිටින සෑම තැනැත්තකු විසින්ම, ඒ ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට පෙර උපලේඛනයේ ''ඇ'' ආකෘතියට සාරානුකූලව රහස්‍යතා ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ වූ ප්‍රකාශයක් තෝරීම් භාර නිලධරයා විසින් සමාදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට කරනු ලැබිය යුතු අතර වෙනත් යම් තැනැත්තකු විසින් එය කරනු ලබන විට එය තෝරීම් භාර නිලධරයා හෝ සමාදාන විනිශ්චයකාර වරයකු ඉදිරිපිට කරනු ලැබිය යුතු ය.

(3) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම පිළිබඳ කටයුතු සඳහා පැමිණ සිටින සෑම තැනැත්තකු විසින් ම ඡන්දය දීමේ රහස්‍යතාව රැක ගැනීම සහ රැක ගැනීමට ආධාර වීම කළ යුතු අතර—

(අ) නීතියෙන් බලය දෙනු ලැබූ යම් කාර්යයක් සඳහා හැර තැපැල් ඡන්ද පත්‍රිකා මත කරන ලද නිල ලකුණ පිළිබඳව ඒ කටයුතුවල දී ලබාගත් යම් තොරතුරක් ඡන්ද විමසීම අවසන් කරනු ලැබීමට පෙර යම් තැනැත්තකුට දැනුම් දීම ; හෝ

(ආ) නීතියෙන් බලය දෙනු ලැබූ යම් කාර්යයක් සඳහා හැර, තැපැල් ඡන්ද පත්‍රිකාවක පිටපැත්තේ සඳහන් අංකය පිළිබඳව ඒ කටයුතුවල දී ලබාගත් තොරතුරක් කවර හෝ විටක යම් තැනැත්තකුට දැනුම් දීම,

නොකළ යුතුය.

(4) මේ නියෝගයේ (3) වන ඡේදයේ විධිවිධාන කඩකරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම පිළිබඳ දැන්වීම.

10. (1) තේරීම් භාර නිලධරයා විසින් ඡන්ද විමසීමක නාමයෝජනා කාලසීමාවේ අවසන් දිනයට පසු දින දහයක් ඉකුත් වීමට පෙර, තමා විසින් තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කරනු ලබන වේලාව හා ස්ථානය සහ එකී නිකුත් කිරීමේ දී පැමිණ සිටීම පිණිස 8 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් පත් කරනු ලැබිය හැකි නියෝජිතයන් සංඛ්‍යාව, ඒ එක් එක් බලයලත් නියෝජිතයාට සහ කණ්ඩායම් නායකයාට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) තේරීම් භාර නිලධරයා විසින්, ඡන්ද පත්‍රිකා කිසිවක් පසුව නිකුත් කරනු ලබන අවස්ථාවක, තමා විසින් එසේ පසුව නිකුත් කරනු ලබන වේලාව හා ස්ථානය සහ නිකුත් කිරීමේ දී පැමිණ සිටීම පිණිස 8 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලයලත් නියෝජිතයා හෝ කණ්ඩායම් නායකයා විසින් පත් කරනු ලැබිය හැකි නියෝජිතයන් සංඛ්‍යාව, ඒ එක් එක් බලයලත් නියෝජිතයාට සහ කණ්ඩායම් නායකයාට හැකි පමණ ඉක්මණින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද පත්‍රිකා මත තැබිය යුතු නිල ලකුණ.

11. (1) එක් එක් තැපැල් ඡන්දදායකයා වෙත නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාව පිටිපස නිල ලකුණින් මුද්‍රා තැබීම හෝ නිල ලකුණ එහි සිදුරු කිරීම කරනු ලැබිය යුතුය. තවද ඒ ඒ ඡන්දදායකයාගේ නම සහ අංකය හඬ නගා කියවා, ඒ ඒ ඡන්දදායකයාගේ අංකය ඒ එක් එක් ඡන්ද පත්‍රිකාවේ උපපත්‍රිකාවෙහි ලකුණු කරනු ලැබිය යුතු ය. තවද, ඒ ඡන්ද පත්‍රිකාව ඔහුට නිකුත් කරන ලද බව දැක්වීම පිණිස, එහෙත් ඔහුට නිකුත් කරන ලද නිශ්චිත ඡන්ද පත්‍රිකාව කුමක්දැයි නොදක්වා, තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි ඒ ඡන්දදායකයාගේ අංකය ඉදිරියෙන් ලකුණක් තැබිය යුතු ය.

(2) තැපැල් ඡන්දදායකයකු වෙත නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාවේ උප පත්‍රිකාවෙහි ලකුණු කරනු ලැබිය යුතු ඒ ඡන්දදායකයාගේ අංකය, තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි සඳහන් ඒ ඡන්දදායකයාගේ අංකය විය යුතු ය.

(3) තැපැල් ඡන්දදායකයකු වෙත නිකුත් කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකාවෙහි මුද්‍රණය කර ඇති අංකය ඒ ඡන්දදායකයා වෙත යවනු ලබන අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතියෙහි ලකුණු කරනු ලැබිය යුතු ය. එසේ ලකුණු කරනු ලැබූ අංකය මෙහි මින් මතු "අනන්‍යතා ප්‍රකාශයෙහි ලකුණු කරන ලද අංකය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

තැපැල් ඡන්ද පත්‍රිකාව නිකුත් කිරීමට ප්‍රතික්ෂේප කිරීම.

12. තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවෙහි ඇතුළත් සටහන් දෙකක් එකම තැපැල් ඡන්දදායකයා සම්බන්ධයෙන් වන බවට තේරීම් භාර නිලධරයකු සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින් ඒ ඡන්දදායකයා වෙනුවෙන් එක තැපැල් ඡන්ද පත්‍රිකාවකට වැඩි ගණනක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

"ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි ලකුණු කරන ලද අංකය" යන යෙදුම සහ "ආවරණ ලියුම් කවරය" යන යෙදුම අර්ථ නිරූපණය කිරීම.

13. (1) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි ලකුණු කරන ලද අංකය, මේ නියෝගවල "ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි ලකුණු කරන ලද අංකය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) යථා පරිදි ලකුණු කොට ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි බහාලූ තැපැල් ඡන්ද පත්‍රිකාව සහ යථා පරිදි පුරවන ලද අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය ආපසු එවීම පිණිස වූ ලියුම් කවරය, මේ නියෝගවල "ආවරණ ලියුම් කවරය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

තැපැල් ඡන්දදායකයන් අමතා යවනු ලබන ලියුම් කවර තැපැල් කාර්යාලයට භාරදීම.

14. තැපැල් ඡන්දදායකයන් අමතා යවනු ලබන සියලුම ලියුම් කවර තේරීම් භාර නිලධරයා විසින් ගණන් කොට ළඟම පිහිටි තැපැල් කාර්යාලය වෙත නොපමාව භාර දෙනු ලැබිය යුතු අතර, එසේ භාර දෙන ලද ලියුම් කවර සංඛ්‍යාව සඳහන් කරමින් තේරීම් භාර නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලබන කුවිතාන්සි ආකෘතියක් තැපැල් ස්ථානාධිපතිවරයා විසින් තැපැල් කාර්යාලයේ දින මුද්‍රාවෙන් මුද්‍රා තබා, ඒ ලියුම් කවර අමතා ඇති තැනැත්තන් වෙත ඒවා භාරදීම සඳහා වහාම යවනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුව හා උප පත්‍රිකා මුද්‍රා තැබීම.

15. (1) තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම අවසන් කරනු ලැබීමෙන් පසු තේරීම් භාර නිලධරයා විසින්, හැකි ඉක්මණින් සහ බලයලත් නියෝජිතයන්ගේ සහ කණ්ඩායම් නායකයන්ගේ නියෝජිතයන් ඉදිරිපිට දී—

(අ) තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවේ ලකුණු කළ පිටපත් ; සහ

(ආ) නිකුත් කරන ලද තැපැල් ඡන්ද පත්‍රිකාවල උපපත්‍රිකා

වෙන වෙනම පැකැට්ටුවලට දමා ඒ පැකැට්ටු මුද්‍රා තබනු ලැබිය යුතු ය.

(2) තැපැල් ඡන්ද පත්‍රිකා පසුව නිකුත් කිරීමේ කාර්යය සඳහා තේරීම් භාර නිලධරයා විසින්, තැපැල් ඡන්දදායකයන්ගේ ලැයිස්තුවේ ලකුණු කරන ලද පිටපත් ඇතුළත් මුද්‍රා තබන ලද පැකැට්ටුව විවෘත කරනු ලැබිය හැකි අතර, නිකුත් කිරීම අවසන් වූ පසු මේ නියෝගයේ (1) වන ඡේදය අනුව ඒ පිටපත් නැවතත් පැකැට්ටුවලට දමා මුද්‍රා තබනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පෙට්ටි සැපයීම.

16. (1) තේරීම් භාර නිලධරයා විසින්, තැපැල් ඡන්ද දායකයන්ට තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමේ මුල් අවස්ථාවේ දී තැපැල් ඡන්ද දායකයන්ගෙන් ලැබිය හැකි ආවරණ ලියුම් කවර ලබාගැනීම සඳහා ඡන්ද පෙට්ටියක් හෝ ඡන්ද පෙට්ටි සැපයිය යුතු ය. එවැනි සෑම ඡන්ද පෙට්ටියක්ම පනතේ 54 වන වගන්තියේ කාර්යය සඳහා ඡන්ද පෙට්ටියක් ලෙස සැලකිය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදයෙහි සඳහන් සෑම ඡන්ද පෙට්ටියක්ම පැමිණ සිටින බලයලත් නියෝජිතයන්ගේ සහ කණ්ඩායම් නායකයන්ගේ නියෝජිතයන්ට විවෘතව හා හිස්ව පෙන්වා තේරීම් භාර නිලධරයාගේ මුද්‍රාවෙන් සහ ස්වකීය මුද්‍රා තැබීමට කැමති යම් නියෝජිතයන්ගේ මුද්‍රාවලින් මුද්‍රා තබා, "තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටිය" යන්න සහ ඡන්ද විමසීම පවත්වනු ලබන්නේ යම් සංවර්ධන සභාවක් සම්බන්ධයෙන් ද ඒ සංවර්ධන සභාවේ නම ද එහි ලකුණු කරනු ලැබිය යුතු අතර තේරීම් භාර නිලධරයා විසින් ඒ ඡන්ද පෙට්ටියේ සුරක්ෂිත භාරය සම්බන්ධයෙන් විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය.

තැපැල් ඡන්ද දායකයන්ගේ ආවරණ ලියුම් කවරය ලැබීම.

17. ඡන්ද විමසීම අවසන්වීමට පෙර ආවරණ ලියුම් කවරයක් ලැබුණු විට, තේරීම් භාර නිලධරයා විසින්, වහාම තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටිය තුළ එය විවෘත නොකොට බහාලිය යුතු ය.

ගණන් කිරීමේ නිලධරයෝ.

18. කොමසාරිස්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, තේරීම් භාර නිලධරයා විසින්, තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලබන ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ හෝ එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ ඡන්ද ගණන් කිරීම භාරව කටයුතු කිරීම සඳහා ගණන් කිරීමේ නිලධරයකු ද ඒ ගණන් කිරීමේ නිලධරයාගේ කාර්ය ඉටු කිරීමෙහි ලා ඔහුට සහාය වීම පිණිස සහායකයන්, ලිපිකරුවන් සහ වෙනත් නිලධරයන් යම් සංඛ්‍යාවක් ද පත් කළ යුතු අතර ඔහු විසින් ඒ පත්වීම් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

ගණන් කිරීම පිළිබඳ දැන්වීම.

19. ඡන්ද විමසීම අවසන් කළ පසු හැකි ඉක්මණින් තැපැල් ඡන්ද පත්‍රිකා මත වූ ඡන්ද ගණන් කිරීම සඳහා තේරීම් භාර නිලධරයා විසින් කටයුතු පිළියෙල කළ යුතු අතර තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලබන ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ හෝ එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ පිහිටීම හා ඒ ගණන් කිරීම ආරම්භ කරන දිනය සහ වේලාව පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක් ඡන්ද විමසීමෙහි දී තරග කරන එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට හෝ බලය ලත් නියෝජිතයාට සහ යම් ස්වාධීන කණ්ඩායමක කණ්ඩායම් නායකයාට තේරීම් භාර නිලධරයා විසින් දෙනු ලැබිය යුතු ය.

ගණන් කිරීමේ නියෝජිතයන් පත් කිරීම.

20. ඡන්ද විමසීමක දී යම් සංවර්ධන සභාවක් සඳහා අපේක්ෂකයන් නාම යෝජනා කර ඇති එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින්, තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කරනු ලබන එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයෙහි ඡන්ද ගණන් කරනු ලබන අවස්ථාවේ දී පැමිණ සිටීම සඳහා, ඒ ගණන් කිරීම ආරම්භ වීමට පෙර (මෙහි මින් මතු "ගණන් කිරීමේ නියෝජිතයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) නියෝජිතයන් දෙදෙනකුට නොවැඩි ගණනක් පත්කරනු ලැබිය හැකි ය. එසේ පත් කරන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපින ප්‍රකාශ කරන, ඒ පත් කිරීම් පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක්, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් හෝ එහි බලය ලත් නියෝජිතයා විසින් නැතහොත් කණ්ඩායම් නායකයා විසින් ගණන් කිරීම ආරම්භ වීමට පෙර ගණන් කිරීමේ නිලධරයාට දෙනු ලැබිය යුතු ය. යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ නම සහ ලිපිනය එසේ දැනුම් දී නොමැත්තේ ද ඒ ගණන් කිරීමේ නියෝජිතයා ගණන් කිරීමේ මධ්‍යස්ථානයට ඇතුළු කර ගැනීම ගණන්කිරීමේ නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

ගණන් කිරීමේ දී පැමිණ සිටීමට හිමිකම් ඇති තැනැත්තෝ.

21. ගණන් කිරීමේ නිලධරයා, ඔහුට සහාය වීම පිණිස පත් කරනු ලැබූ තැනැත්තන් සහ ගණන් කිරීමේ නියෝජිතයන් හැර වෙනත් කිසිම තැනැත්තකු ගණන් කිරීමේ නිලධරයාගේ අනුමතය ඇතිව මිස, ඡන්ද ගණන් කරනු ලබන අවස්ථාවේ දී පැමිණ නොසිටිය යුතු ය.

ගණන් කිරීමේ දී රහස්‍යතාව රැකගැනීම.

22. පනතේ 77 වන වගන්තියේ විධිවිධාන තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කිරීමේ කටයුතුවලට අදාළ විය යුතු ය.

තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටිය විවෘත කිරීම.

23. තැපැල් ඡන්දදායකයන්ගේ සෑම ඡන්ද පෙට්ටියක්ම, ගණන් කිරීමේ නිලධරයා විසින්, ඡන්ද විමසීම අවසන් කරනු ලැබීමෙන් පසුව සහ ඒ නිලධරයා ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට පෙර, ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිට දී විවෘත කරනු ලැබිය යුතු ය.

ආවරණ ලියුම් කවර විවෘත කිරීම.

24. (1) තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පෙට්ටියක් විවෘත කරනු ලැබූ අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින්, ආවරණ ලියුම් කවර සංඛ්‍යාව ගණන් කර සටහන් කර, ඉන් පසුව එක් එක් ආවරණ ලියුම් කවරය වෙන වෙනම විවෘත කරනු ලැබිය යුතු ය.

(2) ගණන් කිරීමේ නිලධරයා විසින් ආවරණ ලියුම් කවරයක් විවෘත කරනු ලැබ, එය තුළ —

(අ) (i) අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක්; හෝ

(ii) අනන්‍යතා ප්‍රකාශයක් සහ, ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක බහා නොමැති ඡන්ද පත්‍රිකාවක්; හෝ

(iii) අනන්‍යතා ප්‍රකාශයක් පමණක්; හෝ

(iv) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක බහා නොමැති ඡන්ද පත්‍රිකාවක් පමණක්; හෝ

(v) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් පමණක්

ඇති බව සොයා ගනු ලබන අවස්ථාවක නැතහොත්,

(ආ) කිසිවක් නොමැති බව සොයා ගනු ලබන අවස්ථාවක

මේ නියෝගයේ අනුයාත විධිවිධාන අදාළ විය යුතු ය.

(3) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (i) අනුඡේදයෙහි සහ (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථා සම්බන්ධයෙන් වන විට, ගණන් කිරීමේ නිලධරයා විසින්, අනන්‍යතා ප්‍රකාශය යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලබා ඇති බවටත්, පූර්වෝක්ත (අ) (i) අනුඡේදයෙහි සඳහන් අවස්ථා සම්බන්ධයෙන් වන විට, අනන්‍යතා ප්‍රකාශයෙහි ලකුණු කර ඇති අංකය, ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි ලකුණු කර ඇති ඒ හා සමාන අංකයට ද, පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයේ සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට අනන්‍යතා

ප්‍රකාශයෙහි ලකුණු කර ඇති අංකය ඡන්ද පත්‍රිකාවෙහි ලකුණු කර ඇති ඒ හා සමාන අංකය කටද අනුරූප වන බවටත් තමා ම සෑහීමකට පත් විය යුතු ය. ඔහු එසේ සෑහීමකට පත් වන්නේ නම්, ඔහු විසින් ඒ ප්‍රකාශය (මෙහි මින් මතු "අනන්‍යතා ප්‍රකාශ සඳහා වූ බඳුන" යනුවෙන් සඳහන් කරනු ලබන)වෙනම බඳුනකට ද පූර්වෝක්ත (අ) (i) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඡන්ද පත්‍රිකා ලියුම් කවරය සහ පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඡන්ද පත්‍රිකාව (මෙහි මින් මතු "තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුන" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් බඳුනකට ද දැමිය යුතු ය.

(4) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (i) අනුඡේදයෙහි සහ (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථා සම්බන්ධයෙන් වන අවස්ථාවක, මේ නියෝගයේ (3) වන ඡේදය මගින් නියමිත පරිදි ගණන් කිරීමේ නිලධරයා සෑහීමකට පත් නොවන විටක ඔහු විසින්—

(අ) " අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී " යන වචන අනන්‍යතා ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබිය යුතු ය ;

(ආ) ඒ ප්‍රකාශය, පැමිණ සිටින යම් ගණන් කිරීමේ නියෝජිතයකුට පෙන්වනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන් කිරීමේ නිලධරයා විසින් ගන්නා ලද තීරණයට යම් නියෝජිතයකු විසින් යම් විරෝධය පෑමක් කරන ලද්දේ නම්, ඉහතින් වූ (අ) අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයෙහි සටහන් කරන ලද වචනවලට " ප්‍රතික්ෂේප කිරීමට විරෝධය පාන ලදී " යන වචන එකතු කරනු ලැබිය යුතු ය

(ඇ) පූර්වෝක්ත (අ) (i) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඡන්ද පත්‍රිකා ලියුම් කවරය, නැතහොත් පූර්වෝක්ත (අ) (ii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඡන්ද පත්‍රිකාව, ඒ ප්‍රකාශයට ඇමිණිය යුතු ය ; තව ද

(ඈ) ඒ ප්‍රකාශය සහ ඉහතින් වූ (ඇ) අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයට අමුණා ඇති ලේඛන (මෙහි මින්මතු " තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුන " යනුවෙන් සඳහන් කරනු ලබන) බඳුනකට දැමිය යුතු ය.

(5) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (iii) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ගණන් කිරීමේ නිලධරයා විසින් " අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම ඡන්ද පත්‍රිකාවක් සහ කිසිම ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් ලැබී නැත." යන වචන අනන්‍යතා ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබිය යුතු අතර. ඒ ප්‍රකාශය, තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(6) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (iv) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ගණන් කිරීමේ නිලධරයා විසින්, " ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම අනන්‍යතා ප්‍රකාශයක් ලැබී නැත." යන වචන ඡන්ද පත්‍රිකාවෙහි සටහන් කරනු ලැබිය යුතු අතර, ඡන්ද පත්‍රිකාව, තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(7) මේ නියෝගයේ (2) වන ඡේදයේ (අ) (v) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට අනන්‍යතා ප්‍රකාශයක් ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි බහා ඇත්දැයි නිසැකවම දැන ගැනීම පිණිස ගණන් කිරීමේ නිලධරයා විසින්, ඒ ලියුම් කවරය විවෘත කරනු ලැබිය යුතු ය.

(8) මේ නියෝගයේ (7) වන ඡේදය යටතේ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය විවෘත කරනු ලැබූ කල්හි, අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකාවක් ඒ ලියුම් කවරය තුළ ඇත්නම්, ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ ප්‍රකාශය යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලබා ඇති බවටත්, අනන්‍යතා ප්‍රකාශයෙහි ලකුණු කර ඇති අංකය, ඒ ඡන්ද පත්‍රිකාවෙහි ලකුණු කර ඇති ඒ හා සමාන අංකයකට අනුරූප වන බවටත් තමා ම සෑහීමට පත්විය යුතු අතර—

(අ) එසේ සෑහීමට පත්වන්නේ නම් ඒ ප්‍රකාශය අනන්‍යතා ප්‍රකාශ සඳහා වූ බඳුනට දැමිය යුතු අතර ඒ ඡන්ද පත්‍රිකාව තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනට දැමිය යුතු ය; තවද

(ආ) එසේ සෑහීමට පත් නොවන්නේ නම්—

(i) ඒ ප්‍රකාශයෙහි " අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී " යන වචන සටහන් කිරීම ;

(ii) ඒ ප්‍රකාශය පැමිණ සිටින ගණන් කිරීමේ නියෝජිතයන්ට පෙන්වනු ලැබිය යුතු අතර ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන් කිරීමේ නිලධරයා විසින් ගන්නා ලද තීරණයකට යම් නියෝජිතයකු විසින් යම් විරෝධය පෑමක් කරන ලද්දේ නම් ඉහතින් වූ (i) වන අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයෙහි සටහන් කරන ලද වචනවලට " ප්‍රතික්ෂේප කිරීමට විරෝධය පාන ලදී ." යන වචන එකතු කිරීම ;

(iii) ඒ ප්‍රකාශයට ඡන්ද පත්‍රිකා ලියුම් කවරය සහ ඒ ඡන්ද පත්‍රිකාව ඇමිණීම; සහ

(iv) ඒ ප්‍රකාශය සහ ඉහතින් වූ (iii) වන අනුඡේදය යටතේ ඒ ප්‍රකාශයට අමුණා ඇති ලේඛන තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමීම

කරනු ලැබිය යුතු ය.

(9) මේ නියෝගයේ (7) වන ඡේදය යටතේ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය විවෘත කරනු ලැබූ විට, එය තුළ—

(අ) අනන්‍යතා ප්‍රකාශයක් පමණක් ; හෝ

(ආ) ඡන්ද පත්‍රිකාවක් පමණක් ; හෝ

(ඇ) කිසිවක් නොමැති බව

ගණන් කිරීමේ නිලධරයා විසින් සොයාගනු ලැබුවහොත් ඔහු විසින්—

(i) ඉහතින් වූ (අ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ඒ ප්‍රකාශයෙහි " අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී, කිසිම ඡන්ද පත්‍රිකාවක් ලැබී නැත." යන වචන සටහන් කිරීම ;

(ii) ඉහතින් වූ (ආ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඒ ඡන්ද පත්‍රිකාවෙහි " ප්‍රතික්ෂේප කරන ලදී, කිසිම අනන්‍යතා ප්‍රකාශයක් ලැබී නැත." යන වචන සටහන් කිරීම ;

(iii) ඉහතින් වූ (ඇ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට ඡන්ද පත්‍රිකා ලියුම් කවරයෙහි "ප්‍රතික්ෂේප කරන ලදී, බහාලූ කිසිවක් ලැබී නැත." යන වචන සටහන් කිරීම ; සහ

(iv) අනන්‍යතා ප්‍රකාශයක් හෝ ඡන්ද පත්‍රිකාවක් හෝ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය තුළ තිබුණේ නම්, ඒ ප්‍රකාශය හෝ ඡන්ද පත්‍රිකාව ඒ ලියුම් කවරයට ඇමිණීම

කරනු ලැබිය යුතු අතර, ඡන්ද පත්‍රිකා ලියුම් කවරය සහ ඉහතින් වූ (iv) වන අනුඡේදය යටතේ ඒ ලියුම් කවරයට අමුණා ඇති යම් ලේඛනයක් හෝ ලේඛන වේනොත් ඒ ලේඛනය හෝ ලේඛන තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(10) (2) වන ඡේදයේ (ආ) අනුඡේදයෙහි සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, ගණන් කිරීමේ නිලධරයා විසින්, ආවරණ ලියුම් කවරයෙහි "ප්‍රතික්ෂේප කරන ලදී, බහාලූ කිසිවක් ලැබී නැත." යන වචන සටහන් කරනු ලැබිය යුතු අතර ඒ ලියුම් කවරය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනට දැමිය යුතු ය.

(11) අනන්‍යතා ප්‍රකාශයක්, ඒ අනන්‍යතා ප්‍රකාශය පිළිබඳ ආකෘතියේ පිටිපස සඳහන් උපදෙස් ප්‍රකාර අත්සන් කොට සාක්ෂි දරනු ලැබ ඇති නම් මිස, යථාපරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

ඡන්ද පත්‍රිකා ලියුම් කවර විවෘත කිරීම.

25. (1) 24 වන නියෝගය යටතේ වූ කටයුතු අවසානයේ දී, තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි තබා ඇති එක් එක් ඡන්ද පත්‍රිකා ලියුම් කවරය ගණන් කිරීමේ නිලධරයා විසින් වෙන වෙනම විවෘත කරනු ලැබිය යුතු ය.

(2) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක කිසිම ඡන්ද පත්‍රිකාවක් ඇතුළත් නොවන අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින් ඒ කවරයෙහි "කිසිම ඡන්ද පත්‍රිකාවක් බහා නොමැත" යන වචන සටහන් කොට එය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනෙහි දැමිය යුතු ය.

(3) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක ඡන්ද පත්‍රිකාවක් ඇතුළත් වන අවස්ථාවක, ගණන් කිරීමේ නිලධරයා විසින්—

(අ) ඒ ලියුම් කවරයෙහි ලකුණු කර ඇති අංකය, ඒ ඡන්ද පත්‍රිකාවෙහි ලකුණු කර ඇති ඒ හා සමාන අංකයකට අනුරූප වන්නේ නම්, ඒ ඡන්ද පත්‍රිකාව තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි දැමීම ; සහ

(ආ) ඒ ලියුම් කවරයෙහි ඡන්ද පත්‍රිකාවක් ඇතුළත් වන අතර ඒ ඡන්ද පත්‍රිකාවෙහි ලකුණු කර ඇති අංකය, ඒ ලියුම් කවරයෙහි ලකුණු කර ඇති අංකයට අනුරූප නොවන්නේ නම්, ඒ ලියුම් කවරයෙහි "ප්‍රතික්ෂේප කරන ලදී" යන වචන සටහන් කොට, ඒ ඡන්ද පත්‍රිකාව ඒ ලියුම් කවරයට අමුණා, එය තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනෙහි දැමීම

කරනු ලැබිය යුතු ය.

**26.** 25 වන නියෝගය යටතේ වූ කටයුතු අවසානයේ දී, ගණන් කිරීමේ නිලධරයා විසින්, තැපැල් ඡන්දදායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සඳහා වූ බඳුනෙහි ඇතුළත් දේ සහ අනන්‍යතා ප්‍රකාශය සඳහා වූ බඳුනෙහි ඇතුළත් දේ වෙන වෙනම පැකැට්ටු දෙකක බහා ඒ පැකැට්ටු මුද්‍රා තැබිය යුතු ය. ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද සහ අනන්‍යතා ප්‍රකාශ මුද්‍රා තැබීම.

**27.** (1) ගණන් කිරීමේ නිලධරයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ කිරීමට කලින්, ඔහු විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ තැනැත්තකු විසින්, එහි පැමිණ සිටින ගණන් කිරීමේ නියෝජිතයන් ඉදිරිපිට දී තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි තබා ඇති ඡන්ද පත්‍රිකා පිටතට ගෙන ඒ බඳුනෙහි තිබුණු ඡන්ද පත්‍රිකා සංඛ්‍යාව ගණන් කොට වාර්තා කර ගනු ලැබිය යුතු ය. ගණන් කිරීම.

(2) තැපැල් ඡන්දදායකයන්ගේ ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනෙහි තබා ඇති ඡන්දපත්‍රිකා වල ඡන්ද ගණන් කිරීමෙහිලා පනතේ 50 වන වගන්තියේ (3) සහ (4) වන උපවගන්තිවල සහ 51 වන හා 52 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

**28.** ගණන් කිරීම අවසන් කරනු ලැබූ විට, ගණන් කිරීමේ නිලධරයා විසින්— ගණන් කිරීම අවසන් කිරීම.

(අ) ගණන් කරන ලද ඡන්ද පත්‍රිකා ;

(ආ) ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා ;

(ඇ) පනතේ 51 වන වගන්තියේ (7) වන උපවගන්තිය ප්‍රකාර පිළියෙල කරන ලද, එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට දෙන ලද ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ලිඛිත ප්‍රකාශය ;

(ඈ) 27 (1) වන නියෝගය යටතේ වූ ගණන් කිරීම පිළිබඳ වාර්තාව ;

(ඉ) පනතේ 51 වන වගන්තියේ (6) වන උපවගන්තිය ප්‍රකාර පිළියෙල කරන ලද ප්‍රකාශය ; සහ

(ඊ) 26 වන නියෝගයෙහි සඳහන් මුද්‍රා තබන ලද පැකැට්ටු දෙක

මුද්‍රා තබන ලද පැකැට්ටුවල බහා තේරීම් භාර නිලධරයා වෙත නොපමාව භාර දිය යුතු ය.

මේ නියෝගවල උපලේඛනය

"අ" ආකෘතිය

3 වන නියෝගය

**තැපැල් ඡන්දදායකයකු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉල්ලීම**

..................................සංවර්ධන සභාවේ තේරීම් භාර නිලධරයා වෙත ය.
(සංවර්ධන සභාවේ නම යොදන්න)

...........................................වන මම, පනතේ 5 වන වගන්තිය යටතේ බල පවත්නා ඉහත සඳහන් සංවර්ධන සභා ප්‍රදේශයේ ඡන්ද හිමි නාමලේඛනයේ.................. යනුවෙන් මගේ නම දක්වෙන බව මෙයින් ප්‍රකාශ කරමි. නාමලේඛනයෙහි මගේ නම දක්වෙන්නේ පහත සඳහන් අනුක්‍රමික අංකය, ඡන්ද ප්‍රදේශය සහ ඡන්ද කොට්ඨාසය සහ මැතිවරණ කොට්ඨාසය යටතේ වේ :—

මැතිවරණ කොට්ඨාසයේ අංකය :
ඡන්ද ප්‍රදේශයේ අංකය :
ඡන්ද කොට්ඨාසයේ අංකය :
මගේ නමට අයත් අනුක්‍රමික අංකය :

*(1) (අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ/ශ්‍රී ලංකා නාවික හමුදාවේ/ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වශයෙන් ;

*(ආ) පොලිස් දෙපාර්තමේන්තුවේ/ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ/තැපැල් දෙපාර්තමේන්තුවේ/විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ/ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ/.......................... ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් ;

*(ඇ) ඡන්ද විමසීම හා සම්බන්ධිත කාර්ය සඳහා පත්කරනු ලැබූ/පත් කරනු ලැබීමට ඉඩ ඇති රජයේ සේවයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් ;

*(ඈ) ඒ ඡන්ද විමසීම හා සම්බන්ධ කාර්ය සඳහා පත් කරනු ලැබූ/පත් කරනු ලැබීමට ඉඩ ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් මගේ සේවා නියුක්තියේ විශේෂ අවස්ථාගත කරුණු හේතුවෙන් ;

*(2) ..........................සංවර්ධන සභාව සඳහා මා අපේක්ෂකයකු වීම හේතුවෙන්
(සංවර්ධන සභාවේ නම යොදන්න)

මට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී ඡන්දය දීමට මට නොහැකි/නොහැකි වීමට ඉඩ ඇති බැවින්, ඉහත සඳහන් සංවර්ධන සභාව සඳහා සභිකයන් තෝරා පත් කර ගැනීමේ දී තැපැල් ඡන්දදායකයකු වශයෙන් සළකනු ලැබීමට මම මෙයින් ඉල්ලුම් කරමි.

මගේ ඡන්ද පත්‍රිකාව සහ අනිකුත් ලේඛන එවනු ලැබිය යුතු ලිපිනය පහත දක්වේ :—

පහත දක්වෙන ප්‍රකාර සහතික කිරීමේ නිලධරයකු වශයෙන් කටයුතු කිරීමට ඉල්ලුම්කරුට හිමිකමක් නොමැති නම් ඉල්ලුම්කරුගේ සහතික කරන නිලධරයාගේ නිල නාමය සහ ලිපිනය සඳහන් කරන්න :....................

සහතික කිරීමේ නිලධරයකු වශයෙන් කටයුතු කිරීමට ඉල්ලුම්කරුට හිමිකම ඇත්නම්, ඉල්ලුම්කරුගේ නිල නාමය සහ ලිපිනය සඳහන් කරන්න :.......................

.....................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :.......................

* මා/ඉල්ලුම්කරු විසින් මේ ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන ලද කරුණු හේතුකොට ගෙන මට/ඔහුට වෙන් කරන ලද ඡන්ද පොළෙහි දී පෞද්ගලිකව ඡන්දය දීමට* මට/ඔහුට* නොහැකි/නොහැකිවීමට ඉඩ ඇති බව මම මෙයින් සහතික කරමි.

මේ ඉල්ලුම් පත්‍රයේ දක්වෙන මගේ නිල නාමය සහ ලිපිනය නිවැරදිය.
දිනය සහ නිල මුද්‍රාව :

.........................................
සහතික කරන නිලධරයාගේ*/ඉල්ලුම්කරුගේ
අත්සන සහ නිල නාමය.

* අදාළ නොවන වචන කපා හරින්න.

සටහන

1. පනතේ 10 වන වගන්තිය යටතේ නාම යෝජනා දැන්වීම පළ කරනු ලැබූ දින සිට දින දහයක් ඇතුළත, ඉල්ලුම්කරු ඡන්දහිමියකු වශයෙන් ලියාපදිංචි වී සිටින සංවර්ධන සභා ප්‍රදේශයේ තේරීම් භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

2. සෑම ඉල්ලුම් පත්‍රයක්ම නිසි පරිදි පුරවා තිබිය යුතු ය. එසේ නොවුවහොත් තේරීම් භාර නිලධරයා විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබීමට යටත් වන්නේ ය.

3. සෑම ඉල්ලුම්කරුවකුටම තේරීම් භාර නිලධරයාගේ තීරණය දන්වනු ලැබේ.

4. ඉල්ලුම් පත්‍රය අනුමත කරනු ලැබූ යම් ඉල්ලුම්කරුවකු සහතික කිරීමේ නිලධරයකු වශයෙන් කටයුතු කිරීමට හිමිකම් ලබා ඇත්නම් ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි දක්වා ඇති ඔහුගේ නමට සහ ලිපිනයට හෝ ඔහු එසේ හිමිකම් ලබා නොමැතිනම්, ඔහුගේ ඉල්ලුම් පත්‍රයෙහි නිල නාමය සහ ලිපිනය දක්වා ඇති සහතික කිරීමේ නිලධරයාගේ භාරය යටතේ හෝ ඡන්ද පත්‍රිකාව සහ අනෙකුත් ලේඛන යවනු ලැබේ.

5. " සහතික කිරීමේ නිලධරයා " යන යෙදුම—

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට,—

(i) ඒ ඉල්ලුම්කරු ඒ යුද්ධ හමුදාවේ හමුදාධිපති හෝ ඒ නාවික හමුදාවේ හමුදාධිපති හෝ ඒ ගුවන් හමුදාවේ හමුදාධිපති නම්, නැතහොත්, ඒ ඉල්ලුම්කරු, තමා සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊළඟට සිටින කාර්ය භාර නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු ඉන් අදහස් වේ ; නැතහොත්

(ii) ඒ ඉල්ලුම්කරු, මේ අනුඡේදයේ (i) වන කොටසෙහි සඳහන් තැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන ඒකකයේ හෝ ආයතනයේ ඊළඟට සිටින කාර්ය භාර නිලධරයා ඉන් අදහස් වේ ;

(ආ) රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට—

(i) ඒ ඉල්ලුම්කරු යම් කාර්යාලයක් භාරව සිටින නිලධරයා වන්නේ නම්, ඒ ඉල්ලුම්කරු ඉන් අදහස් වේ ; නැතහොත්

(ii) ඒ ඉල්ලුම්කරු, මේ අනුඡේදයේ (i) වන කොටසෙහි සඳහන් තැනැත්තකු නොවන්නේ නම්, ඉල්ලුම්කරු සේවය කරන කාර්යාලය භාර ඊළඟට සිටින නිලධරයා ඉන් අදහස් වේ ;

(ඇ) සංවර්ධන සභා ඡන්ද විමසීමක අපේක්ෂකයකු වන යම් ඉල්ලුම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඉල්ලුම්කරු ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ සංවර්ධන සභා ප්‍රදේශය සඳහා වූ තේරීම් භාර නිලධරයා ඉන් අදහස් වේ.

'ආ' ආකෘතිය

අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය

ආකෘතියේ ඉදිරිපස

6 වන නියෝගය

ඡන්ද පත්‍රිකාවේ අනුක්‍රමික අංකය :

(තේරීම් භාර නිලධරයා විසින් ඇතුළත් කිරීම සඳහා)

* (මට දුන් භාර දෙන ලද) ඉහත දක්වෙන අනුක්‍රමික අංකය දරන ඡන්ද පත්‍රිකාව සහ ඒ ඡන්ද පත්‍රිකාව ඇතුළත් ලියුම් කවරය මගේ අත්සනට සාක්ෂිකරුවකු වන පහත සඳහන් නිලධරයාගේ භාරයේ එවනු ලැබූ තැනැත්තා මා බව මම මෙයින් ප්‍රකාශ කරමි.

** (මා දුන් ඉදිරිපත් කරන) ඉහත දක්වෙන පරිදි අංක යෙදූ ඡන්ද පත්‍රිකාව සහ ඒ ඡන්ද පත්‍රිකාව ඇතුළත් ලියුම් කවරය කෙළින්ම එවනු ලැබූ තැනැත්තා මා බව මම මෙයින් ප්‍රකාශ කරමි.

.............................................
ඡන්දදායකයාගේ අත්සන.

දිනය :.....................

ඉහත නම් සඳහන් තැනැත්තාට, ඔහුගේ සහතික කිරීමේ නිලධරයා වශයෙන් සිටින මා භාරයේ මෙහි සඳහන් කරන ලද ඡන්ද පත්‍රිකාව සහ ලියුම් කවරය එවන ලදී. පැවැත්වීමට ඇති සංවර්ධන සභා ඡන්ද විමසීමේ අපේක්ෂකයකු වන*/මා භාරයේ තිබෙන ඒකකයේ*/ආයතනයේ* /කාර්යාලයේ සේවයෙහි නියුක්තව සිටින, ඉහත නම් සඳහන් තැනැත්තා මම පෞද්ගලිකව හඳුනමි.

ඡන්දදායකයා වෙත භාර දෙන ලද ඡන්ද පත්‍රිකාව ඔහු විසින්, මගේ කාර්යාලයෙහි සපයා ඇති ආවෘත ස්ථානය තුළ දී එකෙණෙහිම ලකුණු කරන ලදී. ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව ඔහු විසින් ඡන්ද පත්‍රිකා ලියුම් කවරය තුළ බහාලන ලද අතර මා සහ ඡන්දදායකයා ඉදිරිපිට දී ලියුම් කවරය මුද්‍රා තබන ලදී.

ඉහත දක්වෙන අනන්‍යතා ප්‍රකාශය ඡන්දදායකයා විසින් ඡන්දය දීමට කලින් මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

** මා පෞද්ගලිකව හඳුනන ඉහත නම් සඳහන් තැනැත්තා විසින් ඉහත සඳහන් ඡන්ද පත්‍රිකාව සහ ලියුම් කවරය මට පෙන්වූ අතර ඉහත දක්වෙන ප්‍රකාශය මා ඉදිරිපිට දී අත්සන් කරන ලදී.

..........................................................
සාක්ෂිකරුගේ අත්සන සහ නිල නාමය.

දිනය සහ නිල මුද්‍රාව :..........................

(මේ ආකෘතියේ පිටිපස ඇති උපදෙස් බලන්න)

*. අදාළ නොවන්නේ නම් කපා හරින්න.

**. ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන තම නිල නාමය හා ලිපිනය යටතේ කෙළින්ම යවනු ලැබූ ඡන්දදායකයන් සම්බන්ධයෙන් පමණක් අදාළ වන අතර අදාළ නොවන්නේ නම් කපා හරිනු ලැබිය යුතු ය. ඒ ඡන්දදායකයන් පිළිබඳ ප්‍රකාශයට සාක්ෂි දරීම පසු පිටුවේ උපදෙස්වල නියම කර ඇති පරිදි විය යුතු ය.

ආකෘතියේ පිටිපස

අ. තම සහතික කිරීමේ නිලධරයා හාරයේ ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන යවනු ලැබූ ඡන්දදායකයාට උපදෙස්.

1. තම සහතික කිරීමේ නිලධරයා හාරයේ ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන යවනු ලැබූ ඡන්දදායකයා විසින්, ප්‍රකාශය අත්සන් කිරීමට පෙර —

(i) ඒ නිලධරයා හාරයේ ඡන්දදායකයා වෙත එවන ලද අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය සහ ඡන්ද පත්‍රිකාව බහාලූ ලියුම් කවරය ;

(ii) අනන්‍යතා ප්‍රකාශයෙහි නිශ්චිත වශයෙන් දක්වා ඇති, ඡන්ද පත්‍රිකාවේ අනුක්‍රමික අංකය ඔහු වෙත භාර දෙන ලද ඡන්ද පත්‍රිකාවේ දක්වෙන අංකයම බව

දැක බලා ගත යුතු ය.

ඉන්පසු ඡන්දදායකයා විසින්, තම සාක්ෂිකරු වශයෙන් ක්‍රියා කළ යුතු යම් නිලධරයකු ඉදිරිපිට දී ප්‍රකාශය අත්සන් කළ යුතු ය.

2. ඡන්දදායකයාට එක ඡන්දයක් පමණක් ඇත්තේ ය.

3. ඡන්දදායකයා තම ඡන්දය දෙන පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නම සහ ලකුණ ඉදිරියෙන්, ඡන්ද පත්‍රිකාවේ දකුණු පැත්තේ තත් කාර්ය සඳහා සළසා ඇති ඉඩ ප්‍රමාණයෙහි කතිර ලකුණක් (මෙසේ 'x') යෙදීමෙන්, ඡන්දය දිය යුතු ය.

4. ඡන්දදායකයා,තමා ඡන්දය දුන්නේ කවර ආකාරයට ද යන වග කිසිම තැනැත්තකුට දැකීමට ඉඩ නොතැබිය යුතු ය.

5. ඡන්දදායකයා විසින්, ඡන්දය දුන් වහාම ඡන්ද පත්‍රිකාව නවා "ඡන්ද පත්‍රිකා ලියුම් කවරය" යන වචන මතු පිටින් මුද්‍රණය කරනු ලැබ, සපයා ඇති කුඩා ලියුම් කවරය තම සාක්ෂිකරුගෙන් ලබාගෙන ඒ තුළ, ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව, ඒ ඡන්ද පත්‍රිකාවේ ඉදිරිපස නොපෙන්වමින් බහා ඒ ලියුම් කවරය නොගැලවෙන සේ ඇළවිය යුතු ය. ඉන් පසුව ලියුම් කවරය ඡන්දදායකයා සහ ඔහුගේ සාක්ෂිකරු ඉදිරිපිට දී මුද්‍රා තබනු ලැබිය යුතු ය.

ඉන්පසුව, ඡන්දදායකයා විසින්, සම්පූර්ණ කරන ලද තම අනන්‍යතා ප්‍රකාශය සමඟ මුද්‍රා තබන ලද ඡන්ද පත්‍රිකා කවරය, තේරීම් භාර නිලධරයා නමට අමතනු ලැබ බහා එවා ඇති අනෙක් ලොකු ලියුම් කවරය තුළ දමා ලියුම් කවරය නොගැලවෙන සේ අලවා එය අප්‍රමාදව යැවීම සඳහා තම සාක්ෂිකරුට භාර දිය යුතු ය.

6. ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නියම කරන ලද දිනයේ දී ඡන්ද විමසීම අවසන් කරනු ලැබීමට පෙර, තේරීම් භාර නිලධරයා වෙත ලැබෙන සේ තැපැල් ඡන්ද පත්‍රිකාවක් ආපසු යවනු ලැබුවහොත්ද, යථා පරිදි අත්සන් කොට සාක්ෂි දරනු ලැබූ අනන්‍යතා ප්‍රකාශය ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව සමඟ තිබුණහොත්ද මිස ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව යථා පරිදි ආපසු යවනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

ආ. ඡන්ද පත්‍රිකාව සහ වෙනත් ලේඛන කෙලින්ම ස්වකීය නිල නාමය සහ ලිපිනය යටතේ යවනු ලැබුවේ යම් ඡන්දදායකයකු වෙතද ඒ ඡන්දදායකයාට උපදෙස්.

1. ඡන්දදායකයා විසින්, තම අනන්‍යතා ප්‍රකාශය අත්සන් කිරීමට පෙර ඒ ප්‍රකාශය තමා අත්සන් කළ යුත්තේ යම් තැනැත්තකු ඉදිරිපිට දී ද ඒ තැනැත්තාට—

(අ) ඒ ප්‍රකාශයේ නිශ්චිත වශයෙන් දක්වා ඇති අංකයම දරන ඡන්ද පත්‍රිකාව ; සහ

(ආ) ඡන්දදායකයා වෙත අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතිය හා ඡන්ද පත්‍රිකාව බහා එවන ලද ලියුම් කවරය

පෙන්වනු ලැබිය යුතු ය.

2. (අ) ඡන්දදායකයා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වන්නේ නම්, ඒ යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදවේ අධිකාරලත් නිලධරයකු විය යුතු වූ ද ;

(ආ) ඡන්දදායකයා රජයේ සේවයේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයකු හෝ සේවකයකු වන්නේ නම්, ඒ සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු විය යුතු වූ, හෝ ඡන්දදායකයාට ජ්‍යෙෂ්ඨ නිලධරයකු නොමැති නම්, ඒ සේවයේ වෙනත් යම් නිලධරයකු විය යුතු වූ ද

සාක්ෂිකරුවකු ඉදිරිපිට දී ඡන්දදායකයා විසින් අනන්‍යතා ප්‍රකාශය අත්සන් කරනු ලැබිය යුතු ය.

3. ඡන්දදායකයාට එක් ඡන්දයක් පමණක් ඇත්තේ ය.

4. ඡන්දදායකයා තමා ඡන්දය දෙන පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නම සහ ලකුණ ඉදිරියෙන්, ඡන්ද පත්‍රිකාවේ දකුණු පැත්තේ තත් කාර්යය සඳහා සලසා ඇති ඉඩ ප්‍රමාණයෙහි කතිර ලකුණක් (මෙසේ ' × ' ) යෙදීමෙන් ඡන්දය දිය යුතු ය.

5. ඡන්දදායකයා තමා ඡන්දය දුන්නේ කවර ආකාරයකට ද යන වග කිසිම තැනැත්තකුට දැකීමට ඉඩ නොතැබිය යුතු ය.

6. ඡන්දදායකයා විසින් ඡන්දය දුන් වහාම '' ඡන්ද පත්‍රිකා ලියුම් කවරය '' යන වචන මතු පිටින් මුද්‍රණය කරනු ලැබ බහා එවන ලද කුඩා ලියුම් කවරය තුළ, ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකාව දමා ලියුම් කවරය නොගැලවෙන සේ ඇලවිය යුතු ය. ඉන්පසුව ඡන්ද දායකයා විසින් අනන්‍යතා ප්‍රකාශය සමඟ ඡන්ද පත්‍රිකා ලියුම් කවරය, තේරීම් භාර නිලධරයා නමට අමතනු ලැබ බහා එවා ඇති අනෙක් ලොකු ලියුම් කවරය තුළ දමා එය අප්‍රමාදව තැපැලෙන් යැවිය යුතු ය. ඡන්දදායකයා විසින් ඡන්ද පත්‍රිකාව වහාම ආපසු යවනු නොලැබුවහොත් එය ගණන් කරනු ලැබීමට ප්‍රමාද වැඩි විය හැකි ය.

7. ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නියම කරන ලද දිනයේ දී ඡන්ද විමසීම අවසන් කරනු ලැබීමට පෙර තේරීම් භාර නිලධරයා වෙත ලැබෙන සේ තැපැල් ඡන්ද පත්‍රිකාවක් ආපසු යවනු ලැබුවහොත් දයරා පරිදි අත්සන් කොට සාක්ෂි දරණු ලැබූ අනන්‍යතා ප්‍රකාශය ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව සමඟ තිබුණහොත් ද මිස ඒ තැපැල් ඡන්ද පත්‍රිකාව යථා පරිදි ආපසු යවනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

'' ඇ '' ආකෘතිය

9 (1) වන නියෝගය.

රහස්‍යතා ප්‍රකාශයේ ආකෘතිය

මට කියවා දෙන ලද පනතේ දෙවන උපලේඛනයේ ඇතුළත් නියෝගවල 9 වන නියෝගයේ (1) වන ඡේදය මගින් තහනම් කරනු ලැබ ඇති කිසිවක් මේ කටයුතුවල දී මා නොකරන බවට මම ගම්භීරතා පූර්වකව පොරොන්දු වී ප්‍රකාශ කරමි.

..................................................
ප්‍රකාශකගේ අත්සන.

..................................................
ප්‍රකාශය කරන ලද්දේ යම් තැනැත්තකු
ඉදිරිපිට දී ද ඒ තැනැත්තාගේ අත්සන.

දිනය : ..................................................

**සැලකිය යුතුය. :** —ප්‍රකාශය කරනු ලබන්නේ යම් තැනැත්තකු ඉදිරිපිට දී ද ඒ තැනැත්තා විසින් ප්‍රකාශක වෙත මෙහි සඳහන් කර ඇති ඡේදය කියවා දෙනු ලැබිය යුතු ය.

## තුන්වන උපලේඛනය

28 වන වගන්තිය

### ඡන්දය දීමෙහිලා ඡන්දදායකයකුට මග පෙන්වීම සඳහා සෑම ඡන්ද පොළකම පිටතින් සහ සෑම ඡන්ද පොළකම ඇති සෑම ආවෘත ස්ථානයකම ප්‍රදර්ශනය කළ යුතු උපදෙස්වල ආකෘතිය

සෑම ඡන්දදායකයකුට ම එක් ඡන්දයක් තිබිය යුතුය. ඒ ඡන්දය පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට හෝ දෙනු ලැබිය හැකි ය.

ඡන්දදායකයා, ආවෘත ස්ථාන අතුරින් එක් ආවෘත ස්ථානයකට ගොස්, තමා ඡන්දය දෙන පිළිගත් දේශපාලන පක්ෂයේ නම සහ ලකුණ ඉදිරියෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ අංකය සහ ලකුණ ඉදිරියෙන් හෝ ඡන්ද පත්‍රිකාවේ දකුණු පැත්තේ කතිර ලකුණක් (මෙසේ ×) යෙදිය යුතු ය.

ඉක්බිතිව ඡන්ද දායකයා විසින් ඡන්ද පත්‍රිකා ව පිටපැත්තේ ඇති නිල ලකුණ පෙනෙන සේ ඡන්ද පත්‍රිකාව නවා, ඒ ඡන්ද පත්‍රිකාවේ ඉදිරිපස කිසිවකුට නොපෙනෙන සේ පිට පැත්තේ ඇති නිල ලකුණ ඡන්ද ස්ථානාධිපතිවරයාට පෙන්වා ඒ ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටිය තුළ බහා අප්‍රමාදව ඡන්ද පොළෙන් ඉවත් ව යා යුතු ය.

ඡන්දදායකයා විසින් අනවධානයෙන් ඡන්ද පත්‍රිකාවක් නරක් කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින් එය ඡන්ද ස්ථානාධිපතිවරයා වෙත ආපසු දෙනු ලැබිය හැකි අතර ඒ අනවධානය පිළිබඳව ඡන්ද ස්ථානාධිපතිවරයා සෑහීමට පත්වන්නේ නම්, ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් වෙනත් ඡන්ද පත්‍රිකාවක් ඒ ඡන්දදායකයාට දෙනු ලැබිය යුතු ය.

ඡන්දදායකයා : —

(i) පිළිගත් දේශපාලන පක්ෂ එකකට වැඩි ගණනකට ඡන්දය දුනහොත් ; හෝ

(ii) ස්වාධීන කණ්ඩායම් එකකට වැඩි ගණනකට ඡන්දය දුනහොත් ; හෝ

(iii) පිළිගත් දේශපාලන පක්ෂ එකක හෝ වැඩි ගණනක සහ ස්වාධීන කණ්ඩායම් එකක හෝ වැඩි ගණනක සංකලනයකට ඡන්දය දුනහොත්, හෝ

(iv) තමා පසුව හඳුනා ගනු ලැබීමට හේතු විය හැකි යම් ලකුණක් පත්‍රිකාව මත තැබුවහොත්

ඔහුගේ ඡන්ද පත්‍රිකාව බල රහිත වන අතර, එය ගණන් කරනු නොලැබේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි
(විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත
ඇම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂ
කොට ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් ලග නී
[illegible] කොන්දේසිය මත පමණද දායක මුදල් භාරගනු ලැබේ.